ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2014 ක් වූ නොවැම්බර් 16 ඉරිදා 149 වෙළුම 25 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/35/NEWS/2014

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

## ගරු හැරී මිලර් පියතුමාට 2014 සාම ත්‍යාගය

කිංස්ලි කරුණාරත්න විසිනි



ජාතික සාම මණ්ඩලය විසින් ප්‍රදානය කරන 2014 සාම ත්‍යාගය මෙවර බෙන්ජමින් හෙන්රි මිලර් පියතුමා වෙත පසුගිය 8 වැනි දින මඩකලපුවේදී පිරි නැමිණ. ඒ විශේෂයෙන්ම පසුගිය යුද්ධ සමයේ දී යුද්ධයට මැදි වූ ජනතාව සම්බන්ධයෙන් කරන ලද දිගු කාලීන සේවාව අගයමිනි.

වර්ෂ 1948 සිටම මඩකලපුවේ සා. මයිකල් විද්‍යාලයේ සේවය කළ ඇමරිකාන ජාතික ජේසු නිකායික පියතුමා භෞතික විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව, ඉතිහාසය උගැන්වූ අතර විද්‍යාලයීය පාපන්දු ක්‍රීඩා පුහුණු කරන්නා ද විය.

15 පිටුවට

## ශුභාශිංසන!



කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් කාදිනල්වරයට එසැවීමේ සංවත්සරය නොවැම්බර් 20 වැනිදාට යෙදේ. එතුමන්ට සමිඳු ආසිරි බහුලව ලැබෙන්නට ප්‍රදීපය ශුභාශිංසන ගෙන එයි.

# "සුදුතුම් පිය දයාවේ සේවාවන්" සඳහා පාප් වහන්සේට විශේෂ තිළිණයක්!

## අගරදගුරු පදවිය සමඟ සියලු පදවි අත්වැල් බැඳගනිති.

## ආගමන සමයේ පළමු ඉරුදින මේ සුවිශේෂී කටයුත්තට වෙන්කරයි.

ශිරාන් මෛත්‍රී විසිනි

**2015 ජනවාරි 13 වැනිදා ශ්‍රී ලංකාවට මුල්වරට සැපත්වන අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන්ගේ ශ්‍රී ලංකා චාරිකාව සිහිපත් කිරීම සඳහා "සසුන් පිය දයා සේවා අරමුදලට" සාමුහික තිළිණයක් පිරිනැමීමට ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය තීරණය කර තිබේ.**

2014 නොවැම්බර් මස 30 වැනි ඉරිදාට යෙදෙන ආගමන සමයේ පළමු ඉරුදින දෙව්මැඳුරු වලදී මේ සඳහා විශේෂ සම්මාදමක් එකතු කිරීමට තීරණය කැර තිබේ. කොළඹ අගරදගුරු වසමේ මීසම් වලට මේ සඳහා විශේෂ කවර නිකුත් කිරීමට සෙත් සරණ කරිටාස් ආයතනය කටයුතු යොදා ඇත. මීසම් මට්ටමින් එකතු වන පරිත්‍යාග ඒ ඒ පදවි භාණ්ඩාගාරික පියතුමන් වෙත යොමු කර පසුව පොදු අරමුදලට එකතු කර ගැනේ.

තවද විශේෂ පරිත්‍යාගයන් සිදු කිරීමට අපේක්ෂා කරන සැදැහැවතුන් "සෙත් සරණ - කරිටාස් කොළඹ" නමින් කොමර්ෂල් බැංකුව - බොරැල්ල ශාඛාව ගිණුම් අංක 1190030954 හෝ හැටන් නැෂනල් බැංකුව - මරදාන ශාඛාව ගිණුම් අංක 108010103565 බැර කරන මෙන් සෙත් සරණ අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමා ඉල්ලා සිටී.

# "නිසංසලේ දෝතක්"

## වැඩිහිටියන් වෙනුවෙන් ශ්‍රී ලංකා බයිබල් සංගමයෙන් සත්කාරක වැඩසටහනක්

ඔක්තෝබර් 01 දිනට යෙදී තිබුණ ජාත්‍යන්තර වැඩිහිටි දිනය නිමිතිකොටගෙන ශ්‍රී ලංකා බයිබල් සංගමය 11 වන වරටත් වැඩිහිටියන් ගණනාවක් සමඟ "නිසංසලේ දෝතක්" නමින් වූ අති සාර්ථක වැඩසටහනක් පවත්වන ලදි.

මෙතෙක් බොහෝ වැඩසටහන් කොළඹ මූලික කොටගෙන පැවැත්වුවද මෙම වැඩසටහන ජා-ඇල ප්‍රදේශය මුල් කොට දඬුගම ශු. මාක් තුමාගේ දේවස්ථාන භූමියේදී පවත්වන්නට යෙදිනි.

ජා-ඇල කලාපීය නාහිමි අතිගරු ශාන්ති කුමාර් වැලිවිට පියතුමන් ආරම්භක යැදුම් මෙහෙයේ මූලිකත්වය ගත් අතර මෙම උළෙලෙහි ප්‍රධාන ආරාධිතයා වූයේ ගැලවීමේ හමුදාවේ ලුතිනන් කර්නල් නිහාල් හෙට්ටිආරච්චි, ප්‍රධාන ලේකම් තුමාය. සමාජ සේවා අමාත්‍ය ගරු ෆීලික්ස් පෙරේරා, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් නිමාලිද සිල්වා සමඟ ප්‍රදේශයේ කතෝලික පියතුමන් ඇතුළු පිළිගත් සභාවල දේවගැතිවරු බොහෝ දෙනෙක් සහභාගි වූහ.

15 පිටුවට

# දේව අම්මාට වඩාත් ළං වූ අපි එතුමිය සමීපයේ සැමදා වෙසෙමු

## මරිය වසර නිමාවට පත් කරමින් සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණෝ මීගමුවේ දී ප්‍රකාශ කරති

මීගමුවේ රේමන් අපොන්සු විසිනි

**මේ වසර තුළ කොළඹ අගරදගුරු පදවියේ අපට දේව අම්මාට වැඩියෙන් ළං වෙන්න, වැඩියෙන් දැන ගන්න අවස්ථාව ලැබුණා. අපි දේව අම්මාට තිබෙන ආදරය තව තවත් වැඩි කර ගනිමු. දේව අම්මාව අපේ ජීවිතයේ කොටසක් කර ගනිමු යැයි කොළඹ සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණෝ පැවසූහ.**

උන්වහන්සේ එසේ පැවසුවේ මීගමුව කලාපීය දේවමාතා රැළිය මීගමුව සා. පීතර දෙව්මැඳුරු භූමියේදී පැවැති අවස්ථාවේදීය. තව දුරටත් සැදැහැවතුන් ඇමතූ සහයක හිමිපාණෝ "අපට තව දවස් 50 කින් 60 කින් මුළු ලංකාවටම පළමු වන සාන්තුවරයා වන භාග්‍යවන්ත ජුසේවාස් පියතුමා සාන්තුවරයට එසැවීමේ මොහොත අත්විඳින්නට පුළුවන්. එතුමා දේව අම්මාට විශේෂ ආදරයක් දැක්වූ අයෙක්. අද අපි දේව අම්මාට පොරොන්දු වෙමු අපගේ ක්‍රිස්තියානි ජීවිතය තුළින් ඇයගේ අත අල්ලාගෙන දෙවියන් වහන්සේට භක්ත්‍යාදරය දක්වනවා කියලා. අනික් අයට යහපතක් ඇති කරන ආදර්ශවත් ජීවිතයක් ගත කරනවා කියලා."

මීගමුව කලාපීය දේවමාතා රැළිය කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමන්ගේ සංවිධානයෙන් හා සියලුම පූජක පැවිදි සොයුරු සොයුරියන්ගේ සහභාගිත්වයෙන් සියළු කටයුතු ගිහි ජනතාව හා සමඟ සංවිධානය වී තිබිණි.







මීගමුවේ පැවති මරිය වසර නිමාවට පත් කළ කලාපීය දේව මාතා රැළියට සම්බන්ධ වූ සැදැහැවතුන්. දෙව්මවුන්ට විශේෂ ගීතිකාවකින් ගෞරවය පුද කරන්නට සැදැහැවතුන් සමඟ එක්වූ නලීන් පෙරේරා, මුලසුන හෙබවූ කොළඹ සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණෝද මෙහි වෙති.

Please Like pope visit sri lanka official facebook page.

www.facebook.com/popevisitsrilanka2015 ■ www.popefrancissrilanka.com



## පදවියෙන් පදවියට

# 17 වන සියවසට නෑකම් කියන සත්කෝරළයේ දේවමාතා ප්‍රතිමාව තැන්පත් කරයි

**ක්‍රි.ව. 1616 දී නිර්මාණය කරන ලද ස්වර්ගීය රැජින ලෙස ඔටුනු පැළැන්දු දේවමාතා ප්‍රතිමාවක් 2013 වර්ෂයේදී පැල්ලන්දෙනිය දේවස්ථානයෙන් හමුවිය. එම ප්‍රතිමාවේ පිටුපස 1616 වර්ෂය සටහන් වී ඇති බැවින් එහි ඉතිහාසය සොයා බලද්දී එය පැල්ලන්දෙනියට කෙසේ ලැබුනාදැයි සඳහන් නොවුවත් එය පෘතුගීසි සමයේදී ලංකාවට ගෙන්වා මැටියගනේ දේවස්ථානයේ ස්ථාපිත කර තිබූ බව සඳහන් වේ. මහනුවර කඳු පාමුල (දැන් වෑඋඩ) දක්වා ප්‍රදේශය මැටියගනේ මීසමට අයත්ව තිබූ බවත්, කේරලයේ කොචින් සිට ලියන ලද 1618 දෙසැම්බර් 15 වන දින සහිත ලිපියක මැටියගනෙන් ඇරඹුන කැරැල්ලේදී පියතුමන්ලා තිදෙනෙක් ඝාතනයට ලක්වූ බව සඳහන්ව ඇත. එම දේවස්ථානයද ගිනි තබා විනාශ කර ඇති බව සඳහන් වේ. වර්තමානයේ එම දේවස්ථානය තිබුනු තැනක්වත් කිසිවකු දන්නේ නැත. වත්මන් මැටියගනේ දේවස්ථානය පසුකාලීනව ඉදිවූවක් බව සඳහන් වේ. ස්වර්ගාරෝපිත දේවමාතාවන්ගේ මෙම ප්‍රතිමාව පැල්ලන්දේනිය ශු. අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානයට කෙසේ ලැබුනේ දැයි දන්නේ නැති නමුත් ලන්දේසි පීඩන සමයේ මැටියගනේ ප්‍රාණ පරිත්‍යාගිවරුන්ගේ ලෙයින් රැකදුන් දේව විශ්වාසයේ සලකුණක් ලෙස මෙම ප්‍රතිමා වහන්සේව දැක්විය හැකිය.**



ඇතුගල්පුරයෙන් හමුවූ මේ ඓතිහාසික ප්‍රතිමා වහන්සේ, කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන්ගේ පූර්ණ අනුමතිය ඇතිව පැල්ලන්දෙනිය සා. අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානයේ විශේෂ මණ්ඩපයක් සාදා 'සත්කෝරළයේ දේව මාතාවන්' ලෙස ස්ථාපිත කිරීම පසුගියදා සිදුකරන ලදි. පැල්ලන්දෙනිය මීසම් සේවක ගරු චන්දන හපුආරච්චි පියතුමාගේ මැදිහත්කමින් ගරු ලීනස් කුරුකුලආරච්චි පියතුමා මේ තොරතුරු සොයා ගත්තේ පසුගිය වසරේ ජාතික ජපමාල රැලිය කුරුණෑගල මාලිගාපිටියේදී කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන් සහ කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන අවස්ථාවේදී එහි රැස්ව සිටි සැදැහැවත් ජනතාව ආසිරිගැන්වූයේ සත්කෝරලයේ දේවමාතා ප්‍රතිමාවෙනි.

**ගීතානි රණසිංහ**

## සිරිලකට වැඩි සුදුතුම් පියතුමෝ

මෙරටට වැඩම කළ අතිඋතුම් සවැනි පාවුළු හා දෙවන ජුවාම් පාවුළු හිමිපාණන් මෙරටදී සිදුකළ මෙහෙයන් හා චාරිකාවන් අලළා විකාශනය වූ ගුවන් විදුලි වැඩසටහන් ආශ්‍රිතව නව වැඩසටහන් මාලාවක් සතිපතා විකාශනය කිරීමට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය කටයුතු යොදා ඇත. එහි ආරම්භක වැඩසටහන නොවැම්බර් 23 ඉරිදා පෙ.ව. 11.15 සිට 11.30 දක්වා විකාශනය වන අතර ඉන්පසු සතිපතා මෙම වැඩසටහනට සවන්දීමට ශ්‍රාවකයනට අවස්ථාව ලැබේ. නිෂ්පාදනය ජූඩ් අයිවන්.



හලාවත පදවියේ දුෂ්කර මීසමක් වූ කරුවලගස්වැව මීසමේ එගොඩපිටිය ග්‍රාමයේ අභිනවයෙන් ඉදිකළ ශු. ජපමාල මාතා දේවස්ථානය ආසිරි ගැන්වීම සහ 25 රජත ජයන්ති මංගල්‍යය පසුගියදා හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදුවිය. 1988 වසරේදි ගරු ප්‍රැන්සිස් ලාවුස් පියතුමන්ගේ මූලිකත්වයෙන් එගොඩපිටිය ග්‍රාමයේ පදිංචි කතෝලික පවුල් 4 ක දායකත්වයෙන් ඇරඹි මෙම දේවස්ථානය වත්මන් මීසම් සේවක ගරු සමන් කිත්සිරි පෙරේරා පියතුමන්ගේ දැඩි කැපවීම සහ උත්සාහය මත වෙන්නප්පුව මීසමේ සැදැහැවතුන්ගේ මූල්‍ය හා ශ්‍රම දායකත්වය මත තනා නිමකර ඇත.

**සටහන - ජේ. කේ. මයිකල් පෙරේරා; සේයා - ප්‍රියන්ත පීටර්ස්**

## වැඩිහිටි අධ්‍යාත්මික කඳවුරක්!

තලවිල සාන්ත ආනා සහ පාලකුඩාව සාන්ත පේදුරු පාවුළු වැඩිහිටි සංවිධානවල සහභාගිත්වයෙන් දෙදිනක ශුානකාන්තියක් තලවිල සාන්ත ආනා පුදබිමේ දී නේවාසිකව පැවැත් විය.

එම අධ්‍යාත්මික වැඩමුළුව පෝෂණය කරන ලද්දේ හලාවත පදවි ගිහිදූත සේවා අධ්‍යක්ෂ ගරු සාර්ටෝ නෝනිස් සහ පුත්තලම ප්‍රැන්සිස්කන් ආරාමයේ දේශනාවාදී ගරු ජෝශප් චමින්ද පියතුමන් විසිනි.

තලවිල සාන්ත ආනා සිද්ධස්ථාන පාලක ගරු නිහාල් පයස් පියතුමා නේවාසික පහසුකම් ඇතුලු විවිධ කටයුතු සඳහා සහාය දුන් අතර හලාවත පදවි භාණ්ඩාගාරික අතිගරු ලූක් නෙල්සන් පියතුමා ද ආධාර ලබා දුන්නේය. සාන්ත ආනා වැඩිහිටි සංවිධානයේ අධ්‍යාත්මික, අධ්‍යාපන හා සංස්කෘතික නිලධාරි ඩබ්. ටී. ඇග්නස් කුරේරා මහත්මියගේ මූලිකත්වයෙන් වැඩමුළුව සංවිධානය කෙරිණ.

**ප්‍රැන්සිස් ෂෙල්ටන් ප්‍රනාන්දු**

## අගරදගුරු පදවි පූජක ධර්ම විවේකය - 5

කොළඹ අගරදගුරු වසමේ පූජක ධර්ම විවේකය 05
නොවැම්බර් 17 සඳුදා සිට නොවැම්බර් 22 සෙනසුරාදා දක්වා
මහනුවර ලේවැල්ල ධර්ම විවේකාගාරයේදී පැවැත්වේ

**දේශක - ගරු එස්. ජයමාන්න (දි.ස.නි) පියතුමා**

**සහභාගි වන පියතුමන්ලා** - ගරු ක්‍රිස් අබේරත්න, සජිත් අරුණ, ටෙරන්ස් බෝදියාබදුගේ, එඩ්වඩ් මැල්කම් කන්දප්පා, නිරෝෂ් සමීර කුරේ, මනෝරන්ජන් ද සිල්වා, ගැමුණු ජයවර්ධන ඩයස්, නොයෙල් ඩයස්, කැමිලස් ප්‍රනාන්දු, බර්ට්‍රම් ප්‍රනාන්දු, මලින් සමුද්‍රික ප්‍රනාන්දු, රොෂාන් ජානක ප්‍රනාන්දු, රුවන්ත කුමාර ප්‍රනාන්දු, ශ්‍රීලාල් පොන්සේකා, අමිල් ගෝමස්, ටෙරන්ස් ප්‍රසංග විරාජ්, මලින්ත චතුරංග, ප්‍රදීප් මානවඩු, කැනීෂියස් නෝරිස්, සුනිල් කුමාර පීරිස්, රවීන් සඳසිරි පෙරේරා, ගයාන් ප්‍රසන්ත පෙරේරා, ප්‍රසාද් ඉන්දික පෙරේරා, ප්‍රසන්න ක්‍රිස්ටෝපර් පෙරේරා, ප්‍රසන්න සංජීව පෙරේරා, ශ්‍රිනාත් මනෝජ් පෙරේරා, සුදම් පෙරේරා, ටිරෝන් පෙරේරා, ශ්‍රියන්ත රත්නසේකර, බර්නාඩ් රෙහාට්, අජිත් ටිරෝන්, සුදත් සිල්වා, අනුර සිල්වෙස්ටර්, සරත් තිරිමාන්න, එඩ්මන්ඩ් තිලකරත්න, ලෙස්ටර් විජේසූරිය, ආනන්ද විතාන යන පියවරු සහභාගි වෙති.

## අගරදගුරු පදවි පූජක ධර්ම විවේකය - 6

කොළඹ අගරදගුරු වසමේ පූජක ධර්ම විවේකය 06
නොවැම්බර් 23 ඉරිදා සිට නොවැම්බර් 28 සිකුරාදා දක්වා
තේවත්ත ධර්ම විවේකාගාරයේදී පැවැත්වේ

**දේශක - ගරු එස්. ජයමාන්න (දි.ස.නි) පියතුම**

**සහභාගි වන පියතුමන්ලා** - ගරු සරත් අබේසිරිවර්ධන, ජූඩ් අල්ගම, ඇන්ටන් රන්ජිත් කනිටු, කිංස්ලි අප්පුහාමි, සූජීව අතුකෝරල, ඩැරල් කූඤ්ඤ, ශාම් දසනායක, ඇන්තනි සිරිල්, එච්. ඩී. ඇන්තනි, බැසිල් නික්ලස්, ජූඩ් නික්ලස්, එඩ්වින් ප්‍රනාන්දු, මාකස් ප්‍රදිනැන්දිස්, බර්ට්‍රම් ප්‍රනාන්දු, ග්‍රෙගරි ජයන්ත, ඉන්ද්‍රා රත්නසිරි, ජූඩ් ශාමන්, ජූඩ් රාජ් ප්‍රනාන්දු, ලින්ටන් ජෝශප්, ඇන්තනි ජයලත්, රන්ජන් ප්‍රියදර්ශන, රංජිත් ටෙරි, රොෂාන් ප්‍රනාන්දු, ශ්‍රියානන්ද ප්‍රනාන්දු, තුසිත් ප්‍රදීප්, පැට්‍රික් රොෂාන් ප්‍රනාන්දු, ශාන්ත සාගර හෙට්ටිආරච්චි, ඉන්දික ජෝශප් ක්‍රිස්මාන් ජූඩ්, ට්‍රෙවෝ මාටින්, මනෝකුමාරන් නාගරත්නම්, ක්ලෝඩ් නෝනිස්, ගියොම් නෝනිස්, ඩිල්රන් පීරිස්, ජූඩ් පීරිස්, හේමන්ත උදය කුමාර, ජූඩ් ලක්ෂාන්ත පෙරේරා, කෙනඩි පෙරේරා, ලලිත් පීලික්ස් පෙරේරා, නොයෙල් සම්පත් පෙරේරා, සෑම් ක්වින්ටස් පෙරේරා, සිල්වෙස්ටර් පෙරේරා, තරංග සම්පත් පෙරේරා, අයිවන් පීටර්ස්, නිශාන්ත රොඩ්රිගු, මැක්ෂිමස් රොඩ්රිගු පුල්ලේ, ක්ලෙමන්ට් රොසයිරෝ, ඇතනේෂියස් සමරසිංහ, හෙන්රි සිල්වා, ප්‍රියන්ත සිල්වා, රන්ජන් සිල්වා, කිරුල් ජයනාත් සිල්වා, වික්ටර් සිල්වා, ලලිත් තිසේරා, ටෝනි පින්තු, ක්ලෝඩ් වනසිංහ, දයා වැලිකඩආරච්චි යන පියවරු සහභාගි වෙති.

ගරු ලලිත් එක්ස්පෙඩිටස් පියතුමා
ධර්ම විවේක - සම්බන්ධිකාරක

## පූජක නව පත්වීම්

**කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් පහත දැක්වෙන පූජක නව පත්වීම් සිදුකර ඇත.**

ගරු දර්ශන ජයමාන්න පියතුමා - මීගමුව සා. නික්ලස් විදුහල්පති, ගරු වින්ස්ටන් ඈෂ්ලි පියතුමා - මීගමුව ලොයලා විදුහල් ආචාර්ය මණ්ඩලය, ගරු චමින්ද වනිගසේන පියතුමා - කොළඹ 10, සා. ජෝශප් ආචාර්ය මණ්ඩලය

**ගරු ජූඩ් සමන්ත ප්‍රනාන්දු පියතුමා**
**පරිපාලන ලේකම්**

# ඇතුගල්පුර පදවි දේව කැඳවීම් රැළිය

"ජේසු සමිඳුන්ගේ ආදරය දසත දල්වන පහන්වෙමු අපි" යන්න තේමා කර ගනිමින් කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ සහභාගිත්වයෙන් කුලියාපිටිය 'සත්පහන' ශාලාවේදී පදවි දේව කැඳවීම් රැළියක් පැවැත්විණ.

ඒකල සහ කණ්ඩායම් ගායනා, කථික, රචනා, චිත්‍ර තරගවලින් ජයග්‍රහණය කළ දරු දැරියන්ටත්, පදවි කැඳවීම් තරග සඳහා සහභාගිවූ දරු දැරියන්ටත් තිළිණ සහ සහතිකපත් ප්‍රදානය රදගුරු හිමිපාණන්, ගරු ටෝනි මාටින් පියතුමා සහ හිටපු පදවි දේව කැඳවීම් අධ්‍යක්ෂ හා පදවි අනුනායක අතිගරු ඔස්ටින් මාකස් ප්‍රනාන්දු පියතුමන් අතින් සිදුකැරිණි. කුරුණෑගල පදවියේ දේව කැඳවීම් විකාශනය පිළිබඳ වීඩියෝ දර්ශනයක් පදවි ජනසෙත අධ්‍යක්ෂ ගරු සාගර ප්‍රිශාන්ත පියතුමා ඉදිරිපත් කළ අතර දේව කැඳවීම් පිළිබඳව ජාතික මට්ටමින් නිෂ්පාදනය කරන ලද වීඩියෝ දර්ශනයක්ද ඉදිරිපත් කෙරිණි. දේව කැඳවීම් භාර පදවි අධ්‍යක්ෂ ගරු හර්මන් සරත්චන්ද්‍ර පියතුමා ඇතුළු දේව කැඳවීම් කමිටුව මෙය සංවිධානය කැර තිබුණි.

**රීටා සේනානායක**



කළුතර අරුණෝදය ළමා සංවර්ධන පදනම මගින් සංවිධානය කරන ලද ලෝක ළමා දින සමරු උලෙළ උතුරු පයාගල ධීවර ප්‍රජා ශාලාවේදී පැවැත්විණ.
එහි ප්‍රධාන ආරාධිතයා වශයෙන් එක්සත් ජාතික පක්ෂ නායකත්ව මණ්ඩලය සභාපති කරා ජයසූරිය මහතා සහභාගිවු අතර එතුමා අතින් ෂෙහානි කුරේ දැරිය තිළිණ ලැබූ අයුරු.

**සුනිල් එස්. තන්ත්‍රිආරච්චි**



කමරාගොඩ මීසම් සේවක, ගම්පහ මරිය හමුදා අදියුරු ගරු ප්‍රැන්සිස් ලොයිඩ් නි.ම.නි පියතුමාගේ මෙහෙයවීමෙන් ආරම්භ කළ වටිනපහ මරිය හමුදා කණ්ඩායමයි මේ. වඩුමුල්ල දේවස්ථානයේදී නව මරිය හමුදා ප්‍රසීඩියමක් පිහිටුවීමට පියතුමා කටයුතු සංවිධානය කර ඇත. මෙම අවස්ථාවන්හිදී දැනුම්වත් කිරීමේ කටයුතු මරිය හමුදා කොමිටිසියම් සභාවේ ලේකම් බෙනී ජයමාන්න හා උපසභාපති ස්ටැන්ලි ජෝශප් සහෝදරයන් විසින් සිදුකරන ලදි. මෙහි දැක්වෙන්නේ වටිනපහ මරිය හමුදා සංඝයයි.

**නදීෂා නිලන්ති**



කඳාන සා. සෙබස්තියන් සිද්ධස්ථානයට අයත් සා. සෙබස්තියන් මාවත කොට්ඨාස අංක 07 ලූර්දු මාතා කොට්ඨාසයෙ ජනතාව නොකඩවා නිවසින් නිවසට යමින් ජපමාලය උච්චාරණය කරමින් මරිය වසර ආරම්භ කළ අතර මරිය වසර අවසාන කිරීම සඳහා සිද්ධස්ථාන පරිපාලක ගරු නිහාල් අයිවන් පියතුමාගේ උපදෙස් මත මාසයක් පුරාවටම නිවෙස් වල ජපමාලය උච්චාරණය කර අවසානයේ ලූර්දු මාතා කොට්ඨාසයේ සැම අතුරු මාර්ගයක්ම මරිය වහන්සේගේ නමින් කැපකරන ලදි. ගරු පියතුමා නාම පුවරුවක් ආශිර්වාද කර විවෘත කළ අයුරු.

**පියල් ජයකොඩි**

# නයිනමඩම මීසමේ තරුණ වැඩසටහනක් !

දෙවියන්වහන්සේ යක්ෂයාටත් බලයක් දීල තියනව. ඒත් දෙවියන් වහන්සේ සර්ව සම්පූර්ණ නිසා එම දීපු බලය ආපසු ගත්තේ නැහැ. එමනිසා සමාජය තුළ යක්ෂ බලය ක්‍රියාත්මක වෙනවා. නමුත් ජේසුස් වහන්සේ යක්ෂයාව මෙල්ල කළා, පරාජය කළා, අපිටත් යක්ෂයාව මෙල්ල කරන්ඩ පුළුවන්. එයට ජේසුව අප තුළට ලංකර ගත යුතු වෙනවා. අප නිවසේ ජේසුව තබාගත යුතු වෙනවා. ඒ සඳහා ජපමාලය ශබ්ද නගා උච්චාරණය කරන්න. දේව වචනය ශබ්ද නගා කියවන්න. ජේසු අනුගමනය කරන්න එවිට යක්ෂයා අප අතහැර දමා යාවි.

ගරු ජීවන්ත පීරිස් පියතුමා එලෙස ප්‍රකාශ කළේ පසුගියදා නයිනමඩම ශාන්ත අන්තෝනි දේවස්ථානයේ 'තරුණයයේ සොඳුරු බව පිළිගනිමු. දෙවිඳු සමගින්' තේමාව මුල්කරගෙන පැවති තරුණ තරුණියන් වෙනුවෙන් වූ වැඩසටහනකදීය. මේ සඳහා නයිනමඩම, මුට්ටුව, බෝලවත්ත, බොරලැස්ස යන ප්‍රදේශවලින් තරුණ තරුණියන් හා දෙමව්පියන් විශාල පිරිසක් සහභාගි වු අතර නයිනමඩම මීසම් සේවක පියතුමන්ලා මෙය සංවිධානය කරන ලදි.

**කේ. නිහාල් ප්‍රනාන්දු**



කොලොන්නාව මීසමේ කොටිකාවත්ත අවිලාහි සාන්ත තෙරේසා මුනි දෙව්මැඳුරේ වාර්ෂික මංගල දෙව්පුද මෙහෙය ක්‍රිස්තියානි කලාව හා ගෘහ නිර්මාණ පිළිබඳ අගරදගුරු පදවි උපදේශක ගරු ප්‍රියන්ත සිල්වා කොලොන්නාව මීසම් සේවක ගරු ජූඩ් ක්‍රිෂාන්ත හා ගරු මර්වින් සුදර්ශන පියතුමා පැවැත්වූ අයුරු.

**සටහන - ආර්. ජෝශප් ප්‍රිය සේයා - රුවිනි සාමෙන්**

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2014 නොවැම්බර් 16 ඉරිදා

# සුදුතුම් පිය ලංකා ගමන ගැන දැනුම්වත් වීම

ශ්‍රී ලංකාවේ වෙසෙන සියලුම කතෝලික සැදැහැවත් ජනතාව අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන් මේ සිරිලක් බිමට භක්ත්‍යාදරයෙන් පිළිගනු ලබන්නේ ශු. පේදුරු තුමන්ගේ අනුප්‍රාප්තිකයා හැටියට මෙන්ම ශු. කතෝලික සභාවේ උසස්ම නිලය හොබවන ක්‍රිස්තුන්වහන්සේගේ අග්‍රශ්‍රාවක පෙළපතේ දෘශ්‍යමාන නායකයාණන් සැටියටයි. දෙවන වතිකාන සමුළුවේ ශුද්ධ වූ සභාව පිළිබඳ ජාතින්ගේ ආලෝකය නම් වේද සත්‍ය ව්‍යවස්ථාවේ මේ උතුම් නිලය පිළිබඳව කරන විග්‍රහය මෙරට ජීවත් වන කතෝලික ජනතාවට තවදුරටත් ආගන්තුක නොවේ. ක්‍රිස්තුන් වහන්සේගේ නියෝජිතයා සහ මුළු මහත් සභාවේ ඥාන ගෝපාලයා ලෙස අති ශ්‍රේෂ්ට හා විශ්ව බලයක් ශු. සභාව අරබයා එතුමන් සතුවන බව ජාතින්ගේ ආලෝකය නම් වේද සත්‍ය ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිව සඳහන් කොට ඇත.

ඒ අවබෝධය හා පිළිගැනීම සියලුම කතෝලික ජනතාව අත්‍යන්තයෙන්ම පිළිගත යුතු වෙන අතර ශ්‍රී ලංකාවේ වෙසෙන සියලුම කතෝලික ජනතාව ඒ අවබෝධය තුළ ආදරයත්, ගෞරවයත්, පක්ෂපාතීත්වයත්, ලෙන්ගතුකමත්, අනුගමනයත් දක්වාලන්නේ සභාවේ ක්‍රම වේදය හා සම්ප්‍රදාය තුළම ගොනු වුන ජීවිතයකට ඔවුන් උරුමකම් කියන බැවිනි.

පාප් ධූරය තුළ විශේෂිත කාර්යය භාරයන් අතර සියලු කතෝලික විශ්වාසිකයන්ගේ විශ්වාසය සවිබල ගැන්වීම මූලික වෙන අතර සභාව තුළ ඒකත්වයේ පදනම බලාත්මක කොට එහි ප්‍රභවය සේ පැවතීම අවශ්‍යයෙන්ම ඉටුකළ යුතු බව සිහිගන්වයි. එහිදී දෙවියන්වහන්සේ මිනිස් සංහතියට පෑ අනන්ත කරුණාබර ආදරයේ සළකුන සේ විද්‍යමාන වීම පාප් ධූරය දරන උතුමන්ගේ ජීවිතයෙන්ම පිළිබිඹු විය යුතුයි.

ඒ සියලු ආදරය රැගෙන 2015 ජනවාරි 13-15 දෙදින අප සුදුතුම් පියතුමා ශ්‍රී ලංකාද්වීපයට වැඩම කිරීම ශ්‍රී ලංකා වාසින් හැටියට අප ලබන විශේෂ ආශිර්වාදයකි. මේ සුවිශේෂ වරප්‍රසාදය ලබන්නට පෙළ ගැසෙන මේ සමයේ කතෝලික විශ්වාසිකයින් හැටියට ඉටුවිය යුතු හා ඉටු කළ යුතු මෙහෙවර පිළිබඳව වඩාත් උනන්දුවෙන් දැනුම් වත් වීම අත්‍යවශ්‍ය යයි. දැනටමත් මේ පිළිබඳව ශ්‍රී ලංකා කතෝලික රදගුරු මඬුල්ල සාමුහිකව එළිදක්වා ඇති ප්‍රකාශනයන් පිළිබඳව අවබෝධයක් ඇතිව ඒවා පරිශීලනය කොට දැනුම්වත් විය යුතුයි.

ප්‍රථම වරට ශ්‍රී ලංකා කතෝලික සසුනට සාන්තුවරයෙක් ලැබෙන අති සුවිශේෂි මොහොත මේ ලංකාගමනට සමගාමීව උදාවන බවත් කතෝලික ජනතාව අවබෝධකර ගත යුතුයි. අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් පවසන පරිදිම සාන්තුවරයට ඔසවන මෙහෙය සහිත අති ගාම්භීර දිව්‍ය යාගයකට සහභාගි වීමට කතෝලිකයකු හට අවස්ථාව උදාවන්නේ ඉතාමත් කලාතුරකිනි. නමුත් සුදුතුම් පිය මේ ලංකාගමන තුළදී ශ්‍රී ලාංකික කතෝලික සැදැහැවතුනට ඒ උත්කෘෂ්ඨ මොහොත උදාවි ඇති නිසා එම දිව්‍ය යාගයට සහභාගි වීම මහත්ම භාග්‍යයකි. ඒ පිළිබඳව දැනුම්වත් විය යුතුයි.

කොළඹ ගාලු මුවදොරදී ජනවාරි 14 වන දින උදයවරුවේ පිදෙන මේ දිව්‍ය යාගයට ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් රොඳ බැඳ ගැනීම සැබවින්ම භාග්‍යයකි. කොළඹ අගරදගුරු පදවියේ සැදැහැවතුන් තම මීසම් භාර පියතුමන්ලා සමඟින් ඒ ඒ සංවිධාන ශක්තින් මත ඒ දවසේදී මේ භාග්‍යය දැක බලා අත්පත් කර ගැනීමට එකතු විය යුතුයි. ඒ ගැන දැනුම් වත් විය යුතුයි. අසල් වැසි රටවල් වලින් පවා ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් මෙරටට ඒමට අපේක්ෂා කරන්නේ ඒ උතුම් මොහොතේදී ලබන වරප්‍රසාදය පිළිබඳව උතුරා යන ජ්වලිත අවබෝධයකිනි. අප පාමුලට පැමිණි මේ වරප්‍රසාදයේ උත්තුංග බව සියැසින් දැක බලා ගන්නට, ජීවිතයට දැඩිව ලබා ගන්නාවු විශ්වාසය තිව්‍ර කර ගන්නට ඒ දිව්‍ය යාගයට සහභාගි වීමට උතුර, දකුණ, නැගෙනහිර බටහිර සියලු ප්‍රදේශ වලින් සහෝදරත්වයක් දරා ජනතාවක් පැමිණීම කෙතරම් අපූර්ව හැඟීමක් ජනිත කරත්ද? එබැවින් අපි එකමුතු වීමට දැනුම්වත් වෙමු.

ඉදිරි මාසය තුළදී සැම මීසමකම මේ උතුම් මොහොත සමරන්නට අධ්‍යාත්මිකව සූදානම් වීම අත්‍යවශ්‍යයි. ඒ පිළිබඳවත් මීසම් මට්ටමින් දැනුම්වත් වෙමු. ප්‍රවාහන සේවාවන් කිසිවක් නොඅඩුව සූදානම් කර ඇති නිසා ඒ පිළිබඳවත් කල් ඇතිවම දැනුම්වත් වෙමු. ආහාර, ඉඳුම් හිටුම් හා සනීපාරක්ෂක සියලු කටයුතු සූදානම් කරන බැවින් ඒ පිළිබඳවත් දැනුම් වත් වෙමු. උතුර හා නැගෙනහිර පළාත්වල ජීවත් වන ජනතාවට 14 දින සවස මඩු සිද්ධස්ථානයේ පැවැත්වෙන ආශිර්වාදයට සම්බන්ධ වීමටද සියලු පහසුකම් එකී පදවි වල රදගුරුතුමන් මූලිකත්වයෙන් සිදුවන අතර ඒ පිළිබඳව ද දැනුම්වත් වෙමු.

සසුන් පිය දයා සේවාවට තිළිණයක් සමස්ත කතෝලික ජනතාවගෙන් පිදෙන බවට දැනටමත් ශ්‍රී ලංකා රදගුරු සම්මේලනය තීරණය කර ඇති බැවින් ඒ පිළිබඳවත් දැනුම් වත් වෙමු. සුදුතුම් පිය දයා සේවා අරමුදලට ශ්‍රී ලාංකික ජනතාවගේ මූල්‍ය පරිත්‍යාග පිරිනැමීමට ගත් ඒ තීරණය ඉදිරි සති වලදී මීසම් මට්ටමින් දැනුම් දෙන නිසා ඒ පිළිබඳවත් දැනුම්වත් වෙමු.

මෙලෙස බාහිර හා ඇතුලාන්ත සූදානම් වීම පිළිබඳව දැන් දැන් සිටම ශ්‍රී ලංකා වාසි කතෝලික ජනතාව අවශ්‍යයෙන්ම දැනුම්වත් විය යුත්තේ මේ මහඟු වරප්‍රසාදයේ කොටස්කරුවන් බවට මේ සියලු දෙන පත්වන නිසාමයි.

ආධ්‍යාත්මික සූදානම අපව බලවත් කරන අතර ඒ දැනුම්වත්වීම අපි විශ්වාසයෙන්ම අත්දැක ඇත්තෙමු. බාහිර සියලු කටයුතු සාර්ථක කර ගන්නට සැබෑ ලෙසින්ම ඒ විශ්වාසය ප්‍රායෝගික ජීවිතයට ගෙන එන්නට උත්සුක වෙමු. දෙවියන් වහන්සේට සියල්ල කළ හැක. එබැවින් මිනිස් අප පෙරටගත් පාදය නැවත පසුපසට ගත යුතු නැත. ඒ පිළිබඳවත් විශ්වාසයෙන්ම දැනුම්වත් වෙමු.

# සුදුතුම් පියතුමන්ගේ රාජ්‍යතාන්ත්‍රිකභාවය

**සුදුතුම් පිය ලංකාගමන 2015 නිමිත්තෙනි**

POPE FRANCIS Sri Lanka 2015

**ගරු ෆ්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා**

**අතිඋතුම් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියාණන්ගේ ශ්‍රී ලංකා සංචාරය දිනෙන් දින ලඟාවෙත්ම ශ්‍රී ලංකා රාජගුරු මණ්ඩලය ප්‍රමුඛ ශ්‍රී ලංකාවාසි කතෝලික ජනතාවත්, ශ්‍රී ලංකා රජයත්. වෙනත් ආගමික හා ආගමික නොවන සංවිධාන බොහොමයකුත් එතුමාණන්ව රාජ්‍ය ගෞරව සහිතව ලක් බිමට පිළිගැනීම සඳහා දැන් ලහි ලහියේ සූදානම් වෙති.**

කතෝලික සභාවේ අධ්‍යාත්මික නායකයාණන් වන පාප් වහන්සේට රාජ්‍ය ගෞරව පිරිනමන්නේ කුමකටද? එතුමාණන්ට ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා රදගුරු මඬුල්ල හැර ජනාධිපති තුමන්ද ආරාධනය කිරීම අවශ්‍යද? එතුමාණන්ගේ මෙම ගමන කිසිම රාජ්‍ය සබඳතාවයක් නොමැතිව කතෝලික සභාවේ කටයුත්තක් ලෙස පමණක් සලකා කටයුතු කළ නොහැකිද? අද බොහෝ දෙනෙක් මෙවැනි ප්‍රශ්න බොහොමයකට පිළිතුරු සොයාගන්නට උත්සාහ දරති. මේ සඳහා සමහරු දෙන සරල පිළිතුර නම්, පාප්තුමා කතෝලික සභාවේ නායකයාණෝ මෙන්ම වතිකාන රාජ්‍යයේද නායකත්වය දරණ නිසා, එතුමාගේ මෙම සංචාරයේදී රාජ්‍ය නායකයකු ලෙස පිළිගත යුතුය කියාය. නමුත් මෙය වරදවා තේරුම් ගැනීමකි. රජය පාප්තුමන් පිළිගන්නේ හුදෙක් වතිකාන රාජ්‍යයේ රාජ්‍ය නායකයා වශයෙන් පමණක් නොව, ශ්‍රී ලංකා රජය හා සමග තානාපති සම්බන්ධකම් පවත්වන, ශුද්ධාසනයේ නායකයාණන් ලෙසය.

ශුද්ධාසනය යනු ශ්‍රී ලංකාව ඇතුළු තවත් බොහෝ රටවල් ජාත්‍යන්තර නීතිය තුළ පිළිගෙන ඇති කතෝලික සභාවේ කටයුතු මෙහෙය වන ප්‍රධානතම ආස්ථිත්‍යයය (entity) නැතහොත් සංවිධානය. අපි මෙය කුමක්දැයි සරලව තේරුම් ගැනීමට උත්සාහ කරමු. මේ සඳහා අප විසින් එකිනෙකට ඉතා සමීප එහෙත් වෙන් වෙන්ව හඳුනාගත යුතු කරුණු තුනක්, ඇත. 1) පාප් නිලය, 2) ශුද්ධාසනය, 3) වතිකාන රාජ්‍යය, මේ විග්‍රහයට බොහෝ පැතිකඩ ඔස්සේ පිවිසිය හැකි වූවත්, එය සාසන නීති සංග්‍රහය පමණක් පාදක කරගෙන අවබෝධ කරගන්නට උත්සාහ කරමු.

## 1. පාප් නිලය

ක්‍රිස්තුන් වහන්සේ විසින් විශේෂාකාරයෙන් අපෝස්තුළුවරුන් අතර ප්‍රධානියා වූ සාන්ත පේදුරු තුමන්ට බාරදුන් මෙම නිලය, එතුමාගෙන් පසුව එතැනට පත්වන අනුප්‍රාප්තිකයන් වෙත පැවරෙන අතර, එය රෝමයේ රදගුරු තුමා හා බැඳී පවති. ඒ අනුව පාප්තුමා ලොව පුරා විසිරී ඇති රදගුරු සමූහයේ ප්‍රධානියාද, ක්‍රිස්තුන් වහන්සේගේ දෘශ්‍යමාන නියෝජිතයාද (Vicar of Christ), විශ්ව සභාවේ මෙලොව ප්‍රධාන එඬේරාණන්ද වෙයි. ඒ අනුව එතුමාගේ නිල බලයෙන්ම, උත්තරීතර, සම්පූර්ණ, ඍජු හා විශ්ව නිල බලය කතෝලික සභාව තුළ එතුමාට හිමිවේ. (සාසන නීති වගන්ති 331), මෙම කරුණ තවත් පැහැදිලිව ඉදිරිපත් කරන කතෝලික සභා ධර්මෝපදේශය, "ශුද්ධොත්තම පාප්තුමා, පේදුරු තුමාගේ තැන ගන්නා රෝමයේ රදගුරුතුමාද, රාජගුරු මණ්ඩලයේ හා සමස්ත විශ්වාසකයින්ගේ එකමුතුකමේ දෘශ්‍යමාන සාක්ෂිය වේ. ශුද්ධොත්තම පියතුමා, ක්‍රිස්තුන් වහන්සේගේ නියෝජිතයාය. එතුමා සමස්ත ශුද්ධවූ සභාවේ එඬේරාණන් වන නිසාම, ශුද්ධවූ සභාව කෙරෙහි උත්ථානවු හා විශ්වීය බලපෑමක් කළ හැක. එතුමාට මෙම බලය බාධාවකින් තොරව ක්‍රියාත්මක කළ හැක" (අංක 882) (මේ පිළිබඳව සවිස්තරාත්මක ලිපියක් 2014 ඔක්තෝබර් 26 දා ඥානාර්ථ ප්‍රදීපයේ පලවිය), මේ අනුව පාප්තුමා මූලිකවම කතෝලික සභාවේ අධ්‍යාත්මික නායකයාණෝ බව ඉතා පැහැදිලිය.

## 2. ශුද්ධාසනය

එදා ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයෙන් පසු, අපෝස්තුළුවරුන් දේශ දේශාන්තර කරා ධර්මදූත සේවයේ යෙදෙද්දී, ඔවුනට සහය වීම සඳහා විවිධ තරාතිරම්වල පුද්ගලයෝ ඉදිරිපත් වූහ. මෙවැනි අය බොහෝ දෙනෙකුගේ නම් ශුද්ධ වූ පාවුළුතුමා විටින් විට තම ලිපිවල සඳහන් කර ඇත. මන්ද පේදුරුතුමාගේ තැන ගත් පාප්තුමාටත්, අනිකුත් අපෝස්තුළුවරුන්ගේ තැන ගත් රදගුරු තුමන්ලාටත් එකී දූත සේවාව තනියෙන් කළ හැක්කක් නොවීය. සභාව ක්‍රමයෙන් මෙලොව හැම ප්‍රදේශයක් කරාම ව්‍යාප්ත වෙද්දී, මෙම සහායක සේවාවද විධිමත්ව සංවිධානය විය. අද වර්තමානයේ පාප්තුමන් තමන්ගේ නායකත්වයේ එඬේරික සේවාව ලොව පුරා මෙහෙය වනු ලබන්නේ රෝම ක්‍යුරියාව (Roman Curia) මගිනි. මෙම 'ක්‍යුරියා' නමැති වචනය පැරණි රෝම පරිපාලනයේ විවිධ ගෝත්‍ර බෙදා වෙන්කිරීමේදී ගෝත්‍රික නායකත්වය හැඳින්වීමට යොදාගත් වචනයකි. අද එය සභා වාග්මාලාවට ඇතුළත් වී ඇත්තේ පාප්තුමාගේ කටයුතු සඳහා කෙළින්ම සහය වන සමූහය ලෙසය. පාප්තුමා විශ්ව සභාවේ කටයුතු මෙහෙය වන්නේ මේ රෝම ක්‍යුරියාව මගිනි. රෝම ක්‍යුරියාව පාප්තුමාගේ නායකත්වය යටතේ එතුමාගේ නාමයෙන් සභාවේ යහපත හා සේවය සඳහා ක්‍රියාකරති. රෝම ක්‍යුරියාවේ සංයුතිය නම්, පාප්තුමාගේ ලේකම් කාර්යාලය (Papal Secretariat), සභාවේ පොදු කටයුතු පිළිබඳ කවුන්සිලය (Council of Public Affairs), දූත සේවා පිළිබඳ පර්ෂද (Congregations), හා සාසනික විනිශ්චය සභාවන් (Ecclesiastical tribunals), ඇතුලත්වේ (සාසන නීති වගන්ති 360), ඒ අනුව රාජ්‍ය ලේකම් කාර්යාලය සමග පර්ෂද, 9 ක්ද, අධිකරණ 3 ක්ද, කවුන්සිල (Pontifical Councils) 11 ක්ද, වෙනත් නිශ්චිත ආයතනද මෙයට ඇතුලත්වේ. පාප්තුමා සමග මෙසේ රෝම ක්‍යුරියාවට අයත් අනිකුත් ව්‍යුහයන් සියල්ල හඳුන්වනු ලබන්නේ ශුද්ධාසනය (Holy See or Apostolic See) යනුවෙනි (සාසන නීති වගන්ති 362). පුරාණයේ සිටම සෑම රදගුරු වසමක්ම හඳුන්වනු ලැබුයේ 'ආසනය' (See) යන නමිනි. (See යන වචනයේ මුලාශ්‍රය Sedes යන ලතින් වචනයයි. Sedes යනු ආසනයයි). එහි සංකේතාත්මක අරුත නම් පදවියේ රදගුරුතුමා පදවියේ නායකයා ලෙස අසුන් ගැනීමයි. සෑම රදගුරු වසමකටම ආසන දෙව්මැඳුරක් ඇත්තේ මේ නිසයි. රෝමයේ රදගුරුතුමා සභාවේ සමස්ත නායකයා ලෙස ක්‍රියාත්මක වෙන නිසා එහි පරිපාලන පටිපාටිය 'ශුද්ධාසනය' ලෙස හඳුන්වනු ලැබේ. එමනිසා ශුද්ධාසනයේ ඉතිහාසය අපෝස්තලික යුගය දක්වාම විහිදි යන ඉපැරණි ඉතිහාසයකි. එය ක්‍රිස්තුන්වහන්සේ විසින් අපෝස්තුළුවරුනට දානය කළ යන්න සකල ජනයින් ගෝලයින් කරන්න යන විධානය ක්‍රියාත්මක කිරීමේදී අපෝස්තුළුවරුනට හා විවිධ දේශයන්හි එතුමන්ලාගේ තැනට පත්වූවන් හට සහය ලබාදුන් යාන්ත්‍රණය ලෙස හැඳින්විය හැක.

ලබන සතියට »



## මීසමෙන් මීසමට

# කිතුනුකම කියන්නෙ දෙවියන්වහන්සේට ප්‍රේම කරනවා වගේ ජනතාවට ප්‍රේම කිරීමයි

## සලාපුර රදගුරු හිම්පාණෝ අවධාරණය කරති

අප තුළ දෙවියන්වහන්සේට තිබෙන ගෞරවය භක්තිය ප්‍රේමය වගේම මනුෂ්‍යයාටද අප ප්‍රේම කළ යුතුයි. එය අප හිතට ගත යුතුයි. සමහර මිනිසුන් සතුන්ට පුදුම ආදරයක් තියනවා. එහෙම නම් අපි මනුෂ්‍යයින්ට කොතරම් ආදරයක් ප්‍රේමයක් තිබිය යුතුද? ශුද්ධාත්මයාණන් තමයි ඒ බලය අපට දෙන්නෙ. කිතුනුකම කියන්නෙ දෙවියන් වහන්සේට ප්‍රේම කරනව වගේ ජනතාවට ප්‍රේම කිරීමයි.

සලාපුර රදගරු අතිඋතුම් වැලන්ස් මෙන්දිස් හිම්පාණන් එලෙස ප්‍රකාශ කළේ පසුගියදා නයිනමඩම වික්ෂෝප දේව මාතා දේවස්ථානයේදී පැවති නයිනමඩම මීසමේ දරුවන් 95 දෙනෙකුට අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ දේව මෙහෙයේදීය. මෙම දේව මෙහෙයට හලාවත පදවි පරිපාලක අතිගරු පැට්‍රික් විජේසිංහ නයිනමඩම මීසම් සේවක ගරු ලයිලි ප්‍රනාන්දු පියතුමන්ද රදගුරු තුමාට සහාය විය.

නයිනමඩම සහායක ගරු ජනිත් කෞෂල්‍ය පියතුමාද, නයිනමඩම හා මුට්ටුව දේවස්ථානවල දහම් ගුරු පිරිසද මෙම දරුවන් අභිවෘද්ධි ආලේපය ලැබීමට දහමින් පෝෂණය කළහ.

**කේ. නිහාල් ප්‍රනාන්දු**



යටියන්තොට, සා. මරියා දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය මීසම් සේවක ගරු රොයිස්ටන් පීරිස් පුල්ලේ (සී. එම්. එස්) පියතුමාගේ මගපෙන්වීම යටතේ පසුගිය දා පැවත්විනි. සන්ධ්‍යා මෙහෙය පදවි අනුනායක අතිගරු ඩේමියන් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර, මංගල දිව්‍ය පූජාව කරිටාස් සෙත්මිණි අධ්‍යක්ෂ ගරු බී. ඇන්ටන් ශ්‍රියාන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විනි. මංගල දේව මෙහෙයේදී ගරු බී. ඇන්ටන් ශ්‍රියාන් පියතුමා දේශනය පවත්වන අයුරු මෙහි දැක්වේ.

**ජේ. ඇන්ටනි**

## වැලිවිට ලේ දන්දීම නොවැ. 23 දා

වැලිවිට විසෙන්තිද පාවුලා සමිතිය මගින් 26 වැනි වරටත් පවත්වනු ලබන ලේ දන්දීමේ කඳවුර හා වියලි ආහාර ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමේ වැඩසටහන නොවැම්බර් මස 23 වන ඉරුදින දවස පුරා වැලිවිට සාන්ත මරියා දෙව්මැඳුරේදී පැවැත්වේ.

**සුසිල් හැරිසන්**

# සා. විසෙන්ති පාවුලා මංගල්ලය කරඹෑදී

ශුද්ධ වූ වින්සෙන්තිද පාවුලා මුනිඳුන් නමින් ශ්‍රී ලංකාවේ පළමුවෙන්ම ඉදිකරන ලද හලාවත පදවියේ සේනාපොළ මීසමට අයත් කරඹ දෙව් මැඳුරේ වාර්ෂික මංගල්‍යය පසුගියදා අති උත්කර්ෂවත් අන්දමින් සිදුකරනු ලැබීය.

නාගොඩ, කඳාන ශු. වින්සෙන්තිද පාවුලා සමිතියේ මූල්‍ය දායකත්වයෙන් මෙම දෙව්මැඳුර ඉදිකර පරිත්‍යාග කළ අතර මෙවර මංගල්‍යයට සමගාමීව මෙම දේවසථානයේ දහම් පාසල වෙනුවෙන් රුපියල් පනස් දහසකට අධික ඩෙස් පුටු පරිත්‍යාග කිරීම විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත.

නුවාන සමයේ පවුල් ජීවිතය, ඉවසීම, ප්‍රසාද නිධාන, දරුවන් හා දෙමව්පියන් පිළිබඳ තේමාවන් ඔස්සේ දැනුවත් වූ අතර සන්ධ්‍යා මෙහෙය ඉලන්තිඅඩිය මීසම් සේවක ගරු රනිල් සඳරුවන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකැරිණ. මංගල්‍යය සංවිධාන කටයුතු මීසම් සේවක ගරු සම්පත් ප්‍රසංග පියතුමන් හා සහයක ගරු ප්‍රසාත් ගෝමස් පියතුමාගේ ප්‍රමුඛත්වය මත මැනවින් ඉටුකර තිබිණි. ප්‍රැන්සිස්කානු නිකායේ ගරු තෝමස් පියතුමාගේ මූලිකත්වයෙන් මංගල දිව්‍ය යාගය සිදුකරනු ලැබීය.

**ඇන්ටනි මෙරිල්**



දළුගම සා. ප්‍රැන්සිස් සාලෙස් දෙව් මැඳුරේ තරුණ සමිතියේ සාමාජිකයින් හට නිල ලාංඡන පැලඳවීම හා ප්‍රතිඥා දීමේ දිව්‍ය යාගය පසුගියදා එම දේවස්ථානයේදී සිදු කෙරිණ. සාමාජිකයින් 43 දෙනෙකුට නිල ලාංඡන පැළඳු අතර නවක සාමාජිකයින් රැසක් මෙහිදී සාමාජිකත්වය ලබා ගත්හ.

**සටහන - ජී. ඩී. සංජුල ජනිත් ; සේයා - ඉසුරු ඩී අල්විස්**



කඩලාන මීසමේ කොට්ඨාශ අතර සුහදතාවය වර්ධනය කිරීම සඳහා ක්‍රිකට් තරගයක් පසුගියදා ශා. අන්තෝනි පිහිටාරක්ෂක සමිතිය මගින් සංවිධානය කරනු ලැබීය. එහිදි ජයග්‍රාහි කාන්තා කණ්ඩායම වශයෙන් දෙවැනි කොට්ඨාශය පෙරමුණ ගත්තේය.

**සුරත්ද සිල්වා**



ගොඩැල්ල මීසමේ අභිවෘද්ධියාලේපය ලැබීමට සූදානම් වන දු දරුවන් සඳහා මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමා දියත් කරැති වැඩ සටහන් මාලාව යටතේ ළමා ප්‍රදීප සහය සංස්කාරක කුමර නයනජිත් මහතා සම්මන්ත්‍රණයක් පැවැත්විය. ගොඩැල්ල, තඹරවිල, දන්කොටුව, මොරැක්කුලිය යන දෙව් මැඳුරුවලට අයත් ළමෝ මීට එක්වූහ. මෙය දේශකයාගේ 125 වැනි ළමා ලේඛක වැඩමුළුවයි.

**එච්. ඒ. සිරිල් පෙරේරා**

# දහම් අධ්‍යාපනය පිරිපුන් දරුවන් බිහිකරයි

අද රටේ සියලුම ක්ෂෙත්‍ර වල විනය පිරිහීමක් දකින්නට ලැබෙනවා. විනය ඇති කළ හැක්කේ දේශපාලන හා ආගමික ක්ෂෙත්‍රවල කටයුතු කරන අයට පමණයි. සරසවි ක්ෂේත්‍රය තුළින් විනය පිරිහී ඇතිබව දකින්නට පුළුවන්. ගුරුවරුන් ශිෂ්‍ය ප්‍රජාව ගොඩනැගීමට උත්සහ කළයුතු අතරම, දහම් පාසල් ආභාෂය තුළින් පිරිපුන් දරුවන් රටට බිහි කරන්නට දහම් ගුරුවරුන් කටයුතු කළ යුතුයි. වසර 100 ට අධික ඉතිහාසයක් ඇති මෙම දෙව්මැඳුර ප්‍රදේශයේ ආගමික සමගිය පවත්වා ගෙන යාම ගැන සතුටුය. ඉදිරියේ දී ඉදිවන මෙම දහම් පාසල් ගොඩනැගිල්ල තුළ විනය ගරුක දරු පිරිසක් බිහි වේවායැයි ප්‍රාර්ථනා කරමි.

විල්ලෝරාවත්ත මීසමට අයත් වැවල සා. ලාසරස් දෙව්මැඳුරට අඩුපාඩුවක්ව පැවැති දහම් පාසල් ගොඩනැගිල්ලකට මුල්ගල් තැබීම සඳහා පැවැති උත්සවයකදී වැවල ගලබඩ ධම්මදීපාරාමාධිපති අති පූජ්‍ය හඟරාජපිටියේ මෛත්‍රී ස්වාමින් වහන්සේ පැවසූහ. මීසම් සේවක ගරු ටෝනි පිංතු පියතුමාගේ ආරාධනයෙන් පැමිණි අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වෙල් සිල්වා පියතුමන් මුල් ගල් ආසිරි ගැන්වූ අතර, එතුමන් හා ගරු ස්වාමින් වහන්සේ සමග කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කම්කරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා ඇතුළු ආරාධිතයින් කීප දෙනෙක්ද මුල්ගල් තැබීමට දායක වූහ. 1963 දී ළමයින් 10 දෙනෙකුගෙන් ආරම්භ වූ මෙම දහම් පාසලේ අද 200 කට අධික දරුවන් පිරිසක් දහම් දැනුම ලබන බව වාර්තා වේ.

**ට්‍රිසිල් ඇප්. මැන්දිස්**



දියලගොඩ සාන්ත සෙබස්තියන් දහම් පාසලේ ශිෂ්‍ය නායක නායිකාවන් විසින් ගුරු උපහාර උලෙළක් පසුගියදා පවත්වන ලදි. මීසම් සේවක ගරු දිනේෂ් තරංග කීර්තිසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති උලෙළට ගරු බෙතිල්ඩ්, ගරු අයෝමි පැවිදි සොහොයුරියන් සමග දහම් ගුරුවරුන්, ශිෂ්‍ය නායකයන් විසින් පිළිගැනීමෙන් අනතුරුව උත්සව ශාලාව වෙත කැඳවා ගෙන ආ අයුරු.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

# හෙට්ටිරිප්පුව ශු. රෝගුස් මුනි දෙව්මැඳුර




එදා වෙළෙඳාම සඳහා තොඩුවාව, වැලිහේන, ඇත්ගාල මීගමුව ප්‍රදේශවලින් ආ සමහරෙක් හෙට්ටිරිප්පුව ප්‍රදේශයේ ඒ සශ්‍රික පොළොවට ලොල්ව වගා කටයුතු අරඹමින් මෙහි පදිංචි වූහ. ඔවුන් සියල්ලෝම වාගේ කතෝලික භක්තිකයෝය. අවාහ විවාහවීමෙන් හෝ අලුත පදිංචිය නිසා මෙය ජනසංඛ්‍යාව දිනෙන් දින ඉහල ගියේය. එදා මෙම ප්‍රදේශය අයිතිව තිබුණේ හාල්දඬුවන මීසමටය. දිව්‍ය පූජාවට හෝ වෙනත් කටයුත්තක් සඳහා සැතැපුම හයක් හෝ හතක දුර ගමන් කිරීමට සිදුවිය. මෙය කල්පනාවට ගත් හාල්දඬුවන මීසම් සේවක ගරු ඩි. ජේ. ක්‍රිසෝස්තම් පියතුමා ඉදිරිපත් කළ යෝජනාවට අනුකූලතාවය දක්වමින් යාපනය රාජගුරු අතිඋතුම් තියෝපිලස් ඇන්ඩෘ මෙලිසන් හිම්පාණන්ට තෑගි ඔප්පුවකින් පවරා දුන් අක්කරයක් පමණ වූ භූමිභාගයේ පුංචි දෙව්මැඳුරක් ගොඩනගා එය ශුද්ධ වූ රෝගුස් මුනිඳුන්ට කැපකර 1882 සැප්තැම්බර් 3 වන දින ආසිරි ගන්වා පළමු දිව්‍ය යාගය පුද කළහ.

1904 හා 1912 වන විට සභා පාලකයෝද දෙව්මැඳුර පිහිටි භූමි භාගයට තව තවත් ඉඩම් මිලදී ගත්හ. 1935 දී හෙට්ටිරිප්පුව දෙව්මැඳුර ඉරබඩගම මීසමට අයත් විය. මේ වනවිට ජනගහනය ප්‍රමාණයෙන් විශාල නිසා ඊට සරිලන දෙව්මැඳුරක් ගොඩනැංවීමට සිතූ මීසම් සේවක පියතුමා ප්‍රමුඛ ගිහි සැදැහැවතුන්ගේ මූලිකත්වයෙන් 1940 ඉතා අලංකාර ගොඩනැගිල්ලක් උළු සෙවිලි කර ගඩොලින් සෑදීය.

1987 නව ඇතුගල්පුර පදවියට අයත්වීම සිහිගන්වමින් තැනූ ලූර්දු ගුහාව 1987 අගෝස්තු 23 අතිඋතුම් රේමන්ඩ් පීරිස් හිම්පාණන් ආසිරි ගන්වා සැදැහැවත් ජනතාවට බාරදුනි. සියවස් සැමරුමට සමගාමීව ගරු ලයනල් ප්‍රනාන්දු පියතුමන් හා එක්ව නව දෙව්මැඳුරකට මුල්ගල් තබා ඉදිකිරීම් ඇරැඹූ අතර ගරු අනිල් මාකස් පිය සමයේ 2003 අගෝස්තු 24 දින ආසිරි ගැන්වීය.

හෙට්ටිරිප්පුව ශුද්ධ වූ රෝගුස් මුනිඳුන්ගේ දෙව්මැඳුර කුරුණෑගල පදවියේ අති විශාලම දෙව්මැඳුරයි.

**ජී. බී. එච්. ලිවේරා**



හලාවත පදවියේ වයික්කාල මීසමේ විවාහ හමු සතිඅන්තයක් සින්දාත්‍රි මාතා දේවස්ථානයේදී පසුගියදා පැවැත්වින. මීසම් සේවක ගරු පිලික්ස් කොළඹගේ පියතුමාගේ ආරාධනයෙන් සිදුකළ මේ සතිඅන්තයට යුවළ 24 ක් සහභාගි වූ අතර හලාවත පදවි පවුල් සේවා අධ්‍යක්ෂ ගරු අශෝක් ප්‍රියන්ත පියතුමා හා විවාහ හමු ජාතික මෙහෙයුම් සංඝයේ ෂෙල්ටන්+මේරියන්, සරත්+මෙරිනා, ටෙරන්ස්+ඩොනිටා යන යුවළ විසින් මෙය මෙහෙයවන ලදි.

**ඩබ්. පී. ටෙරන්ස් ප්‍රනාන්දු**

## මරිය වසර නිමිත්තෙන් නැෂාරෑත් පහනින්...

### මරිය වසර මගේ ඇසින්

| | |
|---|---|
| වසරක් තුළම සමරන ඔබෙ ගුණ | කරුණා |
| ඒතැනින් නිමා කළ හැකි දැයි පැණ | නැඟෙනා |
| සැමටම මවක් වී දක්වන පෙම් | ගුණෙනා |
| දෙව් මව් බැතිය සිසිලසමැයි හද | වෙලනා |
| ආදර මවේ ඔබෙ ගුණ ගයනා | අටියෙන් |
| වසරක් පුරාවට ජන හිත බැඳ | බැතියෙන් |
| සෙනෙහස ලබන්නට මව් පෙම පෙර | දැරියෙන් |
| ඔබවයි තබා ගත්තේ මුදු හද | කුටියෙන් |
| මරි මව් වසර තුන් හෙළයම ගොනු | කෙරුවා |
| ජපමාලයෙන් පවුලක් ආසිරි | ලැබුවා |
| දූ දරු සිත් සතන් හරි මඟ යොමු | කෙරුවා |
| මරි මව් වසර තුළ අප සැම ජය | ලැබුවා |
| "නිමල මරිය කුමරිය" ගුණ | හදවතට |
| ලංකර තබනු පිණිසයි වසරක් | අපට |
| වෙන්කර ලබා දුන්නේ සසුනින් | දැයට |
| වෑයම සපිරුණායි කිව හැක යස | රඟට |

**මේරි ඇනස්ටීන් මිහිඳුකුළ - බෝලවලාන**

• • • • • • • • • • • • • • • • • • • • • • • • • • • • • • • •

### කුමරිය ඔබ වෙයි මරි මව

දෙව් බිළිඳුන් කුස දැරුවා කුමරිය ඔබ වෙයි මරි මව
දෙව් අණ ලෙස කුස දැරූ බිළිඳුන් බිහිකෙරුවා මරි මව
සුරලෝකෙට හිනි මං පෙත කෙරුවා දෙව් පුතු මරි මව
ඒ ඉනිමඟ නැගලා යමු සමඟින් සුරලොව මරි මව

ජපමාලය කියනා සැම පිහිටක් ලබලා මරි මව
තම දෙව් පුතුගෙන් ඉල්ලා දෙයි අපෙ ඕනෑකම් සැම
සරල සුමග දිළිඳු දිවිය ආදර්ශය දුන් මරි මව
එම දිවි අනුගමනය කරනට අපි අදිටන් කරමුව

පාතිමාවෙ දසුන් වෙමින් ජපමාලය ගැන කීවා
ලූර්දු දර්ශනයෙන් ජපමාලය යදිනට කීවා
ලොවේ පාප නැසුමට ජපමාලය පිහිටක් වේවා
නිතරම ජපමාලෙන් දිවි ගෙවනට අදිටන් වේවා

**රීටා ප්‍රනාන්දු - දඹදෙණිය**

• • • • • • • • • • • • • • • • • • • • • • • • • • • • • • • •

### ආදර මරියේ.....

මරිය මව් වසර ගෙවී යයි හෙමිහිට
දැනුනාද අම්මේ.... ඔබතුමියට
ඔබේ දරු කැලගේ සැබෑ ආදරය....
කොපමණ කියුවත්, කොපමණ ගැයූවත්
නිම කරනට නොහැක ඔබගේ ගුණ මහිම
වරදක් වුවා නම් අපගෙන් ඔබ හට
සමාව අයදිමි.... බැහැපත් සිතැතින ....
කිතු තුම වෙත අප ගෙන යන
ආදර මරියේ...
එන්නම් එල්ලී සුදු සළුපටෙ ඔබෙ
ශ්‍රී වත දකින්නට දෙව් පුත් කුමරුගෙ...

**නෙල්කා ශ්‍යාමලී - වැල්ලපල්ලිය, පල්ලියවත්ත**

# දෙව් මව් තුළ ජපමාලයේ බලය අත්දැක්කා



ඔක්තෝබර් මාසය දෙව් මව්ට මුල් තැන දී ජපමාල උච්චාරණය හා එහි අභිරහස් මෙනෙහි කර අප සිත් නිවාගන්නට මං පාදන කාල වකවානුවකි. අන් දිනවල අප ජපමාල උච්චාරණයේ යෙදුනත් මේ කාලය තුළ අවට කතෝලික පවුල් හා එකමුතු වී කරන ජපමාල මෙහෙය කුඩා නුවානයක සිරි ගනී. එයින් ලද හැකි වරප්‍රසාද බොහෝ ය. මේ සමය තුළ ඇති වැහිබර කාලගුණයද ආධ්‍යාත්මික සුවය අත් විඳින්නට අප හට දෙවිඳුන් දුන් තිළිණයක් හා සමානය.

ඔක්තෝබර් මාසය ජපමාල මාසය ලෙස හඳුන්වන්නට ද කතෝලික ජනතාව පුරුදු වී සිටිති. දේව මාතාවන් පෙරටුකොට එතුමියව ගෙන් ගෙට කැඳවා ගනිමින් මේ යන ගමනේ දී උස් පහත් භේදයක් හෝ තරහ මරහක් අප සිත් තුළ නොවිය යුතුය.

එදා මරිය තුමිය එළිසබෙත් තුමිය බැහැදකින්නට ගියේ තම කුස තුළ දරුවකු පිළිසිඳගෙන සිටි මොහොතකය. දේව වරප්‍රසාදයට හිමිකම් කීමේ උඩඟුවවත් ගමනේ දුර හෝ මහන්සියවත් එතුමිය තුළ නොවීය. තව කෙනෙකුගේ සතුට හා එක්වීමත්, පිහිටවීමත් හැර එහි අන්කිසි ලාභ ප්‍රයෝජනයක් නැත. කානා නුවර මංගල මොහොතේ දී එතුමිය තුළ වූයේ වැදගත් මොහොතක දී සිදුවන්නට යන අවමානයෙන් මඟුල් ගෙදර නිවැසියන් මුදවා ගැනීමේ උදාර අදහස පමණකි. එසේ නම් මේ ජපමාල මාසය තුළ අප වෙත ද තිබිය යුත්තේ මරියතුමිය වෙත වූ නිරහංකාර බවත් අන් අය වෙනුවෙන් කැපවීමේ පුරුද්දත් පමණි.

වෙනත් නිවසක ජපමාල මෙහෙය සඳහා සූදානම් වූ ලෙස අපට එය කළ නොහැකි වන්නට පුළුවන. එය අපගේ මෙහෙයට බාධාවක් කර ගත යුතු නැත. අප කළ යුත්තේ දෙව් මව්ට ගෞරවය පිණිස පිරිසිදු සිතින් යුතුව මෙහෙය සඳහා සූදානම් වීම පමණි. සැම අයකුගේ සිත් තුළ දේව භක්තියත් විශ්වාසයත් පිරී තිබිය යුතු සේම, තරාතිරමක් නොබලා, මෙහෙයට පැමිණෙන සැම අයකුවම සුහද සිතින් තම නිවසට කැඳවා ගැනීමේ උවමනාවද අප තුළ පෙරදැරි විය යුතුය. එවිට දේවමාතාවන් වෙත සැබෑ ගෞරවයෙන් යුතු විශ්වාසී ඇදහිල්ලෙන් පිරුණු මෙහෙයක් සංවිධානය කිරීමේ හැකියාව අපට ලැබෙනු ඇත. දෙව් මව් භක්තියෙන් අදහන නිවසට එතුමිය ගේ පැමිණීම ද වළක්වනු නොහැකිය. පහත සිදුවීම එයට එක් උදාහරණයකි.

එක් මරිය හමුදා සොහොයුරියක ගේ දරුවකුට වූ අසනීප තත්ත්වයකට දෙව් මව් පිහිට පතා යාච්ඤා කිරීමට ගිය මරිය හමුදා සාමාජික පිරිසකට යාච්ඤා කරන මොහොතේ දී දෙව් මව්ගේ පැමිණීම අත් විඳින්නට හැකිවිය. ඉමිහිරි මල් සුවඳක් හමා එන අයුරින් එතුමිය ගේ වැඩම කරවීම එම නිවැසි දෙදෙනකුටත් (රෝගී දරුවාත් සමඟ) මරිය හමුදා සාමාජිකාවකටත් දැනී තිබුණි. සුවඳ හැමීමේ වෙනත් බාහිර ක්‍රියාවලියක් ඒ මොහොතේ සිදුනොවීත් මේ සුවඳ දැනුනේ කෙළෙසින් ද? ඒ ඔවුන් ඉතා භක්තිමත්ව පිරිසිදු සිතින් යුතුව රෝගී දරුවකුට සුවය පතා යාච්ඤා කළ නිසා නොවේ ද? (සත්‍ය සිදුවීමකි)

**ප්‍රේමලතා ප්‍රනාන්දු**
පැල්ලන්දෙනිය

# මළවුන්ගේ මාසය නිමාවීමට පෙර...



මෙය මළවුන්ගේ මාසයයි. එසේ වුවත් ජීවත් වී සිටින අප සැමට මරණයේ යථාර්ථය ගැන කියා දෙන මාසයයි. මෙහිදී අප තේරුම් ගත යුත්තේ ජීවිතය මරණයත් සමඟ අවසන් නොවන බව හා ජීවත්වී සිටියදීම මරණයත් උත්ථානයත් අත්දැකිය යුතු බව සිහි කැඳවන මාසයකි. මෙම මාසය තුළ දානමාන දී මිනී වළවල් සුද්ද කර ඉටිපහන් දැල් වූ පමණින් අපට සියලු යුතුකම් ඉටු කළා කියා තෘප්තිමත් විය නොහැකිය. මළවුන් සිහිකිරීම පමණක් නොව ජීවතුන් වෙනුවෙන් ද අප විසින් යුතුකම් ඉටු කළ යුතුය. ජීවතුන් අතර සිටින ඉතා අන්ත අසරණ වූ මිය ගියා වැනි වුන් නැගිටවිය යුතුය.

අප අතර නැති අපෙන් වෙන්ව ගොස් සිටින අය ගැන සංවේදී වන්නට උත්සාහ කරන අතරම අප සමඟ සිටින අසරණයාගෙ අවශ්‍යතාවයට ද සංවේදී විය යුතුය.

බොහෝ විට අනාථ මඩම්වල, මහලු නිවාසවල, දරුවන් විසින් තනිකර දමා සිටින අසරණ වැඩිහිටියන් වෙත අපගේ අවධානය යොමු කළ යුත්තෙමු. ඇති හැකි පමණින් ඔවුනට රසවත් ආහාර වේලක්, ඇඳුම් පැළඳුම් වැනි දේවල් පරිත්‍යාග කරමින් අපගේ කාලයෙන් බිඳක් ඒ අය හා සමඟ සතුටු සාමිචියේ යෙදීමට වැය කළ හැකි නම් එය මොන තරම් ජේසුස් ස්වාමින් වහන්සේ වෙනුවෙන් කරන උතුම් වූ ක්‍රියාවක් නොවන්නේ ද? උන්වහන්සේ කියා දුන් ආදරයේ, ප්‍රේමයේ බැඳීම එයම වන්නේ ය.

එවැනි අත්දැකීම් තුළින් මරණය ගැන බිය ඉවතලා කරුණාවන්ත, ආදරවන්ත, පරිත්‍යාගශීලි ජීවිතයකට ස්වාමින් වහන්සේ අපව කැඳවන සේක.

එමෙන්ම මරණය තුළින් සදාතනික නිවහන වෙතට අප රැගෙන යන්නේ අප අන් අයට දක්වන ආදරය, සහ යහපත හරහා පමණක් බව සිහි තබා ගත යුතුය.

වර්තමාන සමාජය දෙස හැරී බලන විට, සමහර අවස්ථා වලදී දරුවන් දෙමාපියන් නාඳුනන, ඔවුන්ගේ අසරණකම නොහඳුනන, සහෝදර ප්‍රේමය අමතක කර දමා ඇති යුගයකට අවතීරණය වී සිටිමු.

මෙවැනි සමාජ පසුබිමක් තුළ මේ මළවුන් සිහිකරන කාලය තුළ අපට සිහි ගන්වන්නේ කුමක් ද? මළවුන් වෙනුවෙන් යදිමින් ඔවුන් ගැන සිතා දාන ධර්ම දෙන විට එවැනි මොහොතක් අපටත් කෙදිනක හෝ හිමිවන බව මතක තබා ගනිමින් ජීවත් වීමට හැකි නම් මේ විශ්වය මොන තරම් සුන්දර තැනක් වේද? කියායි.

ඒ නිසා දෙවියන් වහන්සේ ඉදිරියේ අවසානයේ වඩා වැදගත් වනුයේ කෙනෙක් මෙලොව ජීවත් වූ වසර ගණන නොව ජීවිතය ගත කළ පිළිවෙල හා ක්‍රමයයි. මළවුන්ගේ මාසය තුළ මෙය සිහියේ තබා ගනිමු.

**ලූෂන් එඩ්වඩ්**
ගෝනවල

### සොඳුරු සුසානය

| | |
|---|---|
| බාලොලි ඉද්ද රුක් අත්තන මල් | පිපෙන |
| රන් සමනලුන් සියොතුන් සැරසිලි | සදන |
| සඳ දිය තෙමෙන රැය තරු වියනින් | දිලෙන |
| සොහොන මැ සාම සංහිඳියාවකි | සොබන |
| පිනි බිඳුවකට සම කෙටි දිවි හැර | දමන |
| තිරසර සදා ජීවනයට දොර | හැරෙන |
| ආශා ඉසුරු පොදි හළ නිදහස් | දැහැන |
| සැනසිලි නවාතැන - මොක් පුර යන | ගමන |
| උස් සිහිවටන ඇති හෝ කිසිවක් | නොමැති |
| කවුරුත් නිදති සම සේ වෙනසක් | නොමැති |
| සුවහස් දෙනා මිහි ගැබ යට සැඟවැ | ඇති |
| ලොකු පොඩිකම් නැති ව අළු දූවිල්ලට | හැරෙති |
| කුලමල ජන්ම උස්මිටිකම් විවිධ | මිමි |
| නිලතල උගත් නූගත් බල දුබල | මිමි |
| අත මිට නිසරුකම් සරු යස ඉසුරු | හිමි |
| හැම දෙන මනින මිමි - මෙහි සදහට මැ | නිමි |
| පඬිවරු කලාකරුවෝ නරපති | විරුවෝ |
| රට දැය නඟා ලොවැ අමරවැ නම | දැරුවෝ |
| නොමඟට වැටී පිරිහී තම නම | දිරුවෝ |
| ඒ හැම සියලු දෙන සොහොනෙදි සම | දරුවෝ |

**කිවිසුරු පුෂ්පානන්ද පීරිස් - පල්ලන්සේන**

### මරණය අභියස

| | |
|---|---|
| දූවිල්ලෙන් සැදුන අපි පොළොවේ | වැළලෙනවා |
| අප මල දාට කවුරුන් හෝ | වැලපෙනවා |
| දින සති මාස අවුරුදු ගෙවිලා | යනවා |
| සිට වූ කුරුස ප්‍රතිමා නිති | වැජඹෙනවා |
| ඉපදුන ගමන් දුක හිතිලා | ඇඬුවාදෝ |
| මරණය දකිද්දී හිනැහෙන්නට | හැකිවේදෝ |
| ගෙන ආ දෙයක් නැති මුත් ගෙන යන්නට | ඇත්දෝ |
| කළ හොඳ තිබේ නම් එය ගෙන යා | හැකිදෝ |
| මිනිසුන් වෙසෙන්නේ කිසිදින නොමැරෙන | ලෙසය |
| වස්තුව හොයන්නේ අන් අය මරා | ගෙනය |
| කළ පව් සිහිවන්නේ මරණය | අභියසය |
| සමුගන්නාදාට යා යුතු හිස් | අතින්මය |

**ශ්‍රියානි මානෙල් පෙරේරා - ගිරිඋල්ල**

ජන වන්දනාව

POPE FRANCIS
Sri Lanka 2015

# ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ලංකා ගමන හා. ජුසේවාස් මුනි සුදුවරයට එසැවීම

## විශ්වාසිකයන්ගේ යැදුම් 2014 නොවැම්බර් 16 ඉරුදින දේව මෙහෙයට




- ප්‍රසාද ස්නාපනයේදී අප ලබාගත් විශ්වාසයේ තිළිණයට අපගේ හදවත් විවෘත කරමින්, අප සැම ශුද්ධවන්ත ජනතාවක් ලෙස සාධාරණත්වයේ ඵල ගෙන ඒම දෙවියන් වහන්සේගේ අභිමතය බව අදහා ගනිමින්, කැපවුණු කිතුනු දිවියක් ගෙවීමට වරම් ලබන පිණිස... අපි යාච්ඤා කරමු.
- වර්තමාන ලෝක යථාර්ථය තුළින් අප සඳහා වූ දෙවි සමිඳුන්ගේ සැලැස්ම ඵල දැරීමට ජීවිතය තුළ ඉඩ නොදෙනු වස් එළඹෙන යක්ෂයාගේ දුර්පරීක්ෂාවන්ගෙන් අපගේ හෘදයන් රැක ගැනීමේ අවශ්‍යතාවට අවදි වෙමින්, අධිෂ්ඨානයෙන් හා කැපවීමෙන් ක්‍රියා කරන්නට අප සැමට හැකිවන පිණිස... අපි යාච්ඤා කරමු.
- අප සැම කතෝලිකයන් ලෙස යන දිවි ගමනෙහිදී ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය, දිව්‍ය සත්ප්‍රසාදය, පාපොච්චාරණය, විවාහය ආදී ප්‍රසාද නිධාන වැදගත් මං සලකුනු ලෙස නිති සිහිපත් කරමින් කිතුනු දිවියෙහි වැඩි වර්ධනය වීම සඳහා ශක්තිය ලැබෙන පිණිස... අපි යාච්ඤා කරමු.
- භාග්‍යවත් ජුසේ වාස් මුනිතුමන්ගේ ශුද්ධවරයට එසැවීම කරණකොටගෙන කතෝලික බැතිමතුන් වන අපට එතුමන්ගේ ජීවිතාදර්ශය හා මැදිහත්කමේ පිහිට තුළින් විශ්වාසයට එරෙහිවූ විවිධාකාර පීඩන, වේදනා හමුවෙහි විශ්වාසයේ ස්ථිරසාරව සිටිමින්, තම කිතුනු කැඳවීම අනුව දේශය තුළ ක්‍රියා කිරීමට හැකියාව ලැබෙන පිණිස... අපි යාච්ඤා කරමු.

## කුමන කෝණයෙන් බැලූවත් අප දෙසම බලා සිටින බව හැඟවෙන

# සදාසරණ දෙව්මව් සේයාරුව



**ලෝකයේ නන් දෙසින් ඉපැරැණි කලා වස්තූන් ගැන අසන්නට දකින්නට ලැබෙන්නේ අල්ප වශයෙනි. නමුදු සදාසරණ දෙව්මවුන්ගේ සේයාරුවේ විශේෂත්වය ගැන කතා නොකර සිටීමට අපට නොහැකිය. මෙම සේයාරුව 15 වැනි සියවසේ දී රෝමයට රැගෙන ගිය බව පුරා වෘත සාක්ෂි දරයි. මෙම සේයාරුව මඟින් රෝම පුරයේ දී විශේෂ ප්‍රාතිහාර්යය ගණනාවක් සිදුකර ඇත.**

දිනක් යහපත් කුඩා ගැහැනු දරුවකුට මෙතුමිය දර්ශනය වී නිරතුරු සදා සරණ මෑණියන් මෙම පින්තූරයේ දිස්වන බව පහදා දුනි. පසුව මෙම සේයාරුව අධාර්මික ප්‍රංශ සෙබළු පිරිසක් විසින් දෙව්මැඳුර කඩා සුනු විසුනු කිරීමට පෙර එහි විසූ පූජකතුමන් විසින් රහසිගතව තාපසාරාමයකට රැගෙන යන ලදි.

රෝමයේදී කුඩා දැරියට මරි මවුන් දර්ශනය වූ පෙදෙසේම ආසන දෙව්මැඳුර හා ශුද්ධවූ ජුවාම් අපෝස්තුලු තුමාගේ ආසන දෙව්මැඳුරටත් අතර භූමියේ මෙම සේයාරුව බැගෑ සිතින් බැති පෙම් දැක්විය යුතු බැව් පණිවුඩය ලබා දුනි.

මෙම ආසන දෙව්මැඳුරේ අල්තාරයට ඉහළින් මෙතුමියගේ සේයා රුව වන්දනාමාන කිරීම සඳහා පොදු ජනවන්දනා ස්ථානයක් ස්ථාපිත කරන ලදි. ඉන්පසු ක්‍රිස්තු වර්ෂ 1499 සිට 1778 තෙක් බැතිමතුන්ගේ ගෞරවාදරයට මෙතුමිය පාත්‍ර වූයේ නිරන්තර පිහිටාධාර මාතාව යන විරුදාවලිය සමගිනි. පසුව "පොස්ටෙරලා" නගරයේ පිහිටි දේවස්ථානයේ මෙම සදාසරණ සේයාරුව තැබූහ. එය ක්‍රිස්තු වර්ෂ 1866 වන තෙක් එහි තිබී පසුව සතුරන්ගේ විනාශයෙන් පසුව ශුද්ධවූ මතෙව් දෙව්මැඳුර භූමියෙහිම අලුත් දෙව්මැඳුරක් තනා 09 වැනි පියුස් පාප් වහන්සේ විසින් එම පින්තූරය දිව්‍ය ගැලවුම්කරුවාණන්ගේ තාපස නිකායේ පියවරුන්ට භාර දීමෙන් අනතුරුව අභිනව දෙව්මැඳුරේ මෙම ආශ්චර්යජනක පින්තූරය උත්සවශ්‍රීයෙන් ස්ථාපිත කැරිණි. අදටත් පාප් තුමා විසින් සදාසරණ දේවමාතා බැතිය ලොව පුරා ප්‍රචලිත කිරීම සඳහා දිව්‍ය ගැලවුම්කරුවාණන්ගේ නිකායේ පියවරුන්ට නිරතුරු ආයාචනා කරන අතර දේශදීපංකරේ සැදැහැවතුන් අදත් ඇයගේ පිහිටාශිර්වාදය පතා බැගෑ සිතින් දණ නමා ඇයගේ සුකුමල වත සිප ගන්නා අතර, මෙතුමියගේ සේයාරුව කොයි අත බැලුවත්, කුමන කෝණයකින් බැලුවත් දිස්වන්නේ අපට සදා සරණය වෙමින් අප හද මඬලට එබිකම් පාමින් අප දෙසම බලා සිටින බවය.

**රෙක්සි ප්‍රැන්ක්**
බලගල - හැඳල

## අපත් මැරෙන බව සිතමු

සුරලොව යන්ට සිතුවත් මල් පොකුරු මැදින්
අන් අය සුරමින් සුර සැප විඳින දනන්
සොරෙක් මෙන් එබෙන විට මරණය ද සැනෙන්
අහෝ දුකකි යන්නට වෙයි උපන් ලෙසින්

මල් පොකුරින් ඉපි පහනින් වල සරසා තැබුවත්
මලවුන් තවත් මෙලොව නොඑති හද රිදවා දැමුවත්
අප මැරෙනා බව සිතලා නොදක්වනුව මමත්වයක්
මේ ටික තේරුම් ගෙන දිවි ගෙවමුව අපි තත්පරයක්

දේව වදන දැන දිවි ගෙවීමට අදිටන් කරමු
පරහට දයා තම හට මෙන් දක්වා පින් රැස් කරමු
කෑම බීම ඇති හැකි දෑ ලද පමණින් පුද කරමු
හදවත කියනා සත්‍යය හරියයි පිළි ගනිමු

**රීටා ප්‍රනාන්දු - දඹදෙණිය**

## සුදුතුම් පියාණනි

ආදම් ශිවම් ගෞතම සිරි පා රඳනා
සිව් මහ නදී හිස මුදුනෙන් ඇද හැලෙනා
සමනල කන්ද ඔබ එනතුරු දින ගණිනා
සිරිලක විවිධ මුත් ඒකීයව දිලෙනා

එදා බුදු හිමි දුරුතු මස පුන් පෝ දිනේ
මෙදා සුදු හිමි ජානුස් මස පොංගල් දිනේ
එදා සඳමුත් ඇතේ නැවතත් යක් විනේ
මුවින් අවි ගෙන තැනින් තැන ගිනි බිඳිමිනේ

කිතු බොදු හින්දු ඉස්ලාම් විදුලිය එළියේ
මියදුන නාසී හොල්මන් ඇත කල එළියේ
සුදුතුම් පියා වැඩි පසු අපි හිරු එළියේ
කුරුසිය කසිණයයි කැඳවන තුරු දිවියේ

පිළිරූ වණන සිත් හරවා නිදොස් කළා
තම රූ පිළිරුව ද පොළොවෙන් ඉවත් කළා
ජුසේ වාස් ගොන්සල්වෙස් පියවරු දිවැස් හෙලා
ලක්දිව ආසිරි ගන්වති ඔබ වඩිනු බලා

මංගලම් ජය මංගලම් සුද්ධාසනේ
මංගලම් සුභ මංගලම් සුපුවත ගෙනේ
මංගලම් වදනින්ම ආසිරි විඳිමිනේ
ස්වාගතම්! සුදුතුම් පියාණෙනි මතු දිනේ

**කළුහේ ඥාණාවාස හිමි - හිනිදුම ශ්‍රී දක්ෂිණාරාමය**

## අපගේ සසුන් පියා

සුදුසබේ සුදුතුම් පියාණනේ කිතු ආලෝකෙ ඔබයි
දහම් හඬින් මුළු ලොව පුබුදාලන
සුදුතුම් පිය සැරදේ

කරුණා බැතියෙන් අසරණවූවන් නිතර සොයා යන්නේ
සිරගතවූවන් හමුවී ඔවුන්ගේ සිත් සනසාලන්නේ
සමිඳුන් ගිය මඟ සැමදා යන්නේ ප්‍රැන්සිස් සසුන් පියා

මොළකැටි දරුවන් පවා නසාලන යුදගිනි නවතන්නට
මුළු ලොව හමුවේ හඬ නැගුවේ අපෙ අති උතුම් පියා
සුදුතුම් පියෙනී ඔබේ ළඟින් නිති දෙවි සමිඳුන් ඉන්නේ

**බ්‍රිජට් කරුණාරත්න - ජා-ඇල**




# නාසරෙත්හි ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගෙන් බලගතු සුව වීමක්

**මගේ දරුවකුට පැපොල නම් බෝවන රෝගයේ දෙවැනි වරට මතුවන "හර්පීස් සොස්ටර්" නම් ලත් රෝගය වැළඳුනි. එය ශරීරයේ කොතැනක හෝ හරි අඩකට වැළඳෙන රෝගයකි. සමහරුන්ට එය ඉතා දරුණු වේදනා හා දැවිල්ල ගෙන දෙයි. පැපොල බිබිලි වැනිම බිබිලි කුෂ්ටයක් ලෙස පිටකොන්දේ මැද සිට වටේට නාභිය දක්වා මතුවී තිබුණි.**

වේදනා නාශකයක් හැර වෙනත් බෙහෙතක් පවුලේ වෛද්‍යවරිය නොදුන්නාය. ඇය ඒ පිළිබඳ විස්තර කරමින් පැවසුවේ සමහර අය අවුරුදු ගණන් පීඩා විඳින බවයි. සාමාන්‍යයෙන් වේදනාවක් ඉවසීමෙන් දරා ගන්නා ඇයගේ කෑගැසීම හා ඇඬීම පවතිද්දී මම එදින නිකුත් වූ ඥානාර්ථ ප්‍රදීපය කියවමින් සිටියෙමි. එහි එදින තිබූ ලිපියක වූයේ ජේසු සමිඳුන්ව තම ගමවන නාසරෙත් නුවරදී පිළිනොගත් බව දැක්වෙන ශු. ලියවිල්ලේ විස්තරයයි.

මේ දරුවාගේ කෑගැසීම දරාගත නොහැකි වූ මා කිසිම සිතුවිල්ලකින් තොරව එක්වරම නැගිට පාස්කු ආසිරි පැන්වල පුළුන් ඔබා ඇයගේ කුෂ්ටය ඇති තැන "නාසරෙත්හි ජේසුතුමන්ට ස්තෝත්‍ර වේවා" යයි දිගටම කියමින් ඉතා විශ්වාසයෙන් පිස දමමින් සිටිනා විටම "පුදුමයි දෙයියනේ මට දැන් සනීපයි. කැක්කුමක් නෑ දැවිල්ලක් නෑ" කියා ඇය කෑ ගැසුවාය. ඇය සුව විය. දැවිල්ලත්, කැක්කුමත් නැත.

එදින සිට මේ අපේ අත්දැකීමයි. එනම් අපට ඕනෑම වේදනාවක් දැනෙනා විට මේ අපගේ එකම බෙහෙතයි. එනම් "නාසරෙත්හි ජේසු තුමන්ට ස්තෝත්‍ර වේවා" කියමින් වේදනා ගෙන දෙන තැන පිරිමැදීම. මම එදිනම මගේ නෑ හිතවතුන්ට දුරකථනයෙන් දැනුම් දුනිමි. මෙය ප්‍රාතිහාර්යයක් නොවන්නේ ද? ඔබත් විශ්වාසයෙන් යුතුව එසේ කරන්න.

**අයිරින් කොස්තා**
කලවිලිය - ජා-ඇල

# අනියත ජීවිතය නියත මරණය

**මෙලොව ජීවත්වන මනුෂ්‍යයන් ඇතුළු සැම ජීවි සත්වයකුටම උපත මෙන්ම මරණය අප ජීවිතයේ අස්ථිර බව පෙන්වාලන පොදු ධර්මතාවයකි. මොලය ඇතුළු ශරීරයේ සියලුම අවයවයන්ගේ ප්‍රාණය උපදානව ප්‍රහීනව යාමෙන් අනතුරුව මිනි පහන නිවී යයි. මරණය උරුම වෙයි.**

සාමාන්‍යයෙන් දීප්තිමත් තෙල් පහනක් තෙල් ඇතුළු පහන් සිල අවසානය දක්වාම සුදීපනය කර නිවී යයි.

නමුදු ඇතැම් විටක සුළඟින් ද තෙල් අහවර වීමෙන් ද - පහන් සිල පමණක් ප්‍රථම දැල්වී යාමේ සිද්ධාන්තය අනුව වාගෙම අපගේ ජීවිතයේ පරම ආයුෂ ගත කර සම්මුති වශයෙන් ද ලෙඩ - දුක් - විපත් - අනතුරු වලට ගොදුරුව අපගේ ප්‍රාණය අකාලයේ මරණයට පත් වෙනු ඇත. එම නිසා මිනිසුන්ගේ උපත සිදුවන ස්ථානය පිළිබඳව පැවසීමට හැකිමුත් මරණය සම්බන්ධව නිශ්චිතව පැවසිය නොහැක. මේ සම්බන්ධ විවිධ විශ්වාස - කතිකාවත් ජන සමාජය තුළ අන්තර්ගතව තිබෙන බව පෙනේ.

එසේම නොමැරුනු කෙනෙක් ඇති තැනක් නොමැති අතර නොමැරී ජීවත්වන අය ලෙස ඇතැමෙක් ද ජීවතුන් අතර මැරුණු අය ලෙසද අප සමාජය තුළ නැතිවා නොවේ. නමුදු මරණය කෙබඳු අවස්ථාවක වුවද සංවේදී පුහුදුන් ජනයාට එය සංවේගය දනවන්නකි.

දෙවියන් විසින් මනුෂ්‍යයාට ලබා දුන් ජීවිත ප්‍රාණය ණයකි. ශරීරය ත්‍යාගයකි. ඒ නිසා මිනිසා මෙම ණය ජීවිත කාලයට ගෙවමින් මරණය භාර ගත යුතුය. යම් ලෙසකින් උපත සමග මිනිසාට මරණය අත්පත් කර නුදුන්නේ නම් ලොවැ පැවතීම කෙසේ වේවි දැයි සිතා ගත නොහේ.

මරණයේ යථාර්ථය අවබෝධ කරගෙන අප ජීවත්වන කාලය තුළ අන්‍යයන් හා ඒකාත්මිකව යහතින් කටයුතු කරමින් දාන ධර්ම කටයුතුවල හැසිරීම සුන්දර මරණයකට හේතු පාදක වේ.

ලොව යහපත් තැනකට ගෙන ඒමට පිළිවන් වන්නේ දෙවියන්ට නොවැ මිනිසාට පමණකැයි අවධාරණය කර ගත යුතු අතර මරණය මරණයෙන් දිනාගෙන අමරණීයව ශ්‍රේෂ්ඨව ඔසවා තැබූ අය පිළිබඳව සිහිකැඳවීම මරණය සම්බන්ධ කියවීමේදි යටත් පිරිසයෙන්ම අවැසිය.

**ඒ. ඞී. සුනිල්**
හේකිත්ත

ජනතා හඬ

# ටියුෂන් කුණාටුව හා අපේ දරුවන්

**කතුතුමනි,**

මෙම ලිපිය ලියන්නට සිත විශේෂයෙන් යොමුවූයේ පසුගිය මාසවල ජාතික පුවත් පත්වල පලවූ ටියුෂන් පංති පිළිබඳ ලිපි පෙල කියවීමෙන් පසුවයි, මහරගම, නුගෙගොඩ, ගම්පහ, ගාල්ල හා මාතර ජනාකීර්ණ නගරවල දකිනා අප දරුවන්ගේ අශෝබන රඟන රැඟුම් හා විලාසිතාද ඔවුන් අඳුරේ දකිනා සේයාවන්ය. ටියුෂන් වනාහී පාසල්වල ඇතැම් සිසුන් ප්‍රචණ්ඩත්වයක් ගෙන කටයුතු කරන්නට යෙදෙන්නාවූ ප්‍රධාන ස්ථානයය.

ලාබාල සිසුවියන් සුවඳ හමනා ප්‍රේම ජවනිකා දැල්තුළට අසුවී ඇත්තේ තනි තීරණ ගනිමින් අනාගතය ගැන නොසිතමින් අදට වඩා හෙට හොඳයි සිතමින් විය යුතුය. ඉන්පසු වරදකරුන් කවුද? හඬනගන්නේ කාටද?

ටියුෂන් ක්ෂේත්‍රය අද පහන් තත්ත්වයට වැටෙමින් පවති යැයි මට හැඟේ. උපකාර පංති තුළ බොහෝ දුරට විනයක් පවති. නමුදු පංතියෙන් පිට සිදුවන්නේ අමුතු ජවනිකාවකි.

ගුරු භවතුන්ද දරුවන්ගෙන් මුදල් ලබාගෙන දරුවනට අදාළ විෂය කොටස කියා දෙති. ඇතැමුන් හදපිරි තෘප්තියකින් සිදු කරති. ඇතැමුන් මුදල් පසු පස හඹා යති.

ප්‍රධාන නගර ආසන්නයේ තිබෙන ටියුෂන් ශාලා දරුවන්ගේ කාලය ගෙවා දමන නවාතැන් බවට පත්ව ඇත. මේ ගැන සොයා බලන බලධාරින් කවුද? බලධාරින් වෙනුවට අණ දෙන නිළධාරින් හා බ්‍රෝකර්වරුන් පෙළ ගැසී ඇත්තේ මේ නිසාය.

ඔවුන්ගේ දවසේ උණුසුම් ක්‍රියාව මුදල් සොයා ගැනීමට අසරණ දරුවන් බිල්ලට දීමය. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි කර ඒවා විකුනා ගනිති. ප්‍රේමයෙන් මත් වූවන්ට සිනමාහල් කාමර වෙන්කර දෙති. අධ්‍යාපනය ලබනා වෙනුවට බිත්ති හතරක කොටුවී ප්‍රේමයේ මිහිර විඳ ගනිති. සමහර දරුවන් ඔවුන්ගේ නිරුවත් ඡායාරූප පෙන්වමින් කප්පම් ඉල්ලති. මේ සියල්ලම කරන්නේ අපේ අනාගත දරුවන් වැනසීමටම නොවේද?

දරුවන්ද මේවා අවබෝධ කරගත යුතුය. මේවාට පුරුදුවන දරුවන් පොතපතට තිත තබා මත්ලෝකයේ තමාට හිමි සිහින දනිති. සිහිනය සිහිනයක්ම බව දුටුවිට තම ජීවිතය අගාධයට වැටි හමාරය.

දෙමව්පියන් මහන්සියෙන් සොයා දෙන මුදල් මෙම දූෂන රැල්ලට පූජා කිරීමෙන් ඔබ බලාපොරොත්තු වන්නේ කුමක්ද? වරද ඔබේය. ඔබේ ජීවිත ගමන තෝරා ගන්නට නොහැකි වීමද එක්තරා දුර්වල නාමයකි.

ටියුෂන් වනාහි දරුවන්ට යහපත් අන්දමට අධ්‍යාපනය ලබන්නට කඩඉම් විභාග සමත් වන්නට ලබා දෙන්නාවූ පෞද්ගලික අධ්‍යාපන රටාවන් වන බවත් අදාල දේ පමණක් ලබාගෙන හොඳින් සිප් සතර හැදෑරීමට දරුවන් සිතට ගත යුතුය.

එමෙන්ම ඉගෙන ගන්නා දරුවන් වැරදි මාවත් වල යොමු නොකිරීමට වැඩිහිටියන්ද සමාජයේ අනෙකුත් අයද සිතට ගත යුතුය. මන්ද දරුවන්ගේ ආදර්ශය වැඩිහිටියන්ම වන බැවිනි.

**ආර්. ජෝශප් ප්‍රිය**
කොටිකාවත්ත

# මේ ස්තූතිය සැදෑහැවත් අපට අවශ්‍ය නැත

**කතුතුමනි,**

අප දේවස්ථාන වාර්ෂික මංගල්‍යය පූජාවන්හි සභා එඩේරුන්ගේ අවධානය යොමුවිය යුතු ස්ථානයක් මෙලෙස නිහතමානිව ගෙනහැර දැක්වීමට කැමැත්තෙමි. මම පසුගිය දිනෙක දේවස්ථානයක වාර්ෂික මංගල්‍යය සඳහා සහභාගි වූයෙමි.

හැම දෙයක්ම පාහේ හොඳින් සංවිධානය වී තිබූ නිසා බැතිබරව පූජා යාගයට සහභාගිවීමට හැකිවිය. මංගල පූජාවේ මුලසුන හෙබවූ පියතුමා හොඳින් සූදානම් ව හරබර බැතිබර කාලෝචිත දේශනයක් ඉදිරිපත් කළේය.

මංගල්‍යය පූජාව ආරම්භයේ සිට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බෙදාදීම සඳහා පැය එකහමාරක පමණ කාලයක් ගතවිය. ඊලඟට පැමිණියේ මීසම් සේවක පියතුමාගේ ස්තුති කථාවය. ඒ සඳහා ගතවූ කාලය විනාඩි තිස්පහකි. එහි වූ දීර්ඝ නාමාවලිය ඒකාකාරි මෙන්ම, පූජාසනයේ සිට කළ යුතු ප්‍රකාශයක් නොවන බව මගේ පුද්ගලික හැඟීමයි.

දේවස්ථානයක වාර්ෂික මංගල්‍යය මීසම් ජනතාවගේ සහභාගිත්වයෙන් සහ සහයෝගයෙන් සිදුවිය යුත්තකි. ඒ කටයුතු සඳහා දායකවීම ඔවුන්ගේ යුතුකමයි. හැම මීසම් වැසියකුම මංගල්‍ය සඳහා ශ්‍රමයෙන්, මුදලින් හා යැදුමෙන් දායක වී ඇත. ඒ අතරින් කිහිපදෙනෙකුගේ පමණක් නම් කියමින් දීර්ඝ ස්තුති කථාවක් මේ පූජනීය මොහොතට කිසිසේත් ඔබින්නේ නැත. එයටත් වඩා ඒ සඳහා ගත වන කාලය කෙසේවත් සාධාරණීයකරණය කළ නොහැකිය.

සැදැහැවතුන්ගෙන් බොහොම දෙනෙක් ස්තුති කථාව ආරම්භවීමත් සමගම හෙමින් සීරුවේ දේවස්ථානයෙන් නැගිට යති.

ශබ්ද විකාශන යන්ත්‍ර, විදුලි ජනක යන්ත්‍ර සැපයූ ව්‍යාපාරික මහතුන්ටද පියතුමා ස්තුති කළේය. පසුව දැනගන්නට ලැබුණේ ඔවුන් ඒවා සැපයුවේ නොමිලයේ නොව අදාළ ගාස්තු අය කිරීමෙන් පසුව බවය. සංක්‍රිස්තියන් මහතාට හා කෝකි මහතාටද ස්තුති කළේය.

ඔවුන් දෙදෙනාම තමන්ගේ රැකියාව සඳහා වේතනයක් ලබන්නෝ වෙති. එමනිසා මංගල්‍ය පූජාවන්හිදි අනවශ්‍ය කාලයක් ගෙන. වැල්වටාරම් සහිත ස්තුති කථා පිළිබඳ යම්කිසි විධිමත් ක්‍රමයක් හඳුන්වා දීමෙන්, මංගල්‍ය පූජාවන්හි පූජනීයත්වය හා භක්තිය රැකගැනීමට හැකිවේවිය යන්න මගේ හැඟීමයි.

**බෙන් සේනානායක**
කොළඹ

# කතෝලික දහම් ගුරු අනාගත සිහින

**කතුතුමනි,**

සැප්තැම්බර් මස 07 දින ඥානාර්ථ ප්‍රදීපයේ 'ජනතා හඬ' තීරයේ පලවන ලද 'කතෝලික දහම් ගුරුවරුන්ගේ අනාගත සිහිනය' යන ලිපිය හා බැඳේ පලව තිබූ මෙම ලිපිය හා බැඳී පැවති තවත් ලිපි දෙකක් සඳහන් වී ඇත. 'කතෝලික දහම් ගුරුවරුනට රජයේ ගුරු සහයක තනතුරු ලබා දෙන්න' / 'කතෝලික දහම් ගුරුවරුනට රාජ්‍ය සේවය අකැපද?' තවද, මේ හා සම්බන්ධ කිසිදු පිළිතුරක් කතෝලික සභාවෙන් හෝ රජයෙන් ඉදිරිපත් නොවීම දහම් ගුරුවරුන්ගේ කනස්සල්ලට හේතු වී ඇති බව ද ඉස්මතු වන කරුනකි. මීට සාපේක්ෂව බෞද්ධ භික්ෂුන් වහන්සේ නමකගේ ධෛර්යය සහ කැපවීම නිසා බෞද්ධ දහම් ගුරුවරුන්ගේ ප්‍රශ්නය විසඳා ගැනීමට හැකි වූ බව ද සඳහන් වේ.

මෙම ලිපිය ඔස්සේ ඉදිරිපත් වී ඇති සෑම දෙයක්ම වාගේ ජාතික ධර්මෝපදේශ අපෝස්තලික සේවාව සහ කතෝලික අධ්‍යාපන ක්ෂේත්‍රය හා ඍජු ලෙස සම්බන්ධව පවතින බව නොරහසකි.

මේ සම්බන්ධව කතිකා කිරීමේ දී අප අවධානයට නතු විය යුතු කරුණු දෙකක් ඇත. දහම් ගුරු භූමිකාව, දහම් ගුරු භූමිකාව සහ සම්බන්ධවන රැකියා අවස්ථාව. 'දහම් ගුරු භූමිකාව' මනාව අවබෝධ කර ගන්නට උත්සුක වන යම් කෙනෙක් වේ ද, ඔහු / ඇය එහි පරමාර්ථය,



'සිහිනය ලෙස රජයේ ගුරු පත්වීම් උදාකර ගැනීම' යන අරමුණින් මුළුමනින්ම බැහැරව කටයුතු කරයි. මන්ද දහම් ගුරු භූමිකාව තුළ නියැලෙන සෑම කෙනෙකුගේම ඒකායන අරමුණ විය යුත්තේ දූ දරුවන්ගේ ජීවිත කිතුනු ආධ්‍යාත්මිකත්වයෙන් පෝෂණය කිරීම වේ. දහම් පාසල යනු එම ආධ්‍යාත්මිකත්වයේ තෝතැන්නයි. දරුවන්ගේ ජීවිත කුඩා කල සිටම ක්‍රිස්තු ප්‍රතිපත්ති / සාරධර්ම වලින් සන්නද්ධ කිරීමේ වගකීමෙන් දහම් ගුරුවරයා / ගුරුවරිය බැඳී සිටී. මෙලෙස ආධ්‍යාත්මිකත්වයේ නායකත්වය හොබවනු ලබයි. මෙලෙස දරුවනට ආධ්‍යාත්මිකත්වයේ නායකත්වය ලබාදීමට නම් ඔවුන්ද කිතු තුමන් තුළ පතාක යෝධයන් විය යුතුය.

දහම් ගුරු සේවයේ නියැලෙන සෑම කෙනෙකුම දෙවියන් වහන්සේගේ කැඳවීමක් උරුම කරගෙන ඇත. මෙය ඔවුනට දායාද වී ඇති දෙවන කැඳවීමකි. එබැවින් මෙය කිසිසේත්ම ස්වෙච්චා සේවයක් නොවන බවද මෙහිදි සඳහන් කිරීම උචිතය. අප අවධානය යොමු විය යුතු ඊලඟ කරුණ නම් දහම් ගුරු භූමිකාව සහ සම්බන්ධ රැකියා අවස්ථාවන්ය. මෙය 'රජයේ ගුරු පත්වීමක් විය යුතු' යන්න පලවූ ලිපිය පුරාවට විහිදී පවතියි. සමස්තයක් ලෙස මෙම ලිපිය මෙන්ම මේ හා බැඳුනු සෑම ලිපියක්ම ඉස්මතු කරනුයේ රජයේ ගුරු පත්වීම් පිළිබඳ වීම පැහැදිලිය. දහම් ගුරුභවතුනට රජයේ ගුරු පත්වීමක් ලබා දීමේ අවංක ප්‍රයත්නයක ජාතික ධර්මෝපදේශ අපෝස්තලික සේවාව සහ ජාතික කතෝලික අධ්‍යාපන ක්ෂෙත්‍රය දැනටමත් නියැලෙන බව වගකීමෙන් සඳහන් කිරීමට කැමැත්තෙමි. මෙහිදි අප සිත්හි තබාගත යුතු තවත් කරුණක් නම්, මෙම බෞද්ධ රටේ බොදුනුවන්ට හිමි වන සෑම අයිතිවාසිකමක්ම එලෙසින්ම, එම ප්‍රතිශත අනුවම කිතුනු අපට නොලැබෙන බව මධ්‍යස්ථව සිතන ඕනෑම කෙනෙකුට අවබෝධ වන කරුණකි.

මෙලෙස සඳහන් කරනුයේ දහම් ගුරුභවතුන්ව අධෛර්යයට පත් කිරීමට නොව, සත්‍ය දේ අවබෝධකිරීමේ චේතනාව මතය.

**ගරු ඉන්ද්‍ර රත්නසිරි ප්‍රනාන්දු පියතුමා**
මීසම් සේවක
නිට්ටඹුව

# කම්කරු ප්‍රඥප්තිය හැමදා කුණු කූඩයේද?

**කතුතුමනි,**

මෑතක සිට සාකච්ඡාවට බඳුන් වී ඇති 'සේවක අර්ථ සාධක' අරමුදල පිළිබඳව අපගේ අදහස් ද ඉදිරිපත් කිරීම කාලෝචිත යැයි හඟිමු.

දිවංගත අග්‍රාමාත්‍ය එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක සිරිමතාණන් සමග සමීප මිතු දමින් බැඳී වැඩසිටි ගරු පීටර් ඒ පිල්ලේ පියතුමන්ගේ (කතෝලික සමාජ සාම ව්‍යාපාරයේ නිර්මාතෘ) අදහසකට අනුව, පෞද්ගලික අංශයේ සේවක මහත්ම, මහත්මීන්ටද, රාජ්‍ය අංශයේ සේවක සැමට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමයක් සඳහාවූ සේවක අර්ථසාධක අරමුදල ගරු එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක සිරිමතාණන් විසින් ස්ථාපිත කරන ලද බව ප්‍රකට කරුණකි.

ඒ සඳහා ක්‍රි. ව. 1953 නොවැම්බර් 25 දා පැවති පාර්ලිමේන්තු රැස්වීමේදී එම යෝජනාව ඉදිරිපත් කරන ලද්දේ, 'කතෝලික සමාජ සාම ව්‍යාපාරයේ' ප්‍රබල සමාජිකයකු වූද, තලවාකැලේ පාර්ලිමේන්තු මන්ත්‍රී තුමා ද වූ, ගරු එච්. ඊ. පී. ද මැල් මහත්මාය. එම යෝජනාව සම්මතව 1958 සිට ක්‍රියාත්මක කරන ලද්දේ, ශ්‍රීමත් බණ්ඩාරනායක මැතිඳුන්ගේ රජයෙනි. ඒ වන විටද, එච්. ඊ. පී ද මැල් මහතා තමාගේම කර්මාන්ත ශාලා සහ වතුවල සේවකයන් සඳහා 1947 දී අර්ථ සාධක අරමුදලක්, තම ආයතන තුළම ආරම්භකර තිබිණ.

රාජ්‍ය අංශයේ අයට මෙන්ම, විශ්‍රාම යන විටම ගෙවනු ලබන පාරිතෝෂිත මුදලක්ද, අනතුරුව මාස්පතා විශ්‍රාම වැටුපක් ගෙවීමද. එතුමාණන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යෝජනාවේ අරමුණ වී ඇත. එම අරමුණින්ම, ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ සංකල්පයක් අනුව එතුමා කම්කරු අමාත්‍ය ධූරය දැරූ කාලයේ බිහිකළ 'කම්කරු ප්‍රඥප්තිය' ඉදිරියට ගෙන, පෞද්ගලික සේවක, විශ්‍රාම වැටුපක් ආරම්භ කිරීම, තවමත් ජීවතුන් අතර සිටින සේවක අර්ථසාධක අරමුදලේද සේවා නියුක්තිකයන්ගේ අරමුදලේද, සමාජික සැමගෙන් මතුවට විශ්‍රාම යෑමට සිටින්නන් සැමගේද, ප්‍රණාමයත් ආශිර්වාදයත්, අතිගරු මහින්ද රාජපක්ෂ උතුමාණන් ඇතුළු ඒ සඳහා වැයවෙන සැමටත් පතමු.

අඟහිඟ කමින් පෙළෙන, ආරම්භක සමාජික (ජීවතුන් අතර සිටින) භවතුන් හටද එම ශිෂ්‍යත්ව ලැබුන හොත්, ඒ අයටද, රාජ්‍ය අංශයේ අයට මෙන්ම බෙහෙත් ටිකක් ගැනීමටද, තම අවශ්‍යතා සඳහා අන් අයට අත නොපා ජීවිතයේ අවසන් කාලය ගත කිරීමටද හැකිවනවා ඇත.

මේ සඳහා ප්‍රතිපාදන සැපයීම සඳහා ඇතිවාටත් වඩා, මුදල් සම්භාරයක් 'අර්ථ සාධක අරමුදලේ' සහ 'සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සතුව ඇති බවද, එම මුදල දිනෙන් දින වැඩි වනවා මිස අඩුවීමක් නොවන බවද සඳහන් කරනු කැමැත්තෙමු. මේ සඳහා 1958 සිටම ගොඩගැසෙන මුදල් සම්භාරය ප්‍රමාණවත් වනවාද ඇත.

ලොව දරුණුතම ත්‍රස්තවාදියා මෙල්ල කර, ක්‍රමයෙන් ජනතාවට ආර්ථික සහනද සලසමින් රටත් සංවර්ධනය කරන අතිගරු ජනාධිපති තුමනි, ඔබතුමාගේ කාරුණික අවධානය මේ සඳහා යොමු වේවායි පතමු.

**රෙජිනෝල්ඩ් සොයිසා**
රාගම



# පවුල හා පැවිදි වසර වෙනුවෙන්

## පවුල් දිවිය ශුද්ධවත් කිරීමේ කැඳවීමට ප්‍රතිචාර දැක්වීම. “ඔවුන් හට ජීව

**දයාබර සහෝදරවරුනී, සහෝදරියනී,**

මිනිස් සංහතියේ ගැලවීම උදෙසා දෙවිඳුන්ගේ සැලැස්ම තුළ පවුලේ ක්‍රියාදාමය අරබයා දෙවන වතිකාන කතිකාවෙහි “නූතන ලෝකය තුළ ශුද්ධවූ සභාව” (Gaudium et Spes) යන වේද සත්‍යය ව්‍යවස්ථාවෙහි මෙලෙස සඳහනක් වේ.

“විවාහය නැමැති මේ සක්‍රමේන්තුවේ අනුහසින් සහකාර - සහකාරියන් වශයෙන් එකිනෙකාගේ වෛවාහික හා පවුල් ණය යුක්තීන් පූර්ණත්වයක් කරා ගෙන යද්දී, ක්‍රිස්තුන් වහන්සේගේ ජීවන ශක්තිය අත්විඳිමින් ඔවුන් ජීවිත උද්දීපනයක් කරා පැමිණෙති. මේ ජීවන ශක්තිය ඔවුන්ගේ මුළු මහත් ජීවිත කාලයම විශ්වාසයෙන් බලාපොරොත්තුවෙන් හා දයා සේවාවෙන් සුපොහොසත් කරයි. එලෙසම පූර්ණත්වය වෙත ඔවුනොවුන්ගේ වර්ධනයේ ගමන කඩිනම් වන අතරම අන්‍යෝන්‍ය පාරිශුද්ධත්වයට ද ඔවුන් ළං කරනු ලබති. එනයින් දෙවිඳුන්ගේ මහිමතාවය පතළ කිරීමට ද ඔවුන් එකට එක්ව දායකත්වයක් ලබා දෙති. (G. S. 48). මේ දැක්මට අනුව පවුල් දිවියේ ශුද්ධවූ සභාවේ ධර්මදූත කාර්යය තුළ කේන්ද්‍රය බවට පත් වන බව පැහැදිලිය. එහිදී පවුල් දිවිය අන්‍යෝන්‍ය වශයෙන් සහකරුවන් තුළ ආදරය වැඩි වර්ධනය කරන අතරම, පවුල් කුටුම්භය තුළ, ස්වාමි පුරුෂයන් හා භාර්යාවන් තුළ මෙන්ම දරුවන් අතර ද දෙවිඳු ආදරයට සාක්ෂි දැරීමක් සිදුවේ. ඒ අනුව බල ගැන්වෙන ආදරය සැබවින්ම වෛරයේ හා මමත්වයේ ලෝකය වෙනස් කරමින් වීර්යත්වයෙන් හා ඇඩි සන්තෘෂ්ටියෙන් එකිනෙකාගේ ජීවිත ශුද්ධත්වයට පත් කරමින් කල් ගෙවන්නට ඔවුනට හැකිවේ. වතිකාන කතිකාව තවදුරටත් සඳහන් කරන්නේ “විවාහ දිවියේ කර්තෘත්වය දෙවියන් වහන්සේගේම” වන බවයි. එලෙසම දේව ආදරයට සාක්ෂි දරමින් ලෝකය පාපයෙන් ගලවා ගැනීමට ද ශුභවාදී ලෙස පරිවර්තනය කරමින් පාරිශුද්ධවත් කරන්නට ද කතෝලික සභාව සතු වගකීමට මේ අනුව යහපත් පවුල් දිවිය ඉතා ඉහළින් සම්බන්ධ වන බව ද පැහැදිලිය. මේ අනුව පවුල ශුද්ධවූ සභා ක්‍රියාකාරිත්වය තුළ ඉතාම කුඩා ඒකකයයි. හැඳින්විය හැක. එය ගෘහස්ත සභාවයි. දෛනිකව දෙවිඳුන්ගේ ආදරය කුළු ගන්වන අත්දැකීමේ තෝතැන්නයි. නිහතමානිත්වයෙන් ශුද්ධවූ සභා මාතාවගේ ක්‍රියාකාරිත්වය ජීවගන්වන ජීව පැවැත්මයි. “මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න.” (ජුවාම් 13:34) යන සමිඳු වදන පවුල තමන්ටම ආවේණික කාර්යභාරයක් ලෙස පවරා ගන්නේ ආදරය තමන් අතර ජනිත කරවීමේ කෘත්‍යය තුළින් වන අතර යථා බාහිරත්වය තුළ මමත්වයට, දූෂිත තත්ත්වයට, පාපයට හා මරණයට පිටු පා විහිදී යන ආදරයකින් සමාජය වෙනස් කරන්නට පවුල සිය දායකත්වය සුවිසල්ව ලබා දෙයි. “ආදරය සුරකිමින්, අනාවරණය කරමින් හා සන්නිවේදනය කරමින් පවුල සිය කාර්යභාරය සපුරාලිය යුතු අතර එය මනුෂ්‍යත්වය වෙත දෙවියන් වහන්සේ ලබා දුන් ආදරය සිතුවිල්ලෙන් ශක්තිමත් කර සැබෑ ලෙස බෙදා ගැනීමේ කාර්යයට හවුල් වීමකි. මේ නිසාම සභාව නමැති සිය මනාලියට ක්‍රිස්තුන් වහන්සේ දක්වන ආදරයට ද එයින් සාක්ෂ්‍ය දරනු ලබයි.” (FC 17) මෙසේ පවසන්නේ සා. දෙවන ජුවාම් පාවුළු මුනිතුමායි.

මේ අනුව පවුල් ජීවිතය සහ ආදරය කිරීමට ඇති කැඳවීම සභාවේ ප්‍රමුඛතාවයන් වේ. භාග්‍යවන්ත හයවන පාවුළු සුදුතුම් පියතුමන් සඳහන් කළ ආකාරයට “පවුල, සභාව මෙන්, ශුභාරංචිය හඳුන්වා දෙන ස්ථානය පමණක් නොව එය තුළින් ශුභාරංචිය බැබළවිය යුතු ස්ථානය ද වේ. මෙම දූත කාර්යය ගැන අවදියෙන් සිටින පවුල තුළ සියලුම සාමාජිකයන් ශුභාරංචිය පතුරුවනවා පමණක් නොව ශුභාරංචිය තම ජීවිත පරිවර්තනය කිරීමට ද ඉඩ දෙති. දෙමාපියන් තම දරුවනට ශුභාරංචිය සන්නිවේදනය කරනවා පමණක් නොව, තම දරුවන් ඒ අනුව ජීවත් වීම තුළින් එම ශුභාරංචියම දරුවන්ගෙන්ද තමන්ට ලබා ගන්නට යොමු වේ. එවැනි පවුලක් අනෙක් පවුල් වලට සහ තම අසල්වාසීන්ට ශුභාරංචිය හඳුන්වා දෙන්නෙක් බවට නිතැතින්ම පත් වේ.” (Evangeli Nuntiandi 71)



පවුල් ජීවිතය අලුත් කිරීමේ වැදගත්කම සහ ශුද්ධවන්තභාවයේ කැඳවීමට නැවුම් ආකාරයෙන් කැපවීම අපේ කාලයෙහි අතිශයින්ම වැදගත් වන්නේ මෙම දිව්‍යමය සමාජ ඒකකයට සෑම ආකාරයකම තර්ජනයන් එකතු වෙමින් පවතින නිසාය. ලෞකිකත්වය, පරිභෝජන වාදය හා ඊටම ආවේණික ලෞකික වටිනාකම් ඇති විවෘත ආර්ථික ක්‍රමය සහ තම ඉරණම සහ ජීවිතය ගැන තීරණයක් ගැනීම ගැන තනි පුද්ගල නිදහස පිළිබඳ වැරදි අර්ථකථනයන් වැඩිවීම, පවුල් දිවියට සම්බන්ධ සදාචාරමය සහ ආධ්‍යාත්මික වටිනාකම් බිඳ දැමීමට ඇති නිදහස “මානව හිමිකමක්” අර්ථ කථනය කිරීම යනාදිය නිසා, පවුල් දිවියේ ස්ථාවරභාවය දරුණු විදියට අනතුරකට භාජනය කර ඇත.

තාක්ෂණික ලෙස දියුණු සමාජවල නැවුම් සංකල්පය වූ යුවල් විවාහ නොවී එකට ජීවත් වීම, අත්අදහා බලන විවාහයන්, ළමා මව්වරුන්, සමලිංගික විවාහයන්, වෙන්වීම සඳහා පහසුකම් තව තවත් සැපයීම, දික්කසාද, දෙවන සහ තුන්වන විවාහ යනාදිය නිසා ශක්තිමත් සමාජයක නිශ්චිත පදනම කඩා වැටෙමින් පවතී. ගබ්සාව, කෘතිම උපත් පාලන ක්‍රම භාවිත කිරීම, උපත් පාලන කොපු (කොන්ඩම්), ආදේශක මව්වරු සහ මවගේ ශරීරයෙන් පිටත සිදුකරනු ලබන පිළිසිඳ ගැනීම් යනාදිය නිසා පවුල් ජීවිතය ආදරය සහ දෙවියන් වහන්සේ කෙරෙහි ඇති ග ැඹුරු ඇදහිල්ල මත පදනම් වූ සමාජයක මූලාශ්‍රය සහ පදනම නොවී ආත්මාර්ථකාමිත්වය පැතිර වීමේ මූලාශ්‍රය බවට පත් වී ඇත. ඊට අමතරව ඉහත කරුණු පවුල් ජීවිතය යාන්ත්‍රික කිරීමට සහ කඩා බිඳ දැමීමට ද හේතු වී ඇත. වෙළෙඳ පොළ බෙදා දෙන දේවල් පරිභෝජනය කරන කුඩා ඒකක බවට පවුල් පත් වී ඇත. පුද්ගල අයිතීන්, පෞද්ගලිකත්වය සහ නිදහස සීමාව ඉක්මවා ගිය ආකාරයෙන් අර්ථකථනය කිරීම නිසා පවුල ස්වභාවයෙන්ම නිරූපණය කරන සාංඝික ජීවය බිඳ වැටී ඇත. සැඟවුණු නමුත් අව්‍යාජ සැලැස්මක් පවුල උදෙසා දෙවියන් වහන්සේ සතුව ඇති බව පවුල් බොහෝ විට තේරුම් ගන්නේ නැත.

එය සභාවට සෑම කාලයකම දැනුණු විශේෂයෙන් වර්තමානයේ ඉතා තියුණු ලෙස දැනෙන අභියෝගයකි. ඉහත කරුණු ජීවිතයට සහ එහි පරමාර්ථයේ ඉලක්ක වලට ඉතා බරපතල තර්ජනයක් ද වී ඇත. “සදහම්කරණ පසුබිම තුළ පවුල මුහුණ පාන එඬේරික අභියෝග” යන තේමාව යටතේ පවුල සම්බන්ධයෙන් විශේෂ ජගත් සැසිවාරයක් ශුද්ධෝත්තම පියාණන් වන අති උතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණන් විසින් කැඳවා ඇත්තේ මේ හේතුව නිසා විය හැකිය.

සමස්තයක් වශයෙන් ගත් කල අපගේ රට තුළ ජනතාව තම අනාගත ජීවිත ගොඩනැගීම සඳහා අනුගමනය කරන මාර්ගය පවුල් ජීවිතය වුවත්, ලෞකිකකරණය, විවෘත ආර්ථිකය, මිනිස් චින්තනය අවුල් කරන ගෝලීය බලපෑම් සමාජ මාධ්‍ය හරහා ගොඩනැගී ඇති නිදහස පිළිබඳ නවතම සංකල්ප නිසා පවුල් ජීවිතයට පවතින තර්ජන අධික වෙමින් තිබේ. විශේෂ කොට ස්වභාවයෙන්ම සහ ප්‍රමුඛ ලෙස නාගරික සහ අර්ධ නාගරික වන අපගේ අගරදගුරු පදවියේ මෙන්ම නාගරික ප්‍රදේශවල ද මෙය වඩා පැහැදිලිව දැක ගත හැකිය.

මෙම තත්ත්වයේ එක් භයානක ප්‍රතිඵලයක් නම් දික්කසාද වීමට හෝ විවාහ අහෝසි කිරීමට සොයන කතෝලිකයින්ගේ ප්‍රමාණය වැඩිවීමයි. එය ඇත්තටම වික්ෂිප්ත භාවයට හේතුවකි. කාලෝචිත උදව් සහ මඟ පෙන්වීම් ලබා දුන්නේ නම්, මෙම පවුල් එවැනි ඉරණමකින් බේරා ගත හැකිව තිබූ බව එකී සිදුවීම් බොහෝමයකින්ම පෙනී ගිය කරුණකි. අපගේ පවුල් සඳහා ලබා දිය යුතු හරියාකාර එඬේරික සේවාවන්වල වගකීම ගැන, රදගුරුතුමන් සහ මීසම් සේවයේ යෙදී සිටින පියතුමන් වශයෙන් කටයුතු කරන එඬේරුන් වන අපට අපගේ හෘද සාක්ෂ්‍ය බරපතල ලෙස පරික්ෂා කර බැලීමට මෙම තත්ත්වය ආරාධනා කරයි. බොහෝ සංවිධාන සහ පවුල් සේවාවන් ඉටු කරන වැඩසටහන් අතීතයේ දී දියත් කර ඇතත් අපගේ මුළු හදවතින්ම සහ ඇතුළාන්තයෙන්ම මේවා සඳහා ඇප කැප වී ඇත්දැයි අප විසින් අපගෙන්ම ඇසිය යුතුව ඇත. එසේත් නැතිනම් එම ප්‍රයත්නයන් හදවතක් සහ ආත්මයක් නැතිව වැඩි දියුණු කරන ලද හුදු ව්‍යූහගත පිළිතුරක් පමණක් වූයේ දැයි අපගෙන්ම විමසා බැලිය යුතුව ඇත.

මේ තත්ත්වයේ තවත් එක් බැරෑරුම් පැතිකඩයක් නම් ශීඝ්‍ර ලෙස පූජක හා පැවිදි ජීවිත උදෙසා ඇරියුම් ලබන්නන්ගේ සංඛ්‍යාව පහත වැටීමයි. සමහර නාගරික ප්‍රදේශ ආශ්‍රයෙන් කිසිදු අයුරකින් පූජක හෝ පැවිදි කැඳවීමක් දක්නට නොලැබේ. මේ තත්ත්වය වඩාත් උද්ගතව පවතින්නේ වනිතා දේව කැඳවීම් මුල්කොටගෙන යි. මේ තත්ත්වය අපගේ පැවිදි නිකායන් මූලික කොට උග්‍රව පවතී. ලෞකික ප්‍රවනතාවයන් වෙනුවෙන් ම ගිජුව ඇදී යාම නිසා සමහර අප පවුල් පරිසරයන් දේව කැඳවීම හා බැඳුනු උත්තේජනයක් එකී පරිසරයන් තුළින් නොසපයන අතර පොදුවේ ආගමිකත්වයෙන් “පවුල” දුරස්ථ වී ඇති හැඩක් ද පෙනේ. බිඳුනු පවුල් රටාවන් මෙකී ඇරියුම් ජීවිතය අවම කරන්නට ද තුඩු දී ඇති බවක් සමහර තැන්හිදි පැහැදිලියි.

අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් විසින් ලොව පුරා පැතිර යන නව ප්‍රවනතා හමුවේ “ආලේපකළ ජීවිත” එනම් විශේෂ ලෙස දේව සේවයට කැප වූ ජීවිත තේමා කරගෙන විශ්වීය වසරක් 2014 නොවැම්බර් 30 වැනි දා සිට 2016 පෙබරවාරි 2 දක්වා ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත.

ඒ නිසා කොළඹ අගරදගුරු පදවිය, ස්වකීය කතෝලික පවුල් ප්‍රේමය, සාංඝිකත්වය සහ පාරිශුද්ධත්වයට ලද දේව කැඳවීමට පුබුදුවාලීමේ හදිසි අවශ්‍යතාවය තේරුම් ගනිමින් ස්වකීය කැපවීම් තුළ සක්‍රමේන්තුමය ජීවිත ගතකිරීම සඳහා යළි ගොඩනැගීමටත්, ඔවුනොවුන් දේව කැඳවීම් පාසල් බවට පත් කරමින්, දෙවියන් වහන්සේට සිය දරුවන් කැප කරන්නට නොමසුරු වන පවුල් බවට පත් කරන්නටත් මීළඟ ජනවන්දනා වර්ෂය ආරම්භ වන ආගමන සමයේ පළමුවන ඉරිදා වන 2014

# නිකුත් කැරෙන අනුශාසනා පත්‍රය

## ්නය ලැබෙන පිණිසය. සපුරාම එය ලැබෙන පිණිසය." (ශු. ජොහාන් 10:10)

නොවැම්බර් 30 වැනි දා සිට 2016 පෙබරවාරි 2 වැනිදායින් අවසන් වන සේ අපගේ ශ්‍රේෂ්ඨ එඬේරාණන් වන සසුන් පියාණන් විසින් මේ වසර කැප කරන ලද තේමාව එනම්"**ආලේප කළ අපගේ ජීවිතය;** පවුල් දිවිය ශුද්ධවත් කිරීමේ කැඳවීමට ප්‍රතිචාර දැක්වීම - ඔවුන් හට ජීවනය ලැබෙන පිණිසය. සපුරාම එය ලැබෙන පිණිසය." (ජොහාන් 10:10) යන්න අනුව මේ ඉදිරි කාලය විශේෂ වසරක් ලෙස ගත කරන්නට තීරණය කර ඇත.

එබැවින් විශ්වීය එඬේරාණන්ගේ මේ කැඳවීමට අනුව අගරදගුරු වසමේ දේශීය සභාව පවුල් පුබුදුවක් සඳහා විශේෂ ලෙස කැප වන්නීය. මෙය අතිශයින් වැදගත් සහ අත්‍යවශ්‍ය දෙයක් ලෙස මම දකිමි.

මේ විශේෂ වසරේ මූලික වැඩසටහන් සම්බන්ධීකරණය සිදුවන්නේ අගරදගුරු පදවි පවුල් අපෝස්තලික සේවාව මෙහෙයවන ගරු ක්ලෝඩ් නෝනිස් පියතුමන් සහ එතුමන්ගේ සහයක කණ්ඩායමද සමඟ අගරදගුරු පදවි පැවිදි කොමිසමේ මූලිකත්වය දරන අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන් ඇතුළු පැවිදි හමුව විසිනි. එලෙසම මේ පවුල් වසර සංවිධාන කිරීමේ විශේෂ කමිටුවේ නායකත්වය අගරදගුරු හිමිපාණන් විසින්ම උසුලනු ලබන අතර වසර පුරා විවිධ වැඩසටහන් සම්පාදනය කරන්නට කටයුතු කැරෙනු ඇත. මෙයද 2010 වසරේ අපි ඇරැඹූ දිව්‍ය සත්ප්‍රසාද දශකයේ එක් තේමාවක් වනු ඇත. පවුල් ජීවිතය නියත වශයෙන්ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ හා බද්ධ වන අතර දිව්‍ය සත්ප්‍රසාදයීය සක්‍රමේන්තුව මිනිසියාව සහ දෙවියන් වහන්සේ අතරත්, උන්වහන්සේ තුළ සාංඝිකත්වයට ඇරයුම් ලබන සියල්ලන් අතරත් ඒකත්වය ඇති කරවන දේව බලයේ උල්පතයි.

මේ විශේෂ වසරේ සංවිධානය කරනු ලබන වැඩසටහන් අතරට පහත සඳහන් දෑ ද අපි යෝජනා කරමු.

1. මේ විශේෂ වසරේ සමාරම්භක උලෙළ පදවි සහ මීසම් මට්ටමින් නොවැම්බර් 29 සෙනසුරාදා (සන්ධ්‍යාවේ) හෝ නොවැම්බර් 30 ඉරිදා පැවැත්විය හැකිය.
   - පදවි සමාරම්භක උලෙළ සා. ලුසියා ආසන දෙව්මැඳුරේදී නොවැ. 30 වැනිදා අගරදගුරු හිමිපාණන් හා සහයක රදගුරු හිමිපාණන්ගේ සහභාගිත්වයෙන් සිදු කැරේ.
   - මේ අවස්ථාව සඳහා ජනවන්දනාව බයිබල් මෙහෙයක් සමඟ දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය තුළින් සමන්විත වන අතර ඊට අදාළ කටයුතු පැවිදි ශ්‍රේෂ්ඨ නායක සමුළුව හා අගරදගුරු පදවි ජනවන්දනා කාර්යාලය එක් වී සකස් කර අගරදගුරු පදවියේ සියළු මීසම් හා ආයතන වෙත බෙදා දෙනු ඇත.

2. සියලුම කතෝලික පවුල් පුබුදුවාලීමට සහ පූජක සහ පැවිදි දේව කැඳවීම් ලබා දීමට සමත් වූ පවුල් වලට ලබා දුන් දේව වරප්‍රසාද උදෙසා දෙවියන් වහන්සේට තුති පිදීමට යැදුම් පත්‍රිකාවක් හා විශේෂ යැදුමක් සම්පාදනය කරනු ලබන අතර සියළුම ජනවන්දනා මෙහෙයන්හිදී මේ යැදුම උච්චාරණය කරන ලෙස ඉල්ලා සිටිමු.

3. මේ වසර උදෙසා විශේෂ ලාංඡනයක් නිර්මාණය කරන අතර එය යෙදූ බැනර් මීසම් දෙව්මැඳුරු සහ සෙසු ආයතන සඳහා භාවිතයට ගැනීමට හැකිය.

4. අගරදගුරු වසමේ සියලුම මීසම්වල පවුල් දිවිය වෙනුවෙන් විශේෂ දිනයක් සංවිධානය කිරීමට පවුල් අපෝස්තලික සේවා සම්බන්ධීකාරකවරයාගේ සහය ලැබෙන අතර ඒ සඳහා යෝජනා එතුමන් විසින් එවනු ලබනු ඇත. ඒවා ක්‍රියාත්මක කරන අන්දම ගැන ද උපදෙස් එතුමන් විසින් ලබා දෙනු ඇත.

5. 2014 දෙසැම්බර් 28 වැනි ඉරිදාට යෙදෙන මීළඟ ශුද්ධවු පවුලේ මංගල්‍යය අගරදගුරු වසමේ සෑම මීසමකම පොදු පවුල් මංගල්‍යයක් ලෙස සැමරේ. අපගේ පවුල් උදෙසා යැදුම් පුද කිරීමටත් පවුල් දිවියේ ගරුත්වය සහ උදාර බව වැඩි දියුණු කිරීමටත් විවිධ ක්‍රියාකාරකම් එදින තුළ දියත් කළ හැකිය.

6. පැවිදි වරය සඳහා වූ පදවි දිනයක් ද සෑම මීසම් හා ආයතන මට්ටමින් සංවිධානය කරනු ලබන අතර එහිදී නැවතත් සියලු පවුල් පාරිශුද්ධත්වය කරා යොමු කරවන්නට වෙසෙස් අවධානයක් යොමු කරවන්නේ පූජක හා පැවිදි දේව කැඳවීම් සඳහා තෝතැන්න ඒවා වන හෙයිනි. ගම් මට්ටමේ පැවිදි නිවාසයන්ට ද මේ සංවිධාන කටයුතු වලට සහය දැක්වීමට එක්විය හැකිය. අගරදගුරු පදවි පැවිදිවරය පිළිබඳ කොමිසම සෑම මීසමකම මේ දිනය සංවිධානය කිරීමට සහය වනු ඇත. මේ දිනය 2015 පෙබරවාරි 01 හෝ 08 යන ඉරුදිනයන්ගෙන් එකක දී යොදා ගත හැකි අතර එය දෙවිඳුන් පුද දීමේ මංගල්‍යයට පෙර ඉරිදා හෝ පසු ඉරිදාවක් වන අතර ආලේප කළ ජීවිත එනම් පැවිදි ජීවිත සඳහා ලෝක දිනය යෙදී ඇත්තේ ද එකී මංගල්‍ය දිනයේදීය.

7. "එකට යදින පවුල එකට සිටී" යන ආදර්ශ පාඨය පෙරදැරි කරගෙන පවුල් යාච්ඤාව ප්‍රගුණ කිරීමට විශේෂ වැඩසටහනක් ආරම්භ කිරීමට මීසම් සේවක පියතුමන් දිරිගන්වනු ලැබේ. මේ ක්‍රියාදාමයේ දී ශුද්ධවු ජපමාලය දෛනිකව පවුලක් ලෙස එකමුතු වී උච්චාරණය කිරීමට මරිය වසර තුළ ඇරැඹූ වැඩ පිළිවෙළ තවදුරටත් පවත්වාගෙන යා යුතුවේ.

8. අගරදගුරු පදවි පවුල් අපෝස්තලික සේවාව මීසම් පවුල් උපදේශක පුහුණු වැඩසටහන් දිසා මට්ටමින් ආරම්භ කරන අතර, මීසම්වල උපදේශක යුවළ පුහුණු කිරීමෙන් පසු ඔවුන් මඟින් මීසම් මට්ටමින් පවුල් උපදේශන සේවාවන් ඔස්සේ විවාහ ගැටලු වලදී සහය වීමට ඔවුන් මඟින් නිරන්තර වැඩපිළිවෙලකට යෑමට හැකි වේ.

9. කතෝලික ලේඛක හවුල සහ අගරදගුරු පදවි සමාජ සන්නිවේදන කොමිසම, අගරදගුරු පදවි පවුල් අපෝස්තලික සේවාව සමඟ සහයෝගයෙන් කතෝලික පවුල් දිවිය තේමා කරගෙන පුවත්පත්වලට ලිපි, අත් පත්‍රිකා හෝ පොත් පිංච, විවාහ සක්‍රමේන්තුවේ දේවධාර්මික වටිනාකම උද්දීපනය වන ඩී. වී. ඩී. හා සී. ඩී. තැටි පවුල් ආධ්‍යාත්මිකත්වය පසුබිම් කර ගනිමින් සැකසීමට සැලසුම් කර තිබේ. එලෙසම පැවිදි දිවිය පිළිබඳ ලිපි සම්පාදනයට මෙන්ම ඒ පිළිබඳ ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහන් නිපදවීමට ද ඔවුන් දිරිගන්වනු ලැබේ.

10. තේමා ගීතයක් ද නිර්මාණය කැරේ. ඒ ඔස්සේ එකමුතුකම හා පාරිශුද්ධභාවය මෙන්ම දෙවියන් වහන්සේට දැඩි ලෙස ප්‍රේමය පෙන්වන යුක්තිගරුක සහ ප්‍රීතිමත් පවුලක ඇතිවන ප්‍රබෝධය තුළින් පවුලේ තරුණ තරුණියන් සසුන් මෙහෙවරට පිරිනැමීමේ කැමැත්තද වර්ධනය කිරීම මේ ගීතය තුළින් පිළිබිඹු වනු ඇත. අගරදගුරු පදවි ජනවන්දනා කාර්යාලය මෙය සකස් කිරීමට පෙරමුණ ගනු ඇත.

11. පවුල් දූත සේවාව පිළිබඳව පූජකවරුන් සඳහා 2015 දී විශේෂ සමුළුවක් බාහිර සම්පත් දායකයන්ගේ ද සහභාගිත්වයෙන් පවත්වන්නට අදහස් කැරේ.

12. පදවි පූජකතුමන්ගේ එක් වාර්ෂික රැස්වීමක දී රදගුරු පදවි සහ පැවිදි නිකායන් අතර අන්‍යෝන්‍ය සබඳතාවයන් පවත්වා ගැනීම සඳහා වන ශුද්ධාසනයේ උපදෙස් මාලාව නැවත වරක් අධ්‍යයනය කරනු ලබනු ඇත.

13. සිංහල / දමිළ සහ ඉංග්‍රීසි දේව ධර්ම නිකේතනයන්හි පවුල් දිවිය පිළිබඳ දේව ධර්මය සහ පැවිදි ජීවිත අළලා පාඨමාලා මේ වසර තුළ පැවැත්වීමට දිරිගන්වනු ලැබේ.

14. දිසා මට්ටමින් සංවිධානය කරන වැඩසටහන් මඟින් තරුණ පරපුරට පවුල් වටිනාකම් පිළිබඳ පුහුණුවක් ලබා දෙමින් විවාහයට දුරස්ථ සූදානමක් ලෙස සිරුර පිළිබඳ දේව ධාර්මික වටිනාකම් උලුප්පා දක්වමින්ද, ලිංගිකත්වයේ සැබෑ කාර්යභාරය බඳු සෙසු කාරණා ද, මිශ්‍ර විවාහයන් නිසා පැන නඟින ප්‍රශ්නකාරී වාතාවරණයන් හමුවේ ඒවාට මුහුණ දෙන ආකාරය ගැන ද පුහුණු කැරෙන වැඩසටහන් ද සංවිධානය වනු ඇත. පැවිදි සහ පූජක දේව කැඳවීමේ මහිමාලංකාරය පිළිබඳව තරුණ පරපුර මීසම් හා පදවි මට්ටමින් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ද පවත්වනු ලැබේ.

15. මේ වසර පුරා විවාහක යුවළවල සංවත්සරයන් සංවිධානය කර පවුල් දිවියේ එකමුතුකම උදෙසා විශේෂ යැදුම් පුද කරන ලෙසද ඉල්ලමි. ඒ හා සමගාමීව පූජක හා පැවිදි සංවත්සරයන් මීසම්වල සිටින හා උපත ලද අය උදෙසා පැවැත්වීමට ද දිරි ගන්වමි.

16. මේ පවුල් වර්ෂය තුළ සෑම මීසමකම මීසම් ධර්ම සේවා සභාවට අනුබද්ධ විශේෂ කමිටුවක් මීසම් පවුල් අපෝස්තලික සේවා කමිටුව ලෙස ස්ථාපිත කර ක්‍රියාත්මක කරන්නට දිරිගැන්වේ.

17. අගරදගුරු පදවි පවුල් අපෝස්තලික සේවා කාර්යාලයේ සහයෝගය මත පසු විවාහ සමුළු අලුත විවාහපත් වූ යුවළ සඳහා මීසම් හා දිසා මට්ටමින් සංවිධානය කරනු ලැබේ.

18. පවුල් වසර සැමරීමේදී දිළිඳුකමින් පීඩා විඳින පවුල් උදෙසා ආධාර කිරීම සඳහා විශේෂ වැඩසටහනක් අගරදගුරු පදවි කරිටාස් මධ්‍යස්ථානය වන සෙත් සරණ ආයතනය විසින් සංවිධානය කැරෙන අතර අගරදගුරු පදවි සංඝයම ඒ සඳහා හවුල් වනු ඇතැයි අපේක්ෂා කැරේ.

19. මේ වසරේ වැඩසටහන් අතර වැන්දඹුවන්, බිරිය මියගිය පුරුෂයන් සහ විවාහ නොවූ පුද්ගලයන් කෙරේ විශේෂ අවධානයක් යොමුකිරීම වැදගත් වන්නේ අපගේ ප්‍රධාන දූතික සේවාවන් වලින් ඔවුන් ආවරණය නොවන නිසායි. එවැනි සමහර පුද්ගලයන් මීසම් ජීවිතයට සක්‍රියව දායක වන්නේ නම් එය දිරිගැන්වීමටත්, එසේ නොමැති අයව හවුල් කරගැනීමටත් කටයුතු කළ හැකිනම් එය යහපත් වර්ධනයකි.

20. විශේෂ පවුල් ධර්ම විවේකයක් හෝ හමුවක් පදවි මට්ටමින් තේවත්ත හෝ මරුද මඩු දේවමාතා සිද්ධස්ථානයේ සංවිධානය කරනු ලැබේ.

21. මේ සියලු ක්‍රියාදාමයන් විවාහ හමුව සහ ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය බඳු සංවිධාන මීසම් හා පදවි මට්ටමින් වඩාත් ශක්තිමත්ව ක්‍රියාකාරී වීමට හේතුකාරක වනු ඇත

22. සියලුම මීසම් සේවක පියතුමන්ට මේ වසර පුරා පවුල් බැහැදැකීමේ වැඩසටහනක් දියත් කරන මෙන් මම විශේෂයෙන් ආරාධනා කරමි. මේ සඳහා පැවිදි සහයෝගය ද ලබා ගත හැකිය. කතෝලික පවුල් ජේසු සමිඳුන්ගේ දිව්‍ය හෘදයට හෝ මරියතුමියගේ නිර්මල හෘදයට කැපකිරීම මරිය වසර තුළ දී සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූයේ නම් මේ විශේෂ වසර තුළ දී එය සපුරා ගත හැකිය.

මේවාට අමතරව පූජක හා පැවිදි දේව කැඳවීම් ප්‍රවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන් මීසම් හා ආයතන මට්ටමින් පැවැත්වීම ඉතාමත් වැදගත් වේ. කෙටියෙන් කියතොත් මේ වසරේදී පවුල් දිවියේ පාරිශුද්ධත්වය කෙරේ අප පවුල් කැඳවන අතරේම ඒ පවුල්වල දරුවන් පූජක හෝ පැවිදි වරයට යොමු කිරීම මඟින් සභාවේ දූත කාර්යයට දායක වීමේ වගකීම ද සපුරාලන මෙන්ද ඔවුන්ගෙන් ඉල්ලා සිටිමි. එමෙන්ම කතෝලික පවුල් සමාජය තුළ ඇති මලානික ප්‍රතිෂ්ඨාවන් මත ආලෝකය වහනය කිරීමට යොමුවීමෙහි අවශ්‍යතාවය ගැන දැනුම්වත් කළ යුතු අතර මැවුම්කරුවාණන්ගේ දේවාරක්ෂාව තුළ ඔවුන් සියලු දෙනා එක් කරමින් ඔවුන් ශක්තිමත් සහ ගරුත්වයෙන් යුතු දෙවියන් වහන්සේගේම සැලැසුමට අනන්‍ය වූ පවුල් බවට පත්විය යුතුය. එහිදී ප්‍රකට කියමනක් වනුයේ "විවාහයන් ස්වර්ග රාජ්‍යයේදී සිදුවේ" යන්නයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මේ පිළිබඳව මෙසේ ප්‍රකාශ කළ සේක. "දෙවියන් වහන්සේ එක් කළ දෙය මනුෂ්‍යයා වෙන් නොකළ යුතුය." (මතෙව් 19:6). විවාහ දිවියේ මේ සුපිරිමය ස්වභාවය එය විනාශ කළ නොහැකි තරමට ශක්තිමත් කරයි. එලෙසම එය දේව විශ්වාසයෙන් යුතුව ජීවත් වන්නන් මත ශුද්ධ වරප්‍රසාද බහුලව වගුරුවාලන සහ දෙවිඳුන්ගේ දූත කාර්යය වඩාත් ඵල දරන්නට සලස්වමින් විශේෂයෙන් පැවිදි හා පූජක දේව කැඳවීම් නමැති තිළිණ බහුලව බිහිවන තෝතැන්නක් වන්නේ ය.

එහෙයින් දැන් දහස් සංඛ්‍යාත පවුල් කවරාකාරයේ අභියෝග හමුවේ වුවත් බොහෝ පරිත්‍යාගයන් සමඟ දිවි ගෙවමින් සභාවේ සහ දෙවිඳුන්ගේ වරප්‍රසාද බහුලව ලැබෙන පවුල් බවට පත් වී ඇති නිසා අපි දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමු. එම නිසාම අපගේ පවුල් වල යහපත උදෙසා කළ හැකි සියල්ල කරන අතරේම අපගේ යැදුමෙන්, සහයෝගයෙන්, දිරිගැන්වීමෙන් සහ අවධානය යොමු කිරීමෙන් ඒවා තව තවත් ශක්තිමත් කරමු.

මම සියලුම මීසම් සේවක පියතුමන්ගෙන් ඉල්ලා සිටින්නේ සිය මීසම්වල පවුල් දිවියේ ප්‍රබෝධය උදෙසා වඩාත් කැපවීමෙන් මේ වසර තුළ කටයුතු කරන්න යනුවෙනි. ඒ තුළින් ආශ්චර්යවත් ප්‍රීතියකින් පිරී යන්නට මීසමේ එඬේරාණන්ට හැකි වනු ඇත. ස්වකීය මීසමේ සියලු පවුල් සැබෑ ප්‍රේමයෙන්, දිව්‍යමය සංරක්ෂණයෙන් පිබිදී ඵලදායී පවුල් ලෙස දෙවියන් වහන්සේ තුළ දිවි ගෙවන නිසා මීසම් සේවක පියතුමන්ට මහඟු සතුටක් ලැබෙනු ඇත. එමෙන්ම මේ මඟ යෑමෙන් ඔවුන්ට සභාවට වඩාත් උදාර පැවිදි සහ පූජක දූ පුතුන් විශාල පිරිසක් දායාද කරන්නට ද හැකියාව ලැබේ.

නාසරතයේ ශුද්ධවු පවුල හැමවිටම අපව පුබුදුවාලමින්, යහපතාණන් වූ දෙවියන් වහන්සේගේ ආශිර්වාදයෙන් අපගේ සියලු කතෝලික පවුල් ශක්තිමත් කරමින් ප්‍රේමය සහ දෙවියන් වහන්සේගේ වැඩසිටීම ස්වකීය සියලු අසල්වැසියන් සමඟ බෙදාගැනීමේ බලය සියලුම කිතුනු පවුල්වෙත ලැබේවායි පතමි! මේ සඳහා අප පෙම්බර දේව මාතාවන්ගේ පිළිසරණය ද පතා සිටිමු.



මෙයට ක්‍රිස්තුන් වහන්සේ තුළ ඔබට කැපවූ

**✠ මැල්කම් කාදිනල් රංජිත්**
**කොළඹ අගරදගුරු හිමි**

2014 නොවැම්බර් 11 වැනිදා

කලා සංග්‍රහය

# දේව භාෂිතයක් බවට පත් මුද්‍රණ දෝෂයක්!

කතෝලික පොත්පත් හා වෙනත් මුද්‍රිත ප්‍රකාශනයන්හි සෝදුපත් බැලීමේ කාර්යය 'ආවට ගියාට' සිදුකිරීම නිසා ඒවායේ අපේක්ෂිත අරමුණු වෙනුවට හාස්‍ය දනවන වචන හා අරුත් බිහිවීම එන්න එන්නම වැඩිවන තත්ත්වයක පැවතීම කණගාටුවට කරුණකි.

අරුත විකෘති වීම මෙන්ම බස පිරිහීමද එහි අනිටු විපාකවෙයි. උදාහරණයක් ලෙස 'පැවිදි' යන වචනය සිහිපත් කරමි. අප සභාවේ පැවිදි සොයුරියෝ පවා සිය ලේඛණයන් හමාරකොට....... 'පැවිදි' සොයුරිය යනු වෙන් නම සඳහන් කිරීම මැතක් වනතුරුම ඥානාර්ථ ප්‍රදීපයෙහි මෙන්ම වෙනත් ආගමික ප්‍රකාශනයන්හි සුලභව දක්නට ලැබිණ. එය සදොස් යයි පෙන්වා දුන් පසු ප්‍රදීප පුවත් පත එය පිළිග ැනීම සතුටට හේතුවකි. දැන් 'පැවදි' යන සදොස් වදන නිවැරදිකොට 'පැවිදි' යනුවෙන් සඳහන් කිරීම නිරවද්‍ය බැවින් එය ප්‍රදීපය ගත් නිහතමානි පියවරක් ලෙස අගයමි. දිනපතා දිව්‍ය පූජාවේදී බහුතරයක් ගරු පියවරුන් විසින් අරුත් නොසළකා කටපාඩමට හුරුව කරන තවත් සදොස් යෙදුමක් වෙයි. එයද බසට කරන අගෞරවයක් මෙන්ම ශුද්ධ වූ ත්‍රිත්වයට කෙරෙන අගෞරවයක්ද වෙයි.

විශ්වාස ලක්ෂණයේදී පියාණන්ද, පුත්‍රයාණන්ද, ශුද්ධාත්මයාණන්ද විශ්වාසයෙන් අදහන බවට අප සපථකරමු. එහිදි 'ශුද්ධාත්මයාණන්' යනු පියාණන් හා පුත්‍රයාණන් වහන්සේගෙන් නික්මෙන සමිඳාණෝය. මීට දසවසරකට පෙර දිව්‍ය පූජාවේදි භාවිත කළ ප්‍රකාශණයන්හි ශුද්ධ වූ ත්‍රිත්වයේ තුන්වන තැනැන්වහන්සේ හැඳින්වූයේ පියාණන්ගෙන් හා පුත්‍රයාණන්ගෙන් නික්මෙන සමිඳාණන් වූ ස්ප්‍රිතුසාන්තු කෙරෙහිද විශ්වාසකරමි" යනුවෙනි. නමුත් අන්‍යාගමික මුද්‍රණකරුවකුගේ නොදත් කම හෝ ශුද්ධවූ ත්‍රිත්වයේ අභිරහස නොදත් කතෝලික මුද්‍රණකරුවකුගේ අනවශ්‍ය 'හා' අකුරක් නිසා ශුද්ධවූ ත්‍රිත්වයේ සුපැහැදිලිවම විකෘතියක් නිර්මානය වි තිබේ. 'පියාණන්වහන්සේගෙ න් හා පුත්‍රයාණන් වහන්සේගෙන් නික්මෙන සමිඳාණන්ද, ජීවදායකයාණන්ද වූ ශුද්ධාත්මයාණන් කෙරෙහිද විශ්වාස කරමි' යනුවෙන් වන ඇදහිල්ලේ ප්‍රකාශය, විශ්වාසයටද කැළලක් ශුද්ධ වූ ත්‍රිත්වයටද අපහාසයක්ව, මුද්‍රණයකොට ඇත්තේ 'පියාණන් වහන්සේගෙන් හා පුත්‍රයාණන් වහන්සේගෙන් හා නික්මෙන සමිඳාණන්ද, ජීවදායකයාණන්ද,........ වශයෙනි. කතෝලික ඇදහිල්ලේ අභිරහසක්ව උගැන්වෙන සත්‍යතාවයක් අනවශ්‍ය තැනෙක, නොසැලකිල්ලෙන් යෙදු භාෂාමය 'හා' අකුරක් හේතුකොටගෙන විකෘතිවීම කණගාටුවට කරුණකි. වඩාත් කණගාටුදායක කරුණවන්නේ ආලේපලත් නිල පූජකවරු ශුද්ධ වූ අල්තාරයේ සිට ඇදහිලිවන්තයන් ද පිරිවරා මේ විකෘතිය සත්‍යතාවයක්ව ප්‍රකාශකිරීම පමණක්ම නොව පසුව මුද්‍රණයව ඇති පතපොතකම මේ විකෘතිය දේවභාෂිත සත්‍යයක් තරමින් සලකා සඳහන්කිරීමට තරම් මුද්‍රණකරුවෝ 'අද බාල' වීමයි. එබැවින් උක්ත ප්‍රස්තුත ගත ප්‍රකාශයෙහි එන දෙවන 'හා' අක්ෂරය අනවශ්‍ය යෙදුමකි. සැබවින්ම විකෘතියකි. පුනරුත් දෝෂයකි. වැරදි වහරකි. බසට නිගාවකි.

පූජකවරු ආගමික පිළිගත් සත්‍යතාවයක් අල්තාරයේ සිට දිව්‍ය පූජා අවස්ථාවෙහි ගිහි සැදැහැවතුන් හා පැවිදි පිරිස්ද සහභාගි කොටගෙන විකෘති ස්වභාවයෙන් පැවසීම තවදුරටත් පැවතිය යුතු නොවේ. කරුණ වඩා නිරවද්‍යව අවබෝධකර ගැනීමට අවශ්‍ය ඕනෑම අයෙකුටම ගෞරවයෙන් ආරාධනාකරන්නේ පෙරකි ප්‍රකාශයෙහි දෙවන 'හා' ආකරය ඉවත් කළවිට ලැබෙන සුපැහැදිලි බව අත්දකින ලෙසයි. දොරෙහි යතුරු කවුළුවෙන් ලෝකය බලනවාට වඩා දොර හැර ලෝකය බැලුවිට ඔබ ලබන සුපැහැදිලි දැක්ම හා සමාන අඩමාන නොවූ සුපැහැදිලි බවක් ඔබ අත්දකිනු නියතය. වරද පෙන්වාදෙනවුන් පෙළනට කැට මුගුරු ගනුනොව වැරදිම නිවැරදි කරගැන්මය. සාධාරණය. යුක්තියුක්තය.

**පැල්ලන්දෙණියේ ඩී. ඒ. සමරවික්‍රම**

# 50 වැනි ග්‍රන්ථය ජනපතිට පිළිගැන්වූ ප්‍රදීපයෙන් බිහි වූ මර්වින්

**'වින්සන් මර්වින් කොරළවැල්ල' නමින් පසල් වියේ සිටම ප්‍රදීපයට ලිපි සැපයු වින්සන් මර්වින් ප්‍රනාන්දු මහතා තමන්ගේ 50 වැනි ග්‍රන්ථය පසුගිය දින ජනපති මහින්ද රාජපක්ෂ මහතාට පිළිගැන්විය. වසර 2600 ක ආර්ථික වංශ කථාව 'සාමය සංවර්ධනය සහ සංහිඳියාව' නමින් එළිදැක්වූ මෙම ග්‍රන්ථය ශ්‍රී ලංකාවේ රාජාණ්ඩු, විදේශාණ්ඩු, නිදහසින් පසු ආණ්ඩු සහ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව යන ප්‍රධාන මාතෘකාව යටතේ රචනා කර ඇත.**



ඒ ඒ ආණ්ඩුකාල යටතේ සිදුවූ ආර්ථික ක්‍රියාකාරකම්, පිළිබඳ විශ්ලේෂනයක යෙදෙන ලේඛකයා නිදහසින් පසු ශ්‍රී ලංකාව පාලනය කළ සියලු ම ආණ්ඩු ගැන පුළුල් විශ්ලේෂණයක යෙදෙයි. 1948 න් පසු ඒ ඒ කාලවල පැවැති මැතිවරණවල ඡන්ද ප්‍රතිඵල, ඒ ඒ කාලවල ආර්ථික දර්ශනය, ආර්ථික කාර්යසාධනයන් පිළිබඳ සියලුම තොරතුරු එක්තැන් කළ මෙම අති විශිෂ්ට ශාස්ත්‍රා ග්‍රන්ථය මේ පිළිබඳව උනන්දුවක් දක්වන කවුරුත් අනිවාර්යයෙන්ම එසවිය යුතු ග්‍රන්ථයක් බව අපගේ විශ්වාසයයි. විශේෂයෙන් 1948 සිට මේ දක්වා බලයට පත් ආණ්ඩු යටතේ ක්‍රියාත්මක වූ ආර්ථික ප්‍රතිපත්ති, ආර්ථික සංවර්ධන උපාය මාර්ග. ආර්ථික වර්ධන වේගයන්, උද්ධමනය, සේවා වියුක්තිය, අයවැය හිඟය, රාජ්‍ය ණය. මානව සංවර්ධනය, විදේශිය ආර්ථික සංවර්ධනයන්, දරිද්‍රතාව, සමාජ දර්ශන හා සංවර්ධන ව්‍යාපෘති, මූල්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති යනාදි ආර්ථික ක්ෂෙත්‍රයන් ගණනාවක තොරතුරු සසඳන කෘතියක් නිසා මෙය උසස් පෙළ හා උසස් අධ්‍යාපනය ලබන සිසුන්ටත් ඒ ක්ෂෙත්‍රවල උගන්වන ගුරු භවතුන්ටත් අතිශයින් ප්‍රයෝජනවත් ග්‍රන්ථයක් බවද සඳහන් කළ යුතුය.

කොරළවැල්ලේ රෝමානු කතෝලික මිශ්‍ර පාසලේ මූලික අධ්‍යාපනය ලැබූ වින්සන් මර්වින් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳව ප්‍රථම පෙළේ සමාර්ථයක් ලබා 1980 දී ශ්‍රී ලංකා මහ බැංකුවේ 'ආර්ථික විශේෂඥයකු' බවට පත් විය. 1986 දී ජ්‍යෙෂ්ඨ ආර්ථික විශේෂඥයකු වූ ඔහු එම බැංකුවේ ම නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු, සහකාර අධ්‍යක්ෂවරයකු හා අධ්‍යක්ෂවරයකු දක්වා ගමන් කොට බැංකු ක්ෂේත්‍රයේ වසර 30 ක අත්දැකීම් ලබා ගත් කෙනෙකි. 1990 දී එංගලන්තයේ මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳව එම්. ඒ. (පශ්චාත් උපාධිය) ද ලබාගත්තේය. ඔහුගේ රාජකාරි කාලය තුළ ඇමරිකාවේ වොෂින්ටන් නුවර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ජර්මනියේ මහ බැංකුවේ මැලේසියාවේ මහ බැංකුවේ, සිංග ප්පූරුවේ මහ බැංකුවේ, පිලිපීනයේ මහ බැංකුවේ, ස්විස්ටර්ලන්තයේ මහ බැංකුවේ, ඉන්දියාවේ මහ බැංකුවේ පාඨමාලාවලට සහභාගි වී අති විශිෂ්ට දැනුම් සම්භාරයක් ලබාගෙන තිබේ.

1980 තම ප්‍රථම ශාස්ත්‍රීය ග්‍රන්ථය වූ 'ශ්‍රී ලංකාවේ ආර්ථික හා මූල්‍ය සංවිධාන' ග්‍රන්ථය තුළින් ග්‍රන්ථ කරණයට පිවිසි මර්වින් ප්‍රනාන්දු මහතා එතැන් සිට අඛණ්ඩව අද වන විට පොත් 50 ක් නිකුත් කර තිබෙන අතර, සිය 50 වැනි ග්‍රන්ථය ශ්‍රී ලංකා ජනපති අතිගරු මහින්ද රාජපක්ෂ මහතාට ප්‍රදීපය කර්තෘ සාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාට සහ තම ආයතනයේ ප්‍රධානියා වූ මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතාට පිළිගැන් වීම සිදුකරන ලදි. ඔහු විසින් සිංහල භාෂාවෙන් උසස් අධ්‍යාපනය ලබන සිසුනට ආර්ථික විද්‍යාව සඳහා ග්‍රන්ථ 40 ක් ද ව්‍යාපාර අධ්‍යනය සඳහා ග්‍රන්ථ 8 ක් ද ලියා පළකර තිබෙන අතර බැංකු විභාග සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ග්‍රන්ථ දෙකක්ද සම්පාදනය කොට ඇත.

ග්‍රන්ථකරණයට අමතරව ලේඛන කලාව ද ප්‍රගුණ කරති මර්වින් ප්‍රනාන්දු මහතා මහබැංකුවේ සටහන සඟරාව, News Survey යන සඟරාවලට ලිපි 300 කට වඩා සිංහලෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් ලිපි සම්පාදනය කර ඇත. ශ්‍රී ලංකා විශ්ව කෝෂයේ ආර්ථික විද්‍යා ලිපි 50 කට වඩා ඔහු විසින් ලියා ඇත. සිංහල ඉංග්‍රීසි හැම ජාතික පුවත්පතකට ම ලිපි සම්පාදනය කරන මොහු වසර 4 කට නොඅඩු කාලයක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හරහා ආර්ථික විද්‍යා දේශන ද විකාශය කර ඇත. රූපවාහිනි සංවාද වැඩ සටහන්වලට සහභාගි වන මර්වින් ප්‍රනාන්දු මහතා ප්‍රදීපයේ මාසික ආර්ථික විශේෂාංග යට ද දායක වෙයි.

ඔහුගේ මේ අනගි අවස්ථාවට ප්‍රදීපයේ ශුභාසිංසන ද පිරිනැමීම අපගේ යුතුකමකි ප්‍රදීප පාඨකයින්ට කිතුනු පාසල්වලට මෙම ග්‍රන්ථය රු. 300 කට්ටමකට යටත්ව ලබාගත හැකිය. කතුවරයාට ප්‍රදීප සුපැතුම්!

**- මෛත්‍රී**

පිලීෂන් අබයකෝන්ගේ

## සුබස 284

## හැමට ඇයට

ඇගේ, ඇගෙන් යයි කීවද ඇට/ ඇයට මිස ඇට යයි කොහිවත් නැත. එසේ මැට/ මැයට මූට ඌට පමණක් බසේ පෙනේ. ඇගේ හරි යෙදුමට පිටු පෑ තැන් පැරණි පොතපතේ දැකිය හැකිය. වරද පෙනි පෙනීත් පෙර පඬින් කළහයි කියා වැරදි තව දුර ගෙන යා යුතු නැත.

සැම හා හැම කුඹුරේ කාරියකි. සැම/ හැම කෙනෙක්/ දෙනෙක් යයි බොහෝවිට ඇසේ. එහෙත් හැමට, හැමගේ, හැමගෙන් යයි හැමවිට නිවැරදිව යෙදේ. එසේම හැකිද? හැකද? දෙස බලද්දී හැකිය සඳහා හැක යෙදීම සදොස් බව පැහැදිලිය.

හැමෝම කටවහරේය. සැවොම යන වහර ගොන්සාල්වෙස් කෘතිවලත් හමුවේ. සැවොම ඔවුනොවුන් සිතු දෙයක් අත්වෙන පිණිස ගැස්තුගාවිනාවල් විඳින්නේය. (ඥානාංජනය) සැවොම අවියක්ලු.

සැම හැම යයි සිදත් සඟරාවේ හකර විනිසෙහි දිස් වුණත් සාහිත්‍යයේ බෙහෙවින් දකින්නේ හැම නැත්නම් ඇමයි. අප අතවැසි ඔබට සේවය කෙරෙයි හැමවිට - ඇඳ සිතියම් සිත තුටු කර ඇමගේ (ගුත්තිලය)

හැමදෙන අනුක්තව යෙදෙද්දී හැමදෙනාය. හැමදෙනාට, හැමදෙනාගේ, හැමදෙනා පරිදිය. සියලු දෙන, බොහෝ දෙන ආදියත් මෙලෙස අනුක්ත විය යුතුය.

සැම කල්හිද සැම තන්හිද අප ඔබට තුති පුදකිරීම සැබවින්ම යෝග්‍යය, (ප්‍රශංසා ගීතය)

සිරුර සුරිඳුවෝ ගෙන සියතින් දී
සිසුන් වැළැඳ වූ එකසෙ හැමදෙනා
(මෙමඟුල වසරේ ගීතිකාව)

## කතෝලික ලේඛක හවුලේ තරග ප්‍රතිඵල

වසරේ කිතුනු කවියා සිංහල මුද්‍රිත 2014 ඒ. එස්. පී. පෙරේරා, වසරේ කිතුනු කවියා ඉංග්‍රීසි මුද්‍රිත 2014 තරගය අවලංගු කරන ලදි. ඥානාර්ථ ප්‍රදීපයේ හොඳම පාඨක චින්තනය 2014 රන්ජන් පල්ලෙවෙල, ද මැසෙන්ජර් හොඳම පාඨක චින්තනය 2014 ලුවී බෙනඩික්, වසරේ ජනප්‍රිය පුවත්පත් කලාවේදියා ජෝ. සංඝපාල ආරච්චි, වසරේ කිතුනු ඡායාරූප ශිල්පියා බෙනඩික් හපුආරච්චි අනුස්මරණ සම්මානය පර්සි ප්‍රනාන්දු, කැමිලස් පෙරේරා මහතා පිරිනමන විශේෂ සම්මානය ගරු ජයලත් බලගල්ල පියතුමා, කුරුණෑගල රදගුරු සම්මානය කැලිස්ටස් ජයමාන්න, සභාපති සම්මානය ලෙනාඩ් හපුආරච්චි, ලිව්සුරු සම්මානය සිරිල් එඩේරමුල්ල, කිවිසුරු සම්මානය කොන්සි හපුආරච්චි, කලාසුරු සම්මානය රිචඩ් මානමුදලි

**- ජෝසප් ජයසිරි ප්‍රනාන්දු**



**කිතුනු ලේඛක ලූෂන් එඩ්වඩ් පෙරේරා මහතා විසින් රචිත කරුණාවේ බලය ළමා ඔවදන් ග්‍රන්ථය එළිදැක්වීම පසුගියදා සිදු වූ අතර, එහිදී ලේඛකයා ජේසු නිකායික ගරු මහාචාර්ය ඇලෝයි පීරිස් පියතුමාට ග්‍රන්ථය පිළිගන්වන අයුරු. ලේක් හවුස් කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ සීලරත්න සෙනරත් ශාස්ත්‍රපති හොරවල ධම්මාරාම හිමිද ගොඩගේ ප්‍රකාශන අධිපති දේශබන්ධු සිරිසුමන ගොඩගේ මහතාද මෙහි වෙති.**

**- ලයනල් පී. පෙරේරා**

## වසරේ කිතුනු ඡායාරූප ශිල්පියා



ජ්‍යෙෂ්ඨ ඡායාරූප මාධ්‍යවේදි පර්සි ප්‍රනාන්දු මහතා 2014 ජාතික කතෝලික ලේඛක හවුලේ සාහිත්‍ය සම්මාන උලෙලේදී වසරේ කිතුනු ඡායාරූප ශිල්පියා ලෙස නාට්‍ය හා සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක මහතා අතින් සම්මානයට පාත්‍ර විය. සිනමා රූපවාහිනි විද්‍යුත් මුද්‍රිත මාධ්‍ය වල වසර 24 කට අධික කාලයක් නිදහස් ඡායාරූප මාධ්‍යවේදියකු ලෙස කටයුතු කරන පර්සි මහතා 30 වනදා සිට ජාතික රූපවාහිනියෙන් විකාශනය වන ඇන්ඩෘ ජයමාන්න ගේ දිරිය දෝණි රූපවාහිනි නාට්‍යයේ නිශ්චල ඡායාරූපකරණයෙන් හා රංගනයෙන් ද දායක වී ඇත. වෘත්තීය ඡායාරූප මාධ්‍යවේදියකු වන ඔහු දිවයිනේ විවිධ ඡායාරූප හා මාධ්‍ය සංගම්වල සභාපති ධූරයද හොබවයි. ඔහුට අපේ ශුභාශිංසනය.

විශ්ව සභාව

# සසුන් පියා ටියුරිනයේ ශ්‍රී සළුව වෙත ගෞරවාචාරය දක්වනු ඇත



ලබන වසරේ අප්‍රේල් මස 14 වැනිදා සිට ජූනි මස 24 වෙනිදා දක්වා, ටියුරිනයේ ශ්‍රී සළුව ගෞරවාදරය දැක්වීම සඳහා මහජන ප්‍රර්ශනයට පාත්‍ර කරනු ලැබේ.

එම කාලය තුළදී, ප්‍රැන්සිස් සසුන් පියා ද ටියුරිනයට ගොස් ශ්‍රී සළුව වෙත සිය ගෞරවාදරය දක්වනු ලබන බැව්, වතිකානය විසින් වාර්තා කරත. මෙම ශත වර්ෂය තුළ, ශ්‍රී සළුව මහජන ගෞරවය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන්නාවූ තුන් වන වාරය මෙයයි, මෙම ප්‍රදර්ශණය ශාන්ත ජෝන් බොස්කෝ තුමාගේ 200 වැනි උත්පත්තිය හා සමගාමී වේ. ශ්‍රී සළුව ප්‍රදර්ශනය කරනු ලබන්නේ, බොස්කෝ තුමා වෙනුවෙන් කැපවූ ආසන දෙව් මැඳුරේය.

ශ්‍රී සළුව වෙත ගෞරව දැක්වීම සඳහා ලෝකයේ බොහෝ රටවලින් ඇදැහිළි වන්තයන්ගේ පැමිණීම බලාපොරොත්තුවේ, පැමිණෙන ඇදැහිළි වන්තයන්ගේ අධ්‍යාත්මික අවශ්‍යතාවන් සපුරා ලමින් ආසන්නයේ ඇති දෙව් මැඳුරක, මුළු කාල පරාසය තුළදීමැ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නමස්කාරය කිරීම සිදුවනු ඇත. තවද දවස පුරා පාපොච්චාරණය සඳහා පහසුකම් ද සලසනු ඇතැයි ද වාර්තා වේ. පැමිණෙන සියල්ලන්ගේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා, ස්වෙච්ඡා සේවකයන් 3500 ට වැඩි සංඛ්‍යාවක්, සැදී පැහැදී සිටිනු ඇත.

## පකිස්තානයේ කිතුනු යුවළක් පණපිටින් පුළුස්සා දැමේ

පකිස්තානයේ ලාහෝර් ප්‍රදේශයේ ගමක ජීවත් වූ තරුණ කිතුනු යුවලක් ඉස්ලාම් දහමට නිගරු කළාය යන අස්ථාන චෝදනාවක් මත, ගල්පෝරනයක සිරකොට පුළුස්සා දමා ඇත.

චෝදනාව වී ඇත්තේ, 24 හැවිරිදි මෙම කාන්තාව විසින් සිය මාමංඩිය සතු කුරාන් ග්‍රන්ථයේ පිටු ගලවා පුළුස්සා දමා ඇති බවයි. මෙම අස්ථාන චෝදනාව ඉදිරිපත් කරනු ලැබූ මුස්ලිම් ජාතිකයා විසින් ගෙතූ එම සිද්ධිය, කටින් කට පතුරුවා හරිනු ලැබ ඇත. මෙම සිද්ධිය කටින් කර පැතිර යද්දී, අදාළ ගමේ වෙසෙනා මුස්ලිම් වරුන් 100 කට අධික සංඛ්‍යාවක්, මෙම යුවළ ජීවත් වූ නිවසට කඩා වැද, දින දෙකක් හිරකොට තබා ගෙන ඔවුන්ව මාරාන්තික වේදනාවට පත් කරනු ලැබීය. ඔවුන් දෙදෙනාගේමැ කකුල් කඩා බිඳ තිබිණි. පසුව පිරිසක් විසින් ඔවුන් දෙදෙනා උස්සා ගෙන ගොස් ඇවිළෙමින් තුබූ ගල් පෝරණයකට විසි කොට ඇත.

මෙම සිද්ධියෙන් ලාහෝරයේ මෙන්මැ සමස්ත පකිස්තානයේ කිතුනුවෝ මහත් වේදනාවටත් කලකිරීමටත් පත්ව සිටිති. තත්ත්වය පිළිබඳව ලාහෝරයේ සාම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජේම්ස් චන්නාන් පියතුමා මෙලෙස පැවැසුවේය. "මෙම මිනිස් ඝාතනය අමානුෂික ක්‍රියාවකි. කිතුනුවන් වශයෙන් අප ජීවත් වන්නේ කුමන රටකදැයි සිතා ගන්නට පවා බැරිය පකිස්තානයේ කිතුනුවන්ගේ ජීවිත බේරා ගැනීමටත් ඉස්ලාම් දහම පිළිබඳ ඒක පාක්ෂික නීති වෙනස් කිරීමටත්, ඉදිරිපත් වන ලෙසට අපි එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ඉල්ලා සිටිමු."

## ඉන්දියාවේ සුප්‍රකට බැසිලිකාව තුළ පින්තූර ගැන්ම තහනම්

ඉන්දියාවේ, ගෝවා හී බැසිලිකාවේ තැන්පත් කරති ශාන්ත ප්‍රැන්සිස් සේවියර් තුමාගේ ශුද්ධ වූ ධාතූන් කැමරාගත කැරුම මින්පසු තහනම් කැරෙනු ඇතැයි ඉන්දීය සභා නායකයෝ ප්‍රකාශ කරති.

ගෝවා හී මෙම බැසිලිකාව වෙත පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාවන් ද වැඩිවී ඇත. ඒ අතර මැ, ප්‍රැන්සිස් සේවියර් තුමාගේ ධාතූන් වෙත ගෞරව දැක්වීමට එහි පැමිණෙන සැදැහැවතුන් විසින් බොහෝවිට ප්‍රකාශ කරනු ලබන්නේ, එහි පැමිණෙන දහස් සංඛ්‍යාත සංචාරකයන් නොමනා අන්දමින් බැසිලිකාව තුළ පින්තූර ගන්නා බවයි. එබැවින් බොහෝ කරුණු කාරනා අධ්‍යයනය කිරීමෙන් පසුව, බැසිලිකාව තුළ පින්තූර ගැන්ම තහනමට ලක් කොට ඇත. තවද, මෙම පූජනීය ස්ථානයේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා, එහි ඇතුළු වීමට පෙරාතුව විශේෂ වස්ත්‍රයක් ඇඟලා ගැනීම කළ යුතු වේ.

ගෝවා හී ප්‍රැන්සිස් සේවියර් තුමාගේ ශුද්ධ වූ ධාතූන්, මේ වසරේ නොවැම්බර් මස අග සිට 2015 වර්ෂයේ ජනවාරි මස අග දක්වා ගෞරවාදරය සඳහා ප්‍රදර්ශනය කරනාතර, එහි පැමිණෙන සියල්ලන් නව නීති සංග්‍රහයන්ට අවනත විය යුතු යැයි නිවේදනය කරනු ලැබ ඇත.



## පූජකයන් ක්‍රිමියාවෙන් පිටවිය යුතු යැයි රුසියාවෙන් නියෝගයන්



රුසියානු පාලනය යටතේ පවත්නා ක්‍රිමියාවේ සේවය කරනා විදේශ රටවලින් පැමිණ ඇති කතෝලික පූජක වරුන් හා පැවිදි අය, මේ වසර අවසන් වීමට පෙරාතුව රටින් බැහැරව යා යුතු බවට රුසියානු රජය විසින් නියෝගයක් නිකුත් කරනු ලැබ ඇත.

රුසියාව විසින් ක්‍රිමියාව සිය පාලනය යටතට ගනු ලැබීමෙන් පසුව, සියලු කතෝලික හා අනෙක් කිතුනු සභා දෙව් මැඳුරු ද, ආයතන ද, පාසල් ද රජය යටතේ ලියාපදිංචි කොට නොමැති හෙයින්, ප්‍රථම පියවරක් වශයෙන්, ක්‍රිමියාවේ සේවය කරනා සියලු විදේශීය කතෝලික පූජකවරුන් ඇතුළු පැවිදි තැනැත්තන්, දෙසැම්බර් මස 31 වැනිදාට ප්‍රථම ක්‍රිමියාවෙන් බැහැර විය යුතු යැයි, අදාළ පුද්ගලයන් නියමයන් ලබා තිබේ.

මෙම නියෝගයන් හේතුකොට ගෙන මහත් අසීරු තත්ත්වයට මුහුණ දී ඇති කතෝලික සභාව හා අදාළ පුද්ගලයෝ, ගතයුතු පියවර පිළිබඳ සාකච්ඡාවේ නිරතව සිටිනා අතර, වැඩිකල් නොයා, සාධාරණ තීන්දුවකට එළඹෙන බැව් ජාත්‍යන්තර මාධ්‍ය වෙත වාර්තා කරති.

## ජෝර්දාන රජයෙන් අරාබි කිතුනුවන් වෙනුවෙන් යළිත් ප්‍රකාශයක්

අරාබි දේශයන් හී ජීවත්වන කිතුනුවන් ආරක්ෂා කළ යුතු යයි ලොවට හඬගා කියනා ජෝර්දානයේ II වැනි අබ්දුල්ල රජතුමා යළිත් සිය අදහස් ප්‍රකාශ කරයි. අරාබි කරයේ බොහෝ නායකයන් ඒ ඒ මුස්ලිම් දේශයන් හී කිතුනුවන්ගේ පැවැත්ම වෙනුවෙන් කතා නොකරන නමුත්, ජෝර්දාන් රජතුමා අරාබි කරයේ කිතුනුවන් ආරක්ෂා කළ යුතු යයි අදාළ සැමගෙන් ඉල්ලා සිටිනුයේ අරාබි දේශයන්ගේ වර්ධනයට කිතුනුවන් ලබා දී ඇති දායකත්වය සිහිපත් කරවමිනි.

පසුගිය ඔක්තෝබර් මස 29 වෙනිදා, ජෝර්දාන් රජතුමා ආර්මේනියාවේ ජනාධිපති තුමා මුණ ගැසුණේය. නායකයන් දෙදෙනා අතර පැවැති සාකච්ඡාවේදී ජෝර්දාන් රජතුමා විසින් අරාබිකරයේ ජීවත්වන කිතුනුවන්ගේ පැවැත්ම ආරක්ෂා කර ගැන්ම සඳහා ලෝක නායකයන් විසින් දායකත්වය ලබාදිය යුතු යයි ද ප්‍රකාශ කරනු ලැබ ඇත. ආර්මේනියාවේ ජනාධිපති තුමා විසින් ද සංහිඳියා මග ඔස්සේ, විශේෂයෙන් අරාබිකරයේ ජීවත්වන කිතුනුවන්ගේ අයිතිවාසිකම් රැකගත යුතු බැව් ද පිළිගනු ලැබීය.

මේ අනුව, ජෝර්දාන් රජතුමා මෙලෙසින් ද ප්‍රකාශ කළේය. 'අරාබි සංස්කෘතිය වඩවාලීමට අරාබි දේශයේ කිතුනුවන් ලබා දී ඇති දායකත්වය කිසිදා ඉතිහාසයෙන් ඉවත් කළ නොහැකිය. එම නිසාවෙන් අරාබි දේශයන් හි කිතුනුවන් ආරක්ෂා කිරීම, සකල අරාබි ජනතාවගේ යුතුකම බැව් ද සිහිතබා ගත යුතු වේ.'

## සේවක විරැකියා බියට පිළිතුරු දෙන්නැයි කාදිනල් රජයෙන් ඉල්ලයි

ඉතාලියේ වානේ කම්හල් සේවකයන්ගේ වැඩ වර්ජනයක් කලක් තිස්සේ පවතී. සේවාවෙන් පහ කිරීමත්, වැටුප් කපා හැරීමත් මෙම වැඩ වර්ජනය දිගින් දිගට පැතිර පැවත්මට හේතු වී ඇත. වැඩ වර්ජනය උග්‍ර වෙද්දී සේවකයන් ද කළකිරීමට පත්වී, ක්‍රෝධයෙන් පහරදීම් ද කරමින්, කෙසේ හෝ මෙම අයිතිවාසිකම් ලබා ගැන්මට උත්සහයක යෙදෙන්නට පටන් ගෙන ඇත. උදා වී ඇති කලහකාරි තත්ත්වය අනුව, පොලීසියද වර්ජනයන්ට පහරදීමට එළැඹ ඇතැයි ද වාර්තා වේ. විශේෂයෙන් ටර්නි නගරයේ, පොලීසිය හා කම්කරුවන් අතර සටන් උග්‍ර වී බොහෝ දෙනා තුවාල ලබා ඇත.

මෙම උග්‍ර තත්ත්වය හමුවේ, ඉතාලියේ රදගුරු මණ්ඩලය ද පාර්ශවයන් අතර සාමය ඇතිකර ලීමට ක්‍රියා මාර්ග ඉදිරිපත් කොට ඇත. ඉතාලි රදගුරු මණ්ඩලය විසින් වානේ කම්හල් සේවකයන් ද ආයතන හිමියන් ද රජය ද ඉලක්ක කොට ප්‍රකාශයක් නිකුත් කරනු ලැබ ඇත. රදගුරු මණ්ඩලය මෙලෙසින් ද දක්වා ඇත. "අභියෝගයන් මැද සේවය කරනා කම්කරුවන්ගේ පවුල් වලැ ජීවිත තත්ත්ව රැක ගැන්ම සඳහා සාධාරණ වැටුප් ගෙවිය යුතු යයි ද, ඒ අනුව රජය විසින් යුතුකම් ඉටු කරනු ලැබීම අනිවාර්ය යයිද සියල්ලන් විසින් වටහා ගත යුතුවේ.

සන්නද්ධ පොලීසිය ක්‍රියා කළ යුත්තේ මිනිස් හැඟීමකින් මිස, පහරදීමෙන් නොවන බැව් ද සනාථ විය යුතුය. එබැවින් රජය මැදිහත් වීමෙන් විශේෂයෙන් සේවක ප්‍රශ්නයන්ට පිළිතුරු ලබා දීම ප්‍රමාද කළ යුතු නොවේ."

## ඉරාකයේ නව අගමැති දේශයේ කිතුනුවන් රකිනා බැව් පවසයි

ඉරාකයේ නව අගමැති හයිඩර් අල් අබාදි අවධාරණයෙන් පවසා ඇත්තේ, දේශයේ කිතුනුවන් ආරක්ෂා කිරීමටත්. සුරැකීමටත් හර්ද සාක්ෂිය අනුව බැඳී සිටිනා බවයි.

එතුමා එලෙසින්ම ක්‍රියා කරනා බැව් තමාට ද ප්‍රකාශ කළ බැව් ඉරාකයේ පත්‍රියාක ලුවිස් රෆායෙල් සෝකෝ තුමා විසින් ද කතෝලික පුවත් වෙත වාර්තා කර තිබේ. කිතුනුවන් විශාල වශයෙන් දේශය හැර යාම අවාසනාවන්ත තත්ත්වයක් බවත්. එලෙස සිදුවීම මුළු දේශයටම අහිත කර බවත්, නව අගමැති තුමා විසින් පෙන්වා දී ඇත. තවද බැග්ඩෑඩ් වැනි ප්‍රදේශ වලින් කිතුනුවන් පැහැර ගනු ලැබීම වලකාලීම සඳහා හමුදාවන් ද යෙදවීමට එතුමා විසින් පොරොන්දුවක් ද දී ඇත.

බැසිල් ෆොන්සේකා විසිනි

සංවාද මණ්ඩපය

# අනේ! සාස්තර මහත්තයෝ! බහුභූතයකු නොවන්න

ප්‍රසුගිය දිනක එක්තරා ටී. වී. නාලිකාවක් මගින් රට පුරා නමක් දිනා ගෙන ඇති තිතටම හරියන අනාවැකි කියනු ලැබේ. යැයි හඳුන්වාගනු ලබන ජ්‍යොතිෂවේදියකු තම ශාස්ත්‍ර පරාසයෙන් පිට පැන තමන් නොදන්න ආගම් සහ ආගමික මූලධර්ම ගැන බණ කියන්නට යෑම නිසා විකාරයක් විගඩමක් බවට පත්වූයේ නිරායාසයෙනි.

එම නාලිකාව ඔස්සේ තමන්ගේ ජ්‍යොතිෂ ඥානය ගැනම පම්පෝරිය සහ පාරට්ටුව දොඩමින්, එක්තරා ලග්නයක (වෘශ්චික) සුභ අසුභ විග්‍රහ කරමින්, කර්මය ඵල දෙන බවද, තමන්ගේ පාපයට වන්දි ගෙවිය යුතු බවට ද බණ දේශනා කළේ ය. ඔහු බුදු දහම සිත්හි තබාගෙන මෙම බණ දහම කීවේ නම් වරදක් කිව නොහැක.

එහෙත් ඔහුගේ ඊළඟ බණ පදය නොදන්නා දෙමළට ගොස් වරිගේ නසා ගත්තා වැනි විය. තමන්ගේ වෘත්තියට මෙන්ම මූලික ශිෂ්ට සම්පන්න චර්යාවන්ටද පටහැනිව හෙතෙම නන් දොඩවමින් කෙළින්ම කිතු දහමේ පරම මූලික හරයක් වන පව් සමාව විවේචනය කළේ ආගමික අන්තවාදින්, ත්‍රස්තවාදින් ද පරයමිනි.

මෙම පුද්ගලයා පුන පුනා කීවේ සමහර ආගම්වල කියන පරිදි, “පව්වලට සමාවක්” කිසිවිටෙක ලබා ගත නොහැකි බවය. නොලැබෙන බවය. එය අමූලික බොරුවක් බවය. ජ්‍යොතිෂය අනුව පව්වලට විපාක ලැබෙන බවය. සාස්තර මහත්තයෝ ජ්‍යොතිෂ මතය ඔබේ විය හැකිය. එහෙත් පව් සමාව ගැන මත පළ කිරීමට ඔබට අයිතියක් නැත.

පාප ක්ෂමාව හෙවත් පව් සමාව කිතුනු අපට සුවිශේෂ වූ දිව්‍ය ආයාදයකි.

දේව ප්‍රසාද නිධානයකි. ලෝකාලෝකය වූ කිතු සමිඳුන් මෙලොවට වැඩියේත් එසේම දුක් විඳ කුරුසිපත්ව මෙම අපූරු පණිවුඩය හෙවත් සුභාරංචිය මනුෂ්‍ය වර්ග යා හට දායාද කිරීමටය. පව් සමාව ලබා ගැනීමේ ක්‍රම වේදයන් කිතු දහමේ පැහැදිලිව දක්වා ඇත.

හද පත්ලෙන් පාපය ගැන මනස්ථාප වීම, යළි පව් නොකිරීමට දෙවි පියාණන්ට පොරොන්දු වීම ආදි මූලික කරුණු කාරණා කීපයකි. ඉන්පසු මහා කාරුණිකවූ අති ප්‍රේමණීය වූ සර්ව සාධාරණ වූ දෙවි පියාණන් වහන්සේ ක්ෂමාව ලබා දෙන සේක. පව් සමාව ලබා ගැනීම, අන්‍ය ආගම්වල මෙන් මන්ත්‍ර ජප කිරීමෙන් වත් ජ්‍යොතිෂ නැකැත් අනුව, පුද පූජා කිරීමෙන්වත් ලබා ගත නොහැක. පාප ක්ෂමාව වනාහි දෙවිපියාණන් වහන්සේගේ සුවිශේෂ අනුග්‍රහ දීමනාවකි.

පව් සමාව නොඉල්ලන, නොපිළිගන්නා, පාපිෂ්ටයා සත්‍ය වශයෙන්ම කරුමක්කාරයෙකි. ඉහත කී ජ්‍යොතිෂකරු කියන්නාක් මෙන් කරුමය (පාපය) ඔහු ලුහු බඳී. ඔහු කියන පරිදි එවිට පව් සමාව ලබා නොගත් පුද්ගලයා සදහටම අස්වැසීමක් හෝ චිත්ත ශාන්තියක් නොලබන අවාසනාවන්තයෙකි.

එසේම ග්‍රහ අපල නිසා වන හානි දෝෂ දුරු කිරීම සඳහා විවිධ ජ්‍යොතිෂවේදින් විසින්, විවිධ දෙවිවරුන්ට පුද පූජා පැවැත්වීම, දන්දීම, විවිධ ශුද්ධවූ ගංගාවල නෑම ආදිය, සිය සේවා දායකයින්ට නිර්දේශ කරන බවද මේ සියල්ල පෙර කර්ම පාප නිසා සිදුවන බවද මෙම සක්විති සාස්තරකරු නොදන්නේ ද?

මෙම පුරසාරම් දොඩන, උද්ධච්ඡ, ජ්‍යොතිෂකරු තවත් වරෙක ජ්‍යොතිෂවේදය ඉතා පැරණි බව ද, මැද පෙරදිග පුරාණ රටක් වූ බැබිලෝනියාවේ “නසර්” නම් රජකු හට අනාගතය ගැන අනාවැකි පළ කළේ “දානියෙල්” නම් දක්ෂ ජ්‍යොතිෂවේදියකු විසින් බවද කියමින් ජ්‍යොතිෂය ගැන පම්පෝරි ගසයි. එහෙත් අප කතා නායකයා ශුද්ධවූ බයිබලයේ පැරණි ගිවිසුමේ දානියෙල්ගේ කථාවේ එන, දෙවිඳුන්ට ලැදි ධර්මිෂ්ටයකුගේ භූමිකාව විකෘති කරයි.

“නසර්” රජුනම් බැබිලෝනියාවේ නෙබුකද්නෙසර් රජු වේ. දානියෙල් යනු නෙබුකද්නෙසර් රජු විසින් ජෙරුසලම යටත් කොට කොල්ලකෑ පසු තම රටට ගෙන ආ ජුදා ජාතික වංශවත් පවුල්වලට අයත් තරුණයින් පිරිස අතර කෙනෙකි.

ඔහු ඉතා බැතිමත් ජුදා දැහැමි තරුණයෙකි. නෙබුකද්නෙසර් රජු, ඔහු දුටු සිහිනයක් නිසා බොහෝ සේ කැළඹී එහි තේරුම හෙළි කරන ලෙස එම රටේ සියලු සාස්තර කාරයින්ට ද, අනවිනකාරයින්ට ද, මායාකාරයින්ට ද අණ කෙළේය.

එහෙත් ඔවුන් කිසිවකුට සිහිනය තේරීමට නොහැකි විය. ඔවුන්ට මරණ දණ්ඩනය නියම වූ කල්හි ඔවුන් බේරා ගත්තේ කිසි දිනෙක ජ්‍යොතිෂවේදියකු නොවූ දානියෙල් නම් දැහැමි තරුණයා විසිනි. ඔහුට සිහිනයේ අභිරහස හෙළි කරගත හැකිවූයේ දෙවියන් වහන්සේට ගැඹුරින් යාච්ඤා කිරීමේ බලයෙනි. මේ නිසාම සර්වබලධාරී දෙවියන් වහන්සේ රජු දුටු සිහිනයේ අභිරහස දානියෙල්ට හෙළි කළ සේක.

ඉන්පසු දානියෙල් දෙවියන් වහන්සේ පසසමින් සකල ප්‍රඥාවත්, බලයත් දෙවිඳුන් සතු බවද, කාලය සහ අවස්ථාවන් වෙනස් කරන්නේ ද, රජවරුන් පහ කරන්නේ ද, ඇනුම සහ නුවණ ලබා දෙන්නේ ද, ගැඹුරු වූ අභිරහස් හෙළි කරන්නේ ද අන්ධකාරයේ ඇති දේ දකින්නේ ද දන්නේ ද එසේම සිසාරා යන මහා ආලෝකය වන්නේ ද සදාකාලික වූ දෙවියන් වහන්සේම බව පවසමින් දෙවි සමිඳාණන්ට මහත් තුති ප්‍රශංසා කළේය.

☛ 15 පිටුවට

වෛද්‍ය නෙල්සන් දයානන්ද වැලිකඩආරච්චි
මීගමුව

# ශ්‍රී ලංකා කතෝලික සභාවේ ප්‍රථම වරට...

**ලංකා කතෝලික ඉතිහාසයේ ප්‍රථම ස්ථානය හිමිවන හෙවත් ප්‍රථම වර වූ සිදුවීම් රැසක් අප ජනතාව ගේ දැනගැනීම සඳහා සටහන් කිරීම මෙම ලිපියේ අරමුණ යි.**

දිවයිනේ රෝමානු පිළිවෙත් අනුව ලතින් බසින් ප්‍රථම දිව්‍ය පූජාව ඔප්පු කරන ලද්දේ ෆ්‍රැන්සිස්කාන නිකායට අයත් වින්සෙන්ටේ පියතුමන් විසින් ය. එය පුද කරන ලද්දේ 1505 අග භාගයේ කොළඹ ඉදිකරන ලද කුඩා දෙව්මැඳුර තුළ ය. ලේඛනගත වී ඇති සැටියට ප්‍රථමවර පවත්වන ලතින් දිව්‍ය පූජාව මෙය වන්නේ ය.

පෘතුගීසින් අල්ලාගත් රටවල් අතර ආසියාවේ පිහිටුවන ලද ප්‍රථම රදගුරු වසම වන්නේ ගෝවේ රදගුරු පදවියයි. එය පිහිටුවන ලද්දේ ක්‍රි.ව. 1534 දී ය. පෘතුගීසි ජාතික ගිහියකු, රදගුරුතුමකු පත්කරනු ලබන තෙක් මෙහි පරිපාලනය ගෙන ගියේ ය. ක්‍රි.ව. 1538 දී ෆ්‍රැන්සිස්කාන නිකායට අයත් ස්පාඤ්ඤ ජාතික අතිග රු ජුවාම් ද ඇල්බකර්ක් හිමිපාණන් රදගුරු වශයෙන් පත් කරන ලදුව පරිපාලකව සිටි මිගෙල් වාස් කුටීනෝ මහතා අනුනායක වශයෙන් පත් විය.

එවකට මුළු දිවයින ම අයත් වූ ප්‍රථම රදගුරු වසම ද මෙය යි.



යටගිය දවස

විශ්‍රාමික අගරදගුරු
අති උතුම්
ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ

188

දිවයිනේ ධර්මදූත කටයුතු සඳහා ක්‍රියාත්මක වී ඇති ප්‍රථම පැවිදි නිකාය ෆ්‍රැන්සිස්කාන නිකාය යි. එතුමන්ලා ක්‍රි.ව. 1543 දී මෙහි එවන ලද්දේ තුන්වැනි ජුවාම් පෘතුගීසි රජු විසිනි. ප්‍රථම වරට සංවිධානාත්මකව ධර්මදූත මෙහෙවරක් අරඹන ලද්දේ ද එම නිකායේ පියවරුන් විසින් ය.

දිවයිනේ ප්‍රථම වරට පැවිදි ජීවිතයට ඇතුළු වී පැවිදි සොයුරියන් වූයේ යාපනය රජකළ පරරාස සේකරන් (1591 සිට 1615 දක්වා) ගේ දියණියන් දෙදෙනා ය. දෝනා ඉසබෙල් සහ දෝනා මරියා ලෙස ගෝවේ නුවර සාන්ත මොනිකා කන්‍යාරාමයේ දී පැවිදි ජීවිතයට ඇතුළු වූ මේ දෙදෙනා අප ප්‍රථම ලාංකික පැවිදි සොහොයුරියන් දෙදෙනා ය.

මෙම පැවිදි සොහොයුරියක හෙවත් දෝන මරියා ගරු බැහැදැකීමේ මරියා සොයුරිය නමින් සාන්ත මොනිකා කන්‍යාරාමයේ ශ්‍රේෂ්ඨ මව්තුමිය (ඇබස්) ලෙසද පත්වුණා ය. මෙවැනි පත්වීමක් ලද ප්‍රථම ලාංකිකයා ඇය යි.

බ්‍රිතාන්‍ය යුගයේ දී දිවයිනට පැමිණි ප්‍රථම යුරෝපීය ධර්මදූතවරයාණන් වූයේ ගරු අන්ද්‍රෙ- ෆ්‍රන්සුආ ඩුමාස් පියතුමා ය. එතුමා දිවයිනට පැමිණියේ ක්‍රි.ව. 1842 මුල් භාගයේ දී ය.

රෝමයේ ධර්මදාන කාර්යංශය මෙහෙයවීමෙන් දිවයිනට එවන ලද ප්‍රථම යුරෝපීය ධර්මදූත පියතුමා වූයේ ඉතාලි ජාතික ගරු ඔරාට්සියෝ බෙට්ටාකීනී පියතුමා ය.

ඉතාලියේ ඔරතෝරියාන නිකායට අයත් මෙතුමා දිවයිනට පැමිණියේ 1842 අග භාගයේ දී ය.

දිවයිනට ප්‍රථමයෙන් පැමිණි සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායට අයත් පියතුමා වූයේ ගරු ජොසෙප්පෙ බ්‍රාවි පියතුමා ය. එතුමා මෙහි පැමිණියේ 1845 අගෝස්තු මාසයේදී ය.

ගැලැවුම්කරුවාණන්ගේ නිකායෙන් හෙවත් රෙඩම්ප්ටොරිස්ට් නිකායේ ධර්මදූත කටයුතු සඳහා ප්‍රථම වරට දිවයිනට පැමිණියේ ගරු ෆ්‍රැන්සිස් සේවියර් මෙන්සේස් පියතුමා ය. ගෝවේ උපන් එතුමා ආසියාවෙන් එම පැවිදි නිකායට බැඳුනු පළමු පියතුමා ද වන්නේ ය.

ප්‍රථම වරට දිවයින තුළ රදගුරු තනතුර දරා ඇත්තේ ඉන්දියාවේ ඔරතෝරියාන නිකායට (ජුසේ වාස් පියතුමා ගේ නිකායට) අයත් අති උතුම් වින්සන්ටෙ ඩො රොසාරියෝ හිමිපාණන් ය. එතුමා ඉන්දියානු ජාතිකයෙකි. දිවයිනේ ප්‍රථම අපෝස්තලික අනුනායක වශයෙන් එතුමන් පත් කරන ලද්දේ ක්‍රි.ව. 1838 දී ය.

ප්‍රථම වරට දිවයිනේ රදගුරු තනතුර ලද යුරෝපීය ධර්මදූතවරයා අති උතුම් ඔරාසියෝ බෙට්ටකිනි හිමිපාණන් ය. එතුමන් ක්‍රි.ව. 1846 දී ලංකාවේ දෙවැනි අපෝස්තලික අනුනායක තනතුර දැරූ ඉන්දියානු ජාතික ඔරතෝරියාන නිකායේ අති උතුම් කයෙටානෝ ඇන්ටෝනියෝ හිමිපාණන් ගේ අනුප්‍රාප්තිකයා ලෙස පත් කරන ලදි.

දිවයින තුළ ම ප්‍රථම වරට රදගුරු අබිසෙස් ලද උත්තමයාණෝ වන සේ අති උතුම් ඔරාසියෝ බෙට්ටකීනි හිමිපාණෝ ය. රදගුරු වරම් ප්‍රදානය කිරීමේ පිළිවෙත් අති උතුම් කයෙටානෝ ඇන්ටෝනියෝ හිමිපාණන් ගේ ප්‍රධානත්වයෙන් කොටහේනේ සා. ලුසියා දෙව්මැඳුරේ දී පවත්වන ලද්දේ 1846 පෙබරවාරි මස 8 වැනි දා ය.

මීට පෙර දිවයිනේ දහම් සේවාව සඳහා පත් කරන ලද රදගුරු හිමිවරුන් දෙදෙනා ම ඉන්දීය ජාතිකයින් වූ නිසා එතුමන් රදගුරු අබිසෙස් ලැබුවේ ඉන්දියාවේ දීම ය.

(මෙම ලිපිය සඳහා දත්ත මාහිම් ඩබ්. එල්. ඒ. දොන් පීටර් පියතුමන් ගේ ග්‍රන්ථ අනුසාරයෙන් ලබා ගත් බව ගුණවත්ව සඳහන් කරමි.)

# ජේසු සමිඳුන් කොතරම් වටිනා චරිතාදර්ශයක් ද?

## වත්තල සා. ජෝශප් විද්‍යාලයීය සිංහල සාහිත්‍ය උලෙළේ දේශනයේදී විශාරද නන්දා මාලිනිය පවසයි

“අහස සේ ඔබ අනන්තයි, සයුර සේ ඔබ අනන්තයි. මේ විශ්වයේ මා දකින්නේ ඔබම පමණයි ඔබ අනන්තයි”

මේ ජේසු සමිඳාණන්ට මගේ උපහාරය ය.

ගරු අදියුරු පියතුමෙනි, නියෝජ්‍ය විදුහල්පතිතුමනි, පැවිදි සොයුරියනි, ගුරු මහත්ම මහත්මියනි, දෙමාපියනි, ආදර පුතනුවනි,

වත්තල සා. ජෝශප් විද්‍යාලයේ 2014 සිංහල සාහිත්‍ය උළෙලෙහි ආරාධිත අමුත්තා ලෙස සහභාගි වීමට ලැබීම ගැන සතුට පළ කරනවා. මගේ දේශනය සැමට ආදර්ශයක් වන ලෙස මගේ ජීවන අත්දැකීම් ඔස්සේ ගොනු කිරීමට අදහස් කළා. අපේ පවුලේ සාමාජිකයන් ගණන නවදෙනයි. මම ඉතා දුප්පත් පවුලක දරුවෙක්. කොටහේන හැටේවත්ත නමින් හැඳින් වූ ප්‍රදේශයේ යි අපි පදිංචිව සිටියේ. ඉතා අඩු පහසුකම් යටතේ ජීවත්වූ අප පෝෂණය කරන්නට මගේ තාත්තා කළේ ඇඳුම් මැසීම, තාත්තාට කිව්වෙ කෝට් බාස් උන්නැහේ කියල. තාත්තා අපිව පෝෂණය කළේ ඉතා අමාරුවෙන්. සමහර දවස්වලට එක බනිස් ගෙඩිය හතරට කපලයි අපි කෑවෙ. හරි හමන් කෑමක් නැහැ. හරිහමන් වස්ත්‍රයක් නැහැ. පයට දාන්ට හරිහමන් සෙරෙප්පු කුට්ටමක් නැහැ. තාත්තා මහන ඇඳුම් ගෙවල්වලට ගිහින් දුන්නේ අපි. ඒ අය අපිව ගත්තේ නැහැ ගේ ඇතුළට. හෙට්ටු කරලා කීයක් හරි දීලා එවනවා. තාත්තා නිදි මරාගෙන ඇඳුම් මැහුවා. තාත්තාට රෑට උණු උණුවේ තේවතුර ටිකක් බොන්න දමා තියන්නට උණු වතුර බෝතලයක් අපේ ගෙදර තිබුණෙ නැහැ.

මා ඉගෙන ගත්තෙ කොටහේන ගුණානන්ද විද්‍යාලයේ මගෙ ජීවිතයෙ දෙවැනි අම්මා මට මුණ ගැසුනේ එතැනදී ඒ මගේ පන්ති භාර මාග්‍රට් පෙරේරා ටීචර්. මම පාසලේ දී මහ හඬින් කවි ගායනා කළා. මේසයට තට්ටු කරමින් තාල ඇල්ලුවා. ටීචර් හඳුනා ගත්තා මගෙ ඇඟ ඇතුළෙ ඉන්නෙ නන්දා මාලිනි නම් වූ ගායිකාව. මට හැකි පමණින් උදව් කළා. ටීචර් ගුවන් විදුලියෙ ළමා මණ්ඩපය භාරව සිටි කරුණාරත්න අබේසේකර මහතා ළඟට මා කැඳවාගෙන ගියා. ගිහින් කිව්වෙ මේ දරුවා අපේ පාසලේ ඉන්න දුප්පත් දරුවෙක්. ගායන හැකියාව ඉහළින්ම තියෙනවා. සර්ට පුළුවන් නම් මේ දරුවාට උදව් කරන්න කියලා. මම හිතන්නෙ මේ කතාව කරුණාරත්න අබේසේකර මහතාගේ සිතට හොඳටම දැනුන කියල. මට ළමා මණ්ඩපයට සහභාගි වීමට අවස්ථාව ලැබුණා. මගේ ගායනා හැකියාව ගැන පැහැදුනු අමරදේව සර් අම්මා තාත්තාගෙන් අවසර අරන් මෙරට මුල්ම වර්ණ චිත්‍රපටය “රන්මුතු දූව” සඳහා ගීතයක් ගායනා කරන්නට අවස්ථාව සලසා දුන්නා. “ගලන ගඟකි ජීවිතේ දයා ලූ ලෝකයේ....” මම “රන්මුතු දූව” සඳහා ගායනා කළ ගීතය. ගීතය එක් රැයකින් ජනප්‍රිය වුණා. මගෙ ජීවිතයේ හැරවුම් ලක්ෂය වූයේ එම ගීතය.

ඉන්දියාවේ විනිශ්ච මණ්ඩලයක් ඉදිරියේ “වඳිමු සුගත ශාක්‍යසිංහ සසර දිනූ බුදු පියා...” ගීතය ගායනා කරමින් ගුවන් විදුලි ශිල්පීන්ගේ ප්‍රමිතිගත කිරීමේ තරගයේ ප්‍රථම ස්ථානය දිනා ගත්තා. එහිදී ජයග්‍රහණය වෙනුවෙන් බොම්බායට ගුවනින් යාමට ලැබුණු ගුවන් ටිකට් පත වෙනුවට මා එම ආයතනයට ගොස් මා හට මුදල් අවශ්‍ය බව පවසා ටිකට් පත මුදලින් ඉල්ලා ගත්තා. එයින් තාත්තා මහන ඇඳුම් මදින පොල්කටු ඉස්තිරික්කය වෙනුවට විදුලි ඉස්තිරික්කයකුත් ගෙදරට විදුලි සැපයුමත් ලබා ගත්තා. ඒ එක්කම රෑට නිදි මරාගෙන ඇඳුම් මහන තාත්තාට උණු උණුවේ තේ වතුර ටිකක්, බීම සඳහා දමා තබන්නට උණුවතුර බෝතලයකුත් ගත්තා. මේ හැම දෙයක්ම කළේ අපි ජීවන මඟ හදා ගන්නේ කොහොමද කියල ඥානයක් මා තුළ තිබූ නිසයි.

අපි ජීවත් වූ හැටේ වත්තේ බෞද්ධ පවුල් සිටියේ ඉතා ස්වල්ප ප්‍රමාණයක්. වැඩි දෙනා කතෝලික අය. එසේ කතෝලික පරිසරයක ජීවත්වීම නිසා මට ඒ අය පුරුදු පුහුණු කරගත් විනය හොඳට පුරුදු වුණා. අපිට කතෝලිකයෝ ගොඩක් උදව් කළා. ජේසු සමිඳාණන් කොයිතරම් වටිනා චරිතයක් ද? කොයි තරම් ප්‍රබල චරිතයක් ද? කියල මා දැනගෙන සිටියා. ඒ නිසයි මම මේ ගීතය ගායනා කළේ,

“රන් රිදී මැණික් නොවීය ඔබ සමීපයේ
දළ පිළි ඉරා දුහුල් නොවී ශරීරයේ
මන්ද මේ විලාසිතා දේව මන්දිරේ
යළි ගලීලයෙන් නැගී මෙලෝ තලේ බලන්
ජේසු ස්වාමිදරුවණේ...
ජේසු ස්වාමිදරුවනේ”

සකස් කළේ
චාන්දනී මුණසිංහ
විද්‍යාලයීය ආචාරිණී

වෙහෙසෙන මිනිස්සු



# කිසිදා පිළුණු නොවන දින දින අලුත් වන කාඩයින් දැක්ම

**ත.ක්‍රි.ක. ව්‍යාපාරයේ නිර්මාතෘ අතිඋතුම් ජෝශප් කාදිනල් කාඩයින් හිමිපාණන්ගේ 132 වැනි ජන්ම සංවත්සරය නොවැම්බර් 13 දාට යෙදින. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**

85 වසක ආයු කාලයක් තුළ 61 වසරක පූජක දිවියක් ගෙවූ කාදිනල් කාර්ඩයින් හිමිපාණන්ගේ පූර්ණ පූජක දිවිය කැප කළේ කම්කරු තරුණ, තරුණියන්ගේ විමුක්තියත්, ගැලවීමත් උදෙසාය. තාරුණ්‍යයේ අගය, වටිනාකම, ගරුත්වය හා ශුද්ධවන්තකම හා එකී ජීවිතය අන් අය වෙනුවෙන් යොමුකරවීම, වැඩි කරවීම තුළින් 'අපි විප්ලවය නොකරමු විප්ලවය අපිම වෙමු' යන සංකල්පය තරුණ විප්ලවවාදීන් තුළට ගලා යෑමට සැලැස් වූවාවූ එවකට තරුණ පූජක තුමකු වූ කාර්ඩයින් පියතුමා යෞවනයින්ට මුල් තැන දෙමින් තරුණ කම්කරු රණ බිමෙහි ස්වකීය පූර්ණ ජීවිතය පූජා කළ අභීත සෙබලෙකි. විශ්ව කතෝලික සභාවේ අග්‍ර සෙනෙවියෙකි.

තම බැටළු රැළ හොඳින් හඳුනන යහපත් එඬේරාණන් වන ක්‍රිස්තුන් වහන්සේ ස්වකීය රැලෙන් අස්ථාන ගත වූ එකම බැටළුවා පසු පස ගොස් එම නැතිවූ සතාව සොයා ගෙන ප්‍රීතියෙන් ඉපිල ඌව කරතබාගෙන ගෙනැවිත් නැවත රැලට එකතු කිරීම තරුණ කිතුනු ව්‍යාපාරයේ එඬේරි ස්වභාවය හා ප්‍රයත්නය පෙන්නුම් කරයි.

නාසරතයේ ජේසුස් වහන්සේ එකිනෙකා වෙතට ගොස් ඔවුන් දැන හැඳිනගෙන ඔවුන් සමග මිත්‍ර වෙමින් මුලින්ම ආරම්භ කළ විප්ලවකාරි ව්‍යාපාරය, නූතන ලොවේ කම්කරු සමූහයා තුළින් නැවත බිහි කිරීමට තරුණ කාර්ඩයින් පිය තුමාව යොමු කළේ ඔහුගේ නිරීක්ෂණයට විමර්ශනයට නොහොත් නිරන්තර පරීක්ෂණ ක්‍රමයට ලක්වූ මිනිස් යථාර්ථය හා ආගම අතර හට ගෙන තුබූ පරස්පර විරෝධතාවය හා ක්‍රමයෙන් පළල් වෙමින් පවතින පරතරයයි.

මිනිසා හා දහම තුළ පවැතිය යුතු සමීප සම්බන්ධතාවය පලුදුවීම එතෙක් පූජක සිසුවෙකුව සිටි තරුණ ජෝශප් කාර්ඩයින්ගේ සිත පාරන්නක් විය. ඔහු එය අවබෝධ කරගත්තේ තමා සමග එකට දිවි ගෙවූ එකට පාසල් ගිය, කෙලි සෙල්ලම් කළ මිතුරන්, ළමා දිවියෙහිදීම කර්මාන්ත ශාලා වලට අවතීරණය වීමෙන් පසු රැකියා පරිසරයේ පවතින නොයෙක් විශමතාවයන්ට ගොදුරුවීම හේතුකොට ගෙන ක්‍රිස්තුන් වහන්සේගේ, සභාවෙහි වත් පිළිවෙත් වලින් හා විශ්වාසයෙන් පවා ඈත් වී සිටීමයි. කම්කරු ජනතාව එදා පූජකවරුන්ව දුටුවේ සාධාරණත්වය පතා නිරන්තර සටනක යෙදී සිටින ශ්‍රමිකයින්ගේ ද්‍රෝහීන් හැටියටය.

බැතිමතුන් 25,000 කින් සමන්විත වූ බ්‍රසල්ස් නුවර නොට්‍රඩෑම් මීසම තුළ ක්‍රියාකාරි වීමට අවස්ථාවන් එමට ඇති බව තරුණ කාර්ඩයින් පියතුමාට පෙනින. එකී මීසම තුළ එතුමාගේ ප්‍රථම ක්‍රියා මාර්ගය වූයේ මීසම්වාසි ජනතාව දැන හැඳින ගැනීමයි. එම සිද්ධාන්තය පදනම්කරගෙන සැම දිනකම උදේ දිව්‍ය පූජාව පැවැත්වීමෙන් පසු මීසමේ ඉතාමත් දිළිඳු, අසරණ මනුෂ්‍යයින් ජීවත්වන, ගරු පියතුමන්ලා සාමාන්‍යයෙන් නොයන සමාජවාදි අදහස් දරණ වැඩ කරන ජනතාව වෙසෙන දිස්ත්‍රික්ක වලට ගොස් ඔවුන් දැන හැඳින ගන්නා ලදි.

හිමිදිරි පාන්දර කම්කරුවන් ස්වකීය කර්මාන්ත ශාලා කරා පිටත්වී යන විට කාර්ඩයින් පියතුමා කර්මාන්ත ශාලාව පැත්තේ සිට කම්කරුවන් මුන ගැසෙන ආකාරයට ඔවුන් ඉදිරියට ඇවිත් ක්‍රම ක්‍රමයෙන් කම්කරුවන් එකිනෙකාට ආචාර කිරීමටත්, ඔවුන් වෙත සිනහවන් පහළ කිරීමටත්, ඔවුන් සමග වචනයක් දෙකක් කථා කිරීමටත් උත්සහ දැරීය. මෙම ක්‍රමයෙන් ඔවුන්ගේ නම, ගම, වැඩ කරන ස්ථානය, පවුල, දරුවන් යනාදි බොහෝ ප්‍රයෝජනවත් විස්තර සොය ාගැනීමට පමණක් නොව, එමගින් කම්කරුවන් හා එතුමා අතර පෞද්ගලික මිත්‍රත්වයක් ඇතිකර ගැනීමට අවස්ථාවක් සැලසින.

ඊට අමතරව කම්කරුවන් දවසේ වැඩ නිම කොට ස්වකීය නිවෙස් බලා පා නගන විටද කර්මාන්ත ශාලාව තිබෙන පැත්ත කරා පිය නගන කම්කරු හිතැති කාර්ඩයින් පියතුමා එලෙසම කම්කරුවන් සමග සම්බන්ධකම් හා මිත්‍රත්වය තහවුරු කර ගන්නා ලදි. විවේකයක් ලැබුනු සැම අවස්ථාවකම කාර්ඩයින් පියතුමා ගෙයක්, ගෙයක් පාසා ගොස් දොරට තට්ටු කර ඒ අය බැහැදැක, ඔවුන්ගේ සුවදුක් විචාරා, ඔවුනට බලපාන ප්‍රශ්න, ගැටලු, රැකියා, වේතන, නිවාස හා කුලි මේ ආදි සැම ප්‍රශ්නයක් ගැනම ඔවුන් සමග කතා බහ කිරීම කාර්ඩයින් පියතුමාගේ දින චරියාවේ විශේෂ අංගයක් විය.

තරුණ කම්කරුවන් සමග ඔවුන් තුළින්, පසු කලෙක කාර්ඩයින් පියතුමා ආරම්භ කළ තරුණ ක්‍රිස්තියානි කම්කරු (ත.ක්‍රි.ක) ව්‍යාපාරයේ 'හමුවන්නන්ගේ ක්‍රමය' නොහොත් අන් අයව දැන හැඳින ගැනීමේ පිළිවෙළ මුලින්ම කාර්ඩයින් පියතුමා වර්ෂ 1912 දී ක්‍රියාවට නැංවූයේ එයාකාරයෙනි. ව්‍යාපාරයේ පැවැත්මට හමුවන්නන් අත්‍යවශ්‍යයි. යහපත් ක්‍රිස්තියානි බලපෑම් ලෝකයට බෙදා හැරෙන්නේ අප අසුරු කරන, අපට හැමදාම මුනගැසෙන හමුවන්නන් මාර්ගයෙනි. ඔවුන් සමග සමීප මිත්‍රත්වයක්, සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමෙනි. කාර්ඩයින් පියතුමා කියන ප්‍රකාර හමුවන්නන් නැති තැන යහපත් බලපෑම් නැත, බඳවා ගැනීමක් නැත, අලුත් වැඩියාවක් නැත. අපෝස්තලික මෙහෙයයක් නැත.

'අපගේ සම්පූර්ණ ජීවිතය තුළදීද, පූජක දිවියේ සැම අවස්ථාවකදි ද අපි සමූහය සමග සමූහයා තුළ මූලිකයින් සෙවිය යුතු වෙමු. පූජක තුමා වෙසෙසින්ම අන් අය සොයා යන්නකු, අන් අයව දැනහැඳින ගන්නකු විය යුතුයි. ඔහු අන් අයගේ ජීවිත පරිවර්තනය කිරීම් කටයුතුයි. කොටස්කරුවකු විය යුතුයි. මෙයයි පූජක වරයේ මෙහෙය. මෙයට අවශ්‍ය ප්‍රති ක්‍රියාව නම් ස්වකීය සම්පූර්ණ ජීවිතය, තිළිණයක් වශයෙන් පූජක මෙහෙය තුළ විමුක්ති දානය සඳහා පුද කිරීමයි. පූජක තුමා ජීවත් විය යුත්තේ වෙසෙසින්ම ස්වකීය බැටළු රැළ සඳහාය. එම නිසා ඔහු තමාගේ බැටළුවන් හරි හැටි හඳුනා ගත යුතුයි. මන්ද ඔහු (පූජක තුමා) දැන ගැනීමට, හැඳින ගැනීමට, රැක ගැනීමට කැපවී සිටින්නකු වන හෙයිනි.

සාදා නිම කළ හෝ කෝවක දමා තැනූ භාණ්ඩයක් ආකාරයෙන් මූලිකයින් ඉබේම පහල නොවේ. මූලිකයින් බිහිවන්නේ ඔවුන් නිසියාකාර පුහුණු කිරීමෙනි.

ක්‍රියාව සමග ක්‍රියාව තුළින් පුහුණු කිරීම වනාහි යමෙකුගේ ජීවිතයට පුහුණුව ලබාදීමේ ඉතාම සරල වූත්, මූලික වූත් ක්‍රමයයි. එමනිසා තරුණ ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය ජීවිතයට පුහුණුව දෙන පාසලක් වන්නේය. ඔවුන් විසින්ම ක්‍රියා කිරීමේ හැකියාවක් ඔවුන් තුළ තිබිය යුතුය. තවද ඔවුන් ඔවුන්ගේම තටු වලින් ඉගිලි පියාසර කළ යුතුය.

සමූහය තුළ පූජකවරය ගත කළ 50 වැනි වියෙහිදි පවා කාර්ඩයින් පියතුමාගෙන් ආදර්ශ පාඨය වූයේ: 'සොයන්න එවිට සම්බ වේ. පළමුව දෙවියන් වහන්සේගේ රාජ්‍යයත්, උන්වහන්සේගේ සාධාරණත්වයත් සොයන්න, එවිට අන් සියලුම දේ ඔබට ලැබෙන්නේය (ලූක් 12:22) යන්නයි. පල්ලියෙන් ඈත් වී සිටි පැල්පත් වාසි කම්කරු පවුල් ක්‍රම ක්‍රමයෙන් ආගමික වතාවත් වලට නැවත හැරී එන ලදි.

පව් කමාව සඳහා ඔවුහු කාර්ඩයින් පියතුමාගේ කොම්සම් කුඩුව වටා රොක් වූහ. සිත් ඇදග න්නා සුළු චතුර දේශකයෙකු වූ කාර්ඩයින් පියතුමා කම්කරු ජනතාවට වැටහෙන ආකාරයට ශුද්ධ වූ සුවිශේෂය පහදා දුනි. ඒ සමගම දේවස්ථානයෙන්, වැඩපොලට හා අවට ලෝකයට සුවිශේෂය රැගෙන යෑමට ඔවුනට අභියෝග කරන ලදි.

"ඔබ අපෝස්තුළුවරුන්ය. මනුෂ්‍යයන් අල්ලන ධීවරයන්ය. මෝලට, කර්මාන්ත ශාලාවට හෝ කාර්යාලයට ක්‍රිස්තුන් වහන්සේ රැගෙන යා හැක්කේ ඔබට පමණි."

වර්ෂ 1925 ශුද්ධවූ වසරේ පාස්කු සමයේ තරුණ ජෝශප් කාර්ඩයින් පියතුමා වතිකාන පුරවරයට ගොස් XI පියුස් ශුධෝත්තම පියතුමන් පෞද්ගලිකව මුනගැසී කම්කරු ජනතාවගේ ගැලවීම සඳහා තමා මැරෙන්නට ලෑස්තියි කියා ප්‍රකාශ කළ අවස්ථාවේ ශුධෝත්තම පියතුමා පැවසුවේ:

"මෙන්න අවසානයේ ජන සමූහයා ගැන මා සමග කථා කිරීමට කෙනෙක් පැමිණ සිටී. 19 වැනි ශත වර්ෂයේ ශුද්ධවූ සභාවට වූ බලවත්ම පාඩුව නම් ශුද්ධ වූ සභාවට කම්කරුවන් නැති වීමයි. ශුද්ධවූ සභාවට කම්කරුවන් අවශ්‍යයි. එමෙන්ම කම්කරුවන්ටද ශුද්ධවූ සභාව අවශ්‍යයි. ඔබ ව්‍යාපාරය අප විසින් ආශිර්වාද කරනවා පමණක් නොව එය අපට අවශ්‍යයි. එය අපගෙ 'ම එකක් හැටියට අපි පිළිගන්නෙමු.

එදා කම්කරු තරුණ තරුණියන් ක්‍රියාවන් තුළින් සූදානම් කළා වූ 20 වැනි ශත වර්ෂයේ පාවුළු අපෝස්තුළු වරයා හා සුපුවතේ ආදර්ශවත් සේවකයා යන විරුදාවලියන් හිමි ජෝශප් කාදිනල් කාර්ඩයින් හිමිපාණන් ක්‍රිස්තුන් වහන්සේගේ දායවන්ත කමින් උසිගන්වනු ලැබ පැවසුවේ:

"ශුභාරංචිය පතළ කිරීම අරභයා ලොවේ අන්තිම කොනට ගොස් අවසාන විනිශ්චය ලැබෙන තෙක් එහි විසීමට මා සූදානමින් සිටිමි" කියාය.

ක්‍රිස්තු ධර්ම ව්‍යාප්ත ව්‍යාපෘතියට හමුවන්නන් සම්බන්ධ කරගැනීම සඳහා ස්වකීය ජීවිත කාලය තුළ ලොව පුරා සංචාරය කිරීම හේතුකොට ගෙන ගොනුකරන ලද තොරතුරු චාරිකා සටහන්, අත්දැකීම් ආදිය අඩංගු පිටු 5,000 කින් සමන්විත වූ වාර්තාවන් විටින් විට ශුද්ධෝත්තම පියවරුන් හා අදාල වතිකාන ලේකම් කාර්යාල වලටද එතුමා සපයා ඇත. ඒ අනුව විශ්මිත වශයෙන් කතෝලික සභාව තුළ විශාල තම මිනිස් සංඛ්‍යාවක් මුන ගැසුණු හා ලෝකය පිළිබඳව හසල දැනුමක් ඇති පුද්ගලයකු වශයෙන් රෝමයේ එතුමාට පිළිගැනීමක් තිබිණ.

**විවියන් සිල්වා**

# අනියම් සේවකයකු යනු කවුද? ඔහුට කිසිදු වරප්‍රසාදයක් හිමි නැද්ද?



ඔබට කම්කරු නීතිය

නීතිඥ රංජිත් පිගේරා

සාමාන්‍ය ජනතාව අතර 'අනියම්' සේවකයා යන වචනය එතරම් හුරුපුරුදු වචනයක් නොවේ. ඔවුනට හුරුපුරුදු වචනය වන්නේ 'කැෂුවල්' අපට කිසිදු අයිතිවාසිකම් හිමි නොමැති බවයි. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන කිසිදු කම්කරු පනතක හෝ වෙනත් කිසිදු පනතක අනියම් සේවකයා කවුරුද යන්න නිර්වචනයක් සිදු කර නැත.

එම නිසා අනියම් සේවකයා යන්න විග්‍රහ කිරීමේදී ඉතා ව්‍යාකූල සහ නිශ්චිත පිළිතුරක් ලබාදීමේ අපහසුතාවයක් උදාවී ඇත. එම හේතුව නිසාම අනියම් සේවකයා කවුරුද යන්න පහසුවෙන් එක්වර හඳුනාග ැනීමේ ක්‍රමයක්ද නැත. ඉතාම සරල ලෙස අනියම් සේවකයකු හැඳින්විය හැක්කේ ඔහු සේවා ගිවිසුමක් නොමැතිව අහම්බෙන් සේවයේ යෙදවූ අයෙකු ලෙසයි.

කිසියම් ආයතනයක සේවකයකුට පවරා ඇති වැඩ වල ස්වභාවය සලකා බැලීමේදී ඒවා ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරයට අදාල නොවේ නම් හා සේවකයාට අනියම් ලෙස වැඩ පවරා ඇත්නම්, සේවයේ යොදවා ඇති කාල සීමාව ඉතා කෙටි නම් එම සේවකයා අනියම් සේවකයකු ලෙස සැලකිය හැක. එහෙත් සේවකයා නිරත වූ සේවය ප්‍රධාන ව්‍යාපාරයට අදාලව නම් හා සේවා කාලය දීර්ඝ නම් එම සේවකයා අනියම් සේවකයකු ලෙස සැලකිය නොහැකිය. එලෙසම සේවකයකු දිනපතා වැඩට කැඳවා ඔහුට ආයතනයේ වගකීම පවරා ඔහුගේ රැකියාවට අදාලව පුහුණු වීම් ලබාදී තිබීම, ඔහුගේ නම වැටුප් ලේඛනවල අන්තර්ගත කර තිබීම ආදිය මගින් පිළිබිඹු වන්නේ ඔහු අනියම් සේවකයකු නොවන බවය. එහෙත් සේවකයාට දෛනික හෝ සති වැටුප් ගෙවීම, ඔහුගේ නම වැටුප් ලේඛනවල සඳහන්වීම නොවීම යන කරුණු අනියම් සේවකභාවයට සාක්ෂි දරන කරුණු වේ.

සත්‍ය අනියම් සේවකයකුට දිනපතා හාම්පුතා වැඩ දෙනු ඇතැයි බලාපොරොත්තු වීමේ අයිතියක් නැති අතර එලෙසම හාම්පුතාද සේවකයා සැමදා සේවයට පැමිණෙනු ඇතැයි අපේක්ෂා කළ යුතු නොවේ. අනියම් සේවකයකු සේවයට කැඳවනු ලැබිය හැක්කේ වැඩ තිබුණොත් පමණි. වැඩ නොමැති නම් ඔහුට සේවය නොදී ඔහුව පිටත් කර හැරිය හැකිය. තවද ඔහු පැමිණ නිශ්චිත වැඩ කොටසක් පමණක් ඉටුකර ආයතනයෙන් පිටවී යාමේ හැකියාවද ඔහුට ඇත. මේ අනුව ඉහත විස්තර කළ පරිදි සේවකයකු අනියම්ද නැද්ද යන්න එම සේවකයාට ආවේණික කරුණු කාරණා මත නිගමනය කළ යුතු කරුණක් බව පැහැදිලිය. එසේ නැතහොත් හාම්පුතා විසින් සේවකයා වෙත අලවනු ලබන අනියම් සේවකයා යන 'ලේබලය' තීරණාත්මක සාධකයක් නොවේ. එලෙසම යම් සේවකයකු ඔහුගේ නොවැටහීම මත ඔහු අනියම් යැයි සිතා සිටියද එයද අදාල නොවේ. මෙම තත්ත්වය යටතේ සේවකයකු අනියම්ද නැද්ද තීරණය කිරීමේදී අප ගුරු කොට ගත යුත්තේ ඉහළ අධිකරණ තීරණ වලින් ලද පැහැදිලි කිරීම්ය. එනම් අප රටේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රශ්නගත කරුණු වලදී ගත් තීරණ පරික්ෂා කර බැලීමයි.

පැරණි නඩුවක් වන රත්න සභාපති එදිරිව ඇසිලින් නෝනා (61 NLR 548) යන නඩුවේදී ප්‍රශ්නගත කරුණු වූයේ දිනපතා සති 4 ක් නිවස පින්තාරු කිරීමට පැමිණි සේවකයකු ඉනිමග කින් වැටී මිය යාමයි. මෙහිදි ඉදිරිපත් වූ සාක්ෂි අනුව එම සේවකයා අනියම් සේවකයකු නොව ස්ථිර සේවකයකු බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදි.

එලෙසම මෙරිල් ප්‍රනාන්දු සහ සමාගම එදිරිව ඩීමන් සිංඤෝ (1982 2 SLR 242) නඩුවේ ප්‍රශ්නගත කරුණවූයේ ලොරි රියදුරකුගේ සේවය අවසන් කිරීමයි. මෙම නඩුවේදී ඉදිරිපත් වු සාක්ෂි අනුව මෙම සේවකයා අවුරුදු 3 ක වැඩි කාලයක් සේවය කර තිබූ බව තහවුරු වුවද ඔහු සේවයට කැඳවා ඇත්තේ වැඩ තිබූ අවස්ථාවලදී පමණක් වීම හා ඔහුට දෛනික වැටුප් ගෙවීම යන කරුණු සැලකිල්ලට ගෙන මෙම සේවකයා අනියම් සේවකයකු බවට අධිකරණය තීරනය කර ඇත. අධිකාරි, පුස්සැල්ල රාජ්‍ය වැවිලි සංස්ථාව එදිරිව ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය (1997 1 SLR 108.) මෙම නඩුවේදී සේවකයා මුලින්ම තාවකාලික පදනම මත සේවයට බඳවාගෙන පසුව අනියම් පදනම මත සේවය ලබාගෙන ඇති බවට කරුණු ඉදිරිපත් විය. තවද ඉල්ලුම්කරුට මාසික වැටුප ගෙවූ බවද වෘත්තිය සමිතියට දායක මුදල් අයකර ගෙන ඇති බව, සුභසාධක සමිතියට දායකත්වය ලබාදීම සහ සේවකයා ආයතනයේ වැඩ කළ දින 173 ක කාලයද සලකා බලා මෙම සේවකයා ස්ථිර සේවකයකු බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේය. මෙහිදි වැඩිදුරටත් අධිකරණය ප්‍රකාශ කළේ හාම්පුතා සේවකයා අනියම් සේවකයකු ලෙස හඳුන්වා තිබීම තීරණාත්මක සාධකයක් නොවන බවයි.

**මතු සම්බන්ධයි....**

දැල්වෙන පහන්

ගරු කේ. විලියම් පෙරේරා නි.ම.නි පියතුමාගේ 110 වෙනි ජම්ම දිනය නිමිත්තෙනි

# පූජක දිවියෙන් සැමට ආදර්ශයක් වූ පියනමක්

**එදා ක්‍රි.ව. 1904 නොවැම්බර් (ඉල්) මස 04 වෙනි දිනවිය. බිළිඳු පුත් කුමරෙක් කඳාන නැඳුරුපිටිය ගම් පියසේ මෙලොව එළිය දුටුවේය. කේ. බස්තියන් පෙරේරා ඔහුගේ පියාවූ අතර, ජොහානාහාමි මව වූවාය. සොහොයුරන් සතර (04) දෙනෙකුගෙන් සහ සොහොයුරියන් දෙදෙනෙකුගෙන් (02) සමන්විත මෙ පවුලේ පස් වැනි දරුවා විලියම් නම් විය. ඔහු සීදේවි හුරු බුහුටි සුරතල් පුතකු විය.**

මෙම විලියම් පුත් කුමරුගේ පාසල් යන වයස එළඹීමත් සමග, ශුද්ධවූ වීරවර සෙබස්තියන් මුනිඳුන්ගේ පාසෙවනේ පිහිටි සිංහල පාසලේ සිය මූලික අධ්‍යාපනය ලැබීය. වයසින් මුහුකුරායත්ම, මිහිපිට දේව රාජ්‍යය පතුරුවාලීමේ හැකියාව ඔහු තුළින් දිස්වන්නට විය.

පළමු ලෝක යුද්ධ සංග්‍රාමය අගභාගයේදී එම දේවස්ථානයේ සහකාර මීසම පාලක ලෙස සේවය කළේ මෘදු කරුණාවන්ත ගරු ඒ. එම්. බී. ජයමාන්න නි.ම.නි පියතුමන්ය. එතුමන්ගේ යාච්ඤා ජීවිතය හා දෙවිඳුන් තුළ කැපවීම තරුණ විලියම්ගේ සිත බැඳ ගත්තේය. එය ඔස්සේ ඔහුගේ ගමන් මගද හැඩගැසෙන්නට විය.

ස්වර්ගීය පිනිබිඳුමෙන් දේව කැඳවීම යෞවන වියේ පසුවූ විලියම් වෙත පතිත විය. මෙම දරුවා බාලවියේ සිටම පූජා උදව් සහයකයකු වී ගරු ජයමාන්න පියතුමන්ගේ සිත බැඳ ගත්තේය. එකී පියතුමන් මෙහෙය වූ ගායනා කණ්ඩායමටද ඔහු එක්විය. එතුමන්ගේ නොමඳ සහයෝගය ලබා ගනිමින්, සංගීතය හැදෑරීමට ද ඔහුහට අවස්ථාව උදාවිය. මෙම දරුවාගේ යහපත් කල් ක්‍රියාව හා හික්මීම හඳුනාගත් ගරු ජයමාන්න මීසම පාලක පියතුමන් එඩිතර වී ඔහු දේව සේවය සඳහා ධෛර්යමත් කරවන්නට විය.

එහි ප්‍රතිඵලයක් ලෙසින් වර්ෂ 1919 දී සාන්ත ඇලෝෂියස් කුඩා සෙමනේරියට ඇතුලත් වීමෙන් පසු උසස් අධ්‍යාපනය ලබාගැනුම සඳහා එතැනින් සාන්ත ජෝශප් විදුහල වෙත පානැගීය. තැන්පත් ගතියෙන් හා ප්‍රියමනාප පෙනුමෙන් යුතු යෞවන විලියම්ගේ මුහුණ තුළින් දේව කැඳවීමේ සේයා තව තවත් ඔප්නැංවින. ගරු ජයමාන්න පියතුමන් ඔහු දිරිගන්වයි. විලියම් තරුණයා ඔහුට අවනතවෙයි. භාග්‍යයකි. මෙනිසාවෙන් වර්ෂ 1926 දී සාන්ත බර්නාඩ් මහා සෙමනේරියට විලියම් ඇතුලත් විය. දෙවසරක් තුළ දර්ශන විද්‍යාව හැදෑරීය. 1928 වසරේදී නිමල මරිය නිකායික සෙමනේරියට (Novitiate) විශේෂ පූජක පුහුණුව සඳහා ඇතුළත්වී, වර්ෂ 1929 දී නැවතත් සාන්ත බර්නාඩ් දෙව්සත්හල වෙත ගොස් දේව ධර්ම ශාස්ත්‍රය හදාරා, 1931 වසරේදී පූජාත්වරය ලබා තවත් වැඩිදුර වසරක අධ්‍යාපනය ලබා එය වඩාත් ඔපමට්ටම් කර ගනිමින්, වර්ෂ 1932 දෙසැම්බර් මස මීසම් සේවය සඳහා දෙව්සත්හලින් සමුගත්තේ ගරු කේ. විලියම් පෙරේරා නි.ම.නි පූජාප්‍රසාදීන් වහන්සේ ලෙස පූජක සංඝයට ඇතුලත් වෙමින් සමිඳු මිදි උයනේ එළ දරන මිදි අත්තක් වෙමිනි.

ප්‍රථමයෙන් සහයක පියතුමෙක් ලෙස පූජක අඹරේ තෙවසරක් පමණ කෙටි කාලයකින් ඉක්බිති, මීසම් පාලක පියතුමකු වශයෙන් මීසම් රාශියක සේවය කොට ඇත. එලෙසින් සේවය කරන ලද මීසම් අතර, වේයන්ගො ඩ, බෝනාමෝටේ දෙව්මැඳුර (උසාවිය පාර) කොටුගොඩ, තරාල, එඬේරමුල්ල මීසම් සමගින් ජාඇල මීසම ප්‍රධානත්වය ඉසිලින. එලෙස සනිටුහන් කරනුයේ අප සුපෙම්බර වික්ෂෝප දේවමාතා වහන්සේ කෙරෙහි දැක්වූ භක්ත්‍යාදරය හා ගෞරවය අති විශේෂිතාකාරයෙන් ඉස්මතු වූ නිසාවෙනි. ශරීර සෞඛ්‍ය පිරිහීම හේතුකොටගෙන රෝගීවූ ගරු විලියම් පියා, මග්ගො න සාන්ත විසෙන්ති නිවාසය වෙත යවන ලද්දේ විවේකීව සැඳෑ සමය සුවපහසුවෙන් ගතකිරීම පිණිස බව කිව යුතුමය.

මීසම් සේවය එතරම්ම ලෙහෙසි පහසු කාර්යයක් නොවුවත්, ගරු විලියම් පියනම හට එය අරුමයක් නොවිය. ඊට හේතු සාධක වූයේ එතුමන්ගේ පූජක දිවිය තුළින් දෙවියන් දිස්වීමය. එබැවින් 'සීදේවි' යන නාමය විලියම් නමට එක්විය. පසුකාලයේදී කවුරුන් විසිනුත් එතුමන් ඇමතුවේ 'සීදේවි විලියම් ස්වාමි' යනුවෙනි. දේව භක්තිය මුසුවූ වදන් තුළ ආකර්ෂන ශක්තිය පෙරදැරිවිය. එතුමන් මීසම් වාසීන්ගේ හද තුළ ලැගුම් ගත්තේ නිතැතිනි. ලොකු කුඩා, බාල මහළු කොයිකා අතරත් පැහැදීමක් හා ලෙන්ගතු කමක් රජවිය. එනිසාවෙන් සියල්ලෝම එතුමන් ඉදිරියේ දපණ වැටුනි. එතුමන් වටා එක්රොක්වූ සමහර සැරපරුෂ පුද්ගලයන් පවා විලියම් පියාගේ හඬට කන්දුනි. අවවාදයට වඩා ආදර්ශය උතුම් කොට සලකමින් ක්‍රියා කිරීම උන්වහන්සේගේ සාර්ථකත්වයේ ප්‍රතිමූර්තිය විය. 'ඔවා දෙනු පරහට තමා සම්මතයේ පිහිටා සිට' යනු අකුරටම පිළිගත් විලියම් පියා කා අතරත් ජනප්‍රිය වීමට හේතු යුක්ත විය.

නව දෙව්මැඳුරු පාඨශාලා ඉදිකිරීම පැරණි දේවස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම, දැකුම් කළු නිර්මාණ ඇති කිරීම හා මෙකී නොකී සියල්ලෙහි නිමග නවීමෙහිලා අතිදක්ෂයෙක් විය. මෙවන් කරුණු සාක්ෂාත් කර ගැනුම සඳහා මුදල් සොයා ගැනීමේ මැෂිම උන්වහන්සේම විය. කොයියම් පුද්ගලයෙක්වූවත් විලියම් පියා ප්‍රතික්ෂේප නොකරන ලදි.

කුමරි මරියාවන් කෙරෙහි ගැඹුරු විශ්වාසයක් හා භක්ත්‍යාදරයක් ගරු විලියම් පියා සතුවිය. එතුමන් විසින් ජාඇල මීසම් සේවක පියතුමන් ලෙස පාලනය කළ සමයේ ආරම්භ කළ වික්ෂෝප දේවමාතා නොවාන බැතිය ඊට කදිම නිදසුනකි. ඒ සමගින් ජාඇල කල්වාරි කඳු මුදුනේ දිස්වන ප්‍රධාන පාස්කු මඩුව කළු ගලින් ගොඩනගා නිම කිරීම විලියම් පිය ස්මාරකයක්වේ.

එතුමන් කළ මෙවන් අනගි සේවාවන් අගයමින්, ඉකුත්දා පවත්වන්නට යෙදුන දෙදහස් (2,000) වැනි නොවාන සංවත්සර දිනයේදී ජාඇල දුම්රිය පොළ පාර 'ගරු විලියම් පෙරේරා පිය මාවත යනුවෙන් නම් කිරීම අතිඋතුම් මැක්ස්වෙල් සිල්වා, කොළඹ අගරදගුරු පදවි සහයක රදගුරු හිම්පාණන් විසින් සිදුකිරීම එකී පියනම හට කරන ලද උපහාරයක්ම විය.

තවද, දුප්පතුන් හට පිහිටවීම ගරු විලියම් පෙරේරා පියතුමන් සතුවූ මහඟු දෙව්ඳු ගුණාංග යක් විය. කිතු සමිඳුන් වදාළ පරිදි 'දකුණතින් දුන්දේ වමතට නොගව' සනාථ කරවමින් කළ සියලු උදව් උපකාර රහසිගත විය. යමක් ඉල්ලූ කිසිවෙක් හිස් අතින් නොගිය බව නම් සහතිකය. තම ජීවිත ප්‍රශ්න ගැන අවවාද අනුශාසනා ලබා ගැනුම සඳහා විලියම් පියා සොයා ආ කිසිවෙක් නිසි පිළිතුරු නොලබා ආපසු ගියේ නැත. ලද සිත් සැහැල්ලුව ඔවුනට මහමෙරක් විය.

දෙව් සමිඳුන්ගේ මිදි උයනේ සේවය සඳහා යොමුකළ අයද වේ. එවන් අය අතරින්, වර්තමානයේ පූජක අඹරේ සුදිලෙන ගරු බෙනඩික් ජෝශප් පියනම ද වේ. වරක් එතුමන් පැවසුවේ සාන්තුවරයකු මෙන් දිස්වූ ගරු විලියම් පියතුමන්ගේ මාර්ගෙ ෝපදේශකත්වය එතුමන් පූජක දිවියට පිටිවහලක් වූ බවය. එදා තම ජූජක සගයන් 'හලෝ ෆාදර් විලී' යනුවෙන් ආමන්ත්‍රනය කරනු ලැබුයේ හද බැඳි ආදරය නිසාවෙනි. ඔවුන් කා අතරත් විලියම් පියා එතරම් ජනප්‍රිය සුහදයෙක්ම විය. අප අසා ඇති පරිදි සමහර පූජාප්‍රසාදීන් වහන්සේලා පවා සමගි සංධානය සඳහා ගරු විලියම් පියා හමුවට පැමුණුන බව කියැවේ. එතුමන් තුළ තිබූ සාන්තුවර භාවය මින් මොනවට සාක්ෂාත් කෙරේ.

රදගුරු හිම්පාණන් වහන්සේලා හට මෙන්ම අප සභා ශ්‍රේෂ්ඨයන් හටද කීකරු වූ ගරු විලියම් පියා, කීකරුකමේ ප්‍රතිමූර්තියක්ම විය. තම පූජක සංඝය තුළ එතුමන් ජනප්‍රිය වීමට එයද හේතු යුක්තවූවාට සැක නැත. මිනිස් ගෞරවය රැකීමට ඇප කැප විය. කිසිවෙක් හෙලා නුදුටු, විවේචනය නොකළ විලියම් පියා, සැම දෙනාවම අගය කළේය.

උපත මරණයට නෑකම් කීම වේ

එදා 1976 වසර විය. එකී වසරේ ජාතික නිදහස සමරන්නට ලක ලැහැස්ති වෙමින් සිටිය දිනට පෙර දින විය. එනම්, පෙබරවාරි (නවම්) මස 03 වෙනි දින සෝචනීය පුවතක් අසන්නට ලැබිණ. එනම්, 'සීදේවි' යන විරුදාවලි නම් ලත්, කනුගලවත්තගේ විලියම් පෙරේරා නි.ම.නි ගරු පියතුමන් ස්වර්ගස්ථ වූ වගයි.

මරණය සැමට නියත වුවත්, විශේෂකොට ජාඇල මීසම් වාසීන් හට මෙය නම් ඉමහත් දුක්මුසු පුවතක්ම විය. වසර අටක (08) පමණ කාලයක් තුළ අති විශිෂ්ට සේවයක් කළ මෙතුමා, සැත්තෑ දෙවසරක් (72) ආයු වළඳා ඉන් හතලිස් හතර (44) වසරක්ම දේව සේවයට කැපවෙමින්, සමිඳු මිදි උයනේ අඛණ්ඩව නියැලින. දෙව්ඳු අභිමතයට හිසනමා අවසන් හුස්ම හෙළූ බව කන වැකුනු ජාඇල ජනතාවගේ දෙනෙත් කඳුලින් බරවීම අරුමයක් නොවේ.

අප සභා නියමුවෝ ගරු විලියම් පියා පිළිබඳව අභිමානවත් හැඟීමක් දැක්වූහ. මෙනිසාමැයි ගරු විලියම් පියතුමන් කතෝලික සභාවෙන් මෙන්ම, දැයෙන් සමුගනිමින්, එතුමන් මිහිදන් කළ 1976.02.04 වෙනි දින ඊට සහභාගිවූ අතිඋතුම් එඩ්මන්ඩ් ජේ. ප්‍රනාන්දු සහ අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිම්පාණන් වහන්සේලා දෙනමගේ පැමිණීම සාක්ෂාත් කළේ එදින දේව මෙහෙයන් හා අවසන් කටයුතු එතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් සිදුකිරීම ගරු විලියම් පියා වෙත දැක්වූ ඉමහත් භක්ත්‍යාදරයක්ම විය. මේ අතර ගිහි පැවිදි අති විශාල ජනකායකගේ සහභාගිවීම්ද විලියම් පියා වෙත දැක්වූ ගෞරවයකි.

අවසානයේදී වික්ෂෝප දෙව්මව් පියස්සේ සාන්ධාර කුළුන අසල ගරු විලියම් පිය දේහය මිහිදන් කිරීම සිදුවිය. මෙය එතුමන් සිය ජීවිත කාලයේදී කරන ලද ඉල්ලීමක් පසක් කරවීමකි. මෙයින් එතුමන් වික්ෂෝප මෑණියන් කෙරෙහි තිබූ තිරසාර විශ්වාසය හා භක්ති ආදරය මොනවට පිළිබිඹු කෙරේ.

දේව අම්මා සමගින් දේව අභිමුවේ සිට තුති ගී ගයමින් දෙව්ඳු පසසන්නට විලියම් නම් වූ පූජාප්‍රසාදින් වහන්සේ හට සමිඳු වරම් ලැබේවා! ස්වර්ගස්ථ ගෞරවණීය කේ. විලියම් පෙරේරා පියතුමන් ඔබගේ 110 වෙනි ජම්ම දිනය වෙනුවෙන් ලියැවුන මෙය ඔබ හට පුෂ්පෝපහාරයක්ම වේවා!

**එල්. එස්. නෙල්සන් ප්‍රනාන්දු**
හිටපු අන්නවි - ජාඇල

# පවුල් සේවා අපෝස්තලික සේවාවේ දිදුල පහන් ටැඹක්

**වර්ෂ 1948 අප්‍රේල් මස 18 වැනි දින කැළණිය පිලපිටියේ විසූ පලිහවඩන ආරච්චිගේ ජස්ටින් පෙරේරා සහ හෙලන් හිල්ඩා කුලතුංග යුවලගේ වැඩිමහල් දියණිය ලෙස මෙලොව එළිය දුටු ජොයිස් වික්‍රමසිංහ (විවාහයට පෙර පෙරේරා) මහත්මිය කැළණිය පිලපිටිය ශාන්ත ආනා දෙව්මැඳුරට සම්බන්ධ කිතුනු සංඝය තුළ ක්‍රියාකාරි සමාජිකාවක් ලෙස වර්ෂ 2009 අගෝස්තු මස 22 දින මොක්සුව සඳහා කැඳවනු ලබන තුරු විවිධාකාර සේවා කටයුතු ඉටුකළ තැනැත්තියකි. එතරම් දීර්ඝ නොවූ එතුමියගේ ජීවිත කාලය තුළ සමිඳුන් සමග ගමන් කරමින් කිතුනු සාක්ෂිය පෙරදැරි කරගෙන කළ කටයුතු වලින් බිඳක් ඉස්මතුකර දැක්වීමට මේ යෝග්‍ය අවස්ථාවකැයි හැඟේ.**

පිලපිටිය ශාන්ත ආනා දෙව්මැඳුරේ අන්නවි සහ ගායනා කණ්ඩායම භාරව කටයුතු කළ ඇගේ පියාගේ අඩිපාරේ යමින් ඇයද කුඩාකල සිටම දෙව්මැඳුර හා සංඝය ආශ්‍රිත නන් ආකාර සේවාවන්ට සම්බන්ධව කටයුතු කළාය. දේවස්ථානයේ ඕගන් වාදනය හා ගායනා කණ්ඩායමේ ක්‍රියාකාරි සාමාජිකාවක් ලෙස රෝගාතුර වනතෙක්ම රෝග යෙන් සුවය ලැබූ අතරතුර කාලවලදීත් නොකඩවා මරණය දක්වා සේවය කළාය.

කැලණිය ශාන්ත පාවුලු විදුහලේ අධ්‍යාපනය ලැබූ ඇය තරුණ දහම් ගුරුවරියක ලෙස තම ග්‍රාමයේ බාල දරු දැරියන් හට ක්‍රිස්තුදානය කිරීමේ සේවාවෙහි ඉතා උද්යෝගිමත්ව නියැලුනාය.

1972 මැයි මස 31 වන දින ඇන්ටන් වික්‍රමසිංහ මහතා සමග විවාහ දිවියට පා තැබූ ඇය තම විවාහ ජීවිතය සේවා කටයුතු වලට බාධාවක් කර නොගත්තා පමණක් නොව වඩාත් දිරිමත්ව විවිධ ක්ෂේත්‍රයන්හි සේවා කටයුතු ඉටුකිරීමට නව පන්නරයක් ලබා කිතුනු සාක්ෂිය තව තවත් තීව්‍ර කිරීමට ස්වකීය විවාහය හැරවුම් ලක්ෂයක් කරගත්තාය. දියණියන් දෙදෙනෙකුගේ මවක ලෙස තම පවුලේ යුතුකම් හරියාකාර ඉටුකරන අතරම දියණියන්ගේ ජීවිතාභිවර්ධනය සඳහා තම වගකීම් නොපිරිහෙලා ඉටුකිරීමට තම සේවා කටයුතු ඇය බාධාවක් කර නොගත්තාය.

තම ග්‍රාමය තුළ දහම් සේවා කටයුතු වලට අමතරව දිව්‍ය හෘදය සමිතියේ ක්‍රියාකාරි සමාජිකත්වය දරමින් එහි ලේකම් ධූරයේද වගකීම් නිසි ලෙස ඉටුකළාය. පිලපිටිය සංඝයතුළ ජනවන්දනාව අර්ථවත් කිරීම සඳහා මීසම්



සේවක පියතුමනට සහය ලබාදුන්නාය. වරින් වර උපදේශන සේවාවල යෙදුනු ඇය බන්ධනාගාර හා රෝහල් බැහැදැකීමද තම කාර්යයක් බවට පත්කර ගත්තාය. ප්‍රීති පුර ආබාධ සහිත දරුවන් ගැන සැලකිල්ලක් දැක්වීමත් ඔවුන්ගේ දෙමාපියන් හට දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිමත් ඇගේ තවත් වටිනා සේවයකි.

කොළඹ පදවියේ පවුල් සේවා අංශයේ ක්‍රියාකාරීන් ලෙස පුහුණුව ලබා බොනිෆස් මෙන්ඩිස් පියතුමාද සමග මීසමෙන් පටන්ගත් සේවාව රීඩ් ෂෙල්ටන් පියතුමා හා රෙජිනෝල්ඩ් සපරමාදු පියතුමාගේද දිරිගැන්වීම මත කොළඹ පදවියේ පමණක් නොව දිවයිනේ නා නා ස්ථාන වලට ලබාදීම සඳහා යුවලක් ලෙස ජොයිස් තම සැමියාද සමගින් සහභාගි වූවාය.

වසර 25 ක් තුළ අඛණ්ඩව විවාහ අපේක්ෂක හමු පැවැත්වීමටත් ඇය සහය වූවාය. ඇය විසින් ඉටුකරන ලද පවුල් සේවා කටයුතු අතරට ගොඩ්වින් මැන්දිස් මහත්මාගේ මෙහෙයවීම යටතේ වැන්දඹු සේවා කටයුතුද ඇතුලත් විය. ගබ්සාවට එරෙහි හදගැස්මක් සමාජය තුළ ඇති කිරීමේ උනන්දුවක්ද ඒ අතර විය.

මෙලෙස පිලපිටිය ග්‍රාමයෙන් පටන්ගෙන කොළඹ පදවියෙන් දිවියින පුරා විවිධ ස්ථාන වලත් ඇය විසින් සලසන ලද සේවය නිසා ඇගේ ජීවිතයම එකම දේව ප්‍රශංසාවක් වූ බව නිසැකය.

# දහම්ගුරු සේවිකාව සග සුව දිනයි



මාකවිට මීසමේ පුරා අවුරුදු තිහක් දහම්ගුරු සේවිකාවක් වශයෙන් සේවය කළ මාකවිට ප්‍රදේශයේ ආගමික හා සමාජීය විරෝදාර මාතාවක වන මාකවිට ඇලෙක්සැන්ඩ්‍රා ජයකොඩි මහත්මිය පුරා අවුරුදු හැට අටක් ආයුවළඳා තම ජීවිතය දෙවිඳුනට පුදන ලදි. මාකවිට දෙව්මැඳුර ඉදිරිපිට ජීවත්වෙමින් මාකවිට දෙව්මැඳුරට පැමිණෙන මීසම් පාලක පියවරුන් තනි නොකර ඔවුන් ආරක්ෂාකර ගනිමින් නිතර දුක සැප බලමින් කටයුතු කරන්නේ මෙම ජයකොඩි පවුලයි. ප්‍රදීප පත්‍රයට කෙටි වාර්තා සපයමින් තම ජනතාවට ප්‍රවෘත්ති ලබාදුන් සිසිල් ජයකොඩි මැගේ ආදර ස්වාමි පුරුෂයාද දැනට වර්ෂ තුනකට පෙර මෙලොව ජීවිතයෙන් සමුගති. ජයකොඩි මහත්මිය මාකවිට මරිය හමුදාව ආරම්භකරමින් එහි පළමු සභාපතිවරියද වූවාය. තුඩැල්ල පාලක සභාපති, උප සභාපති, භාණ්ඩාගාරික නිලයන් ද දැරීය. ඇලෙක්සැන්ඩ්‍රා මහත්මිය මාකවිට මරියහමුදාව ආරම්භ කිරීමට පුරෝගාමී වූවාය. දහම් පාසල මරිය හමුදාව දිව්‍ය සත්ප්‍රසාද සමිතිවල සේවා රැසක් ඉටුකරමින් සිටියදි රෝගාතුරවිය. කලාවැව විජිතපුර ශාන්ත ආනා මෑණියන්ගේ දෙව්මැඳුරේ කටයුතුවලට දායකවෙමින් මේ වර්ෂයේ අගෝස්තු මාසයේදි එහි වාර්ෂික මංගල්ලයට සහභාගිවූවාය. ඇගේ අවසාන කටයුතු මාකවිට දිව්‍ය ගැලවුම්කරු දෙව්මැඳුරු සුසාන භූමියේදී සැමගේ සෝසුසුම් මැද සැප්තැම්බර් 14 දින සිදුවිය.

**බෙන්ජමින් කිරිහෙට්ටි**

## ගරු හැරි මිලර්.. 1 පිටුවෙන්

පසුගිය වර්ෂ 66 පුරා අධ්‍යාපනඥයකු, පියතුමෙක් සහ මානව හිමිකම් ආරක්ෂකයකු හා සමාජ සාධාරණය සඳහා ක්‍රියා කරන්නෙක් වශයෙන් රටෙහි ප්‍රසිද්ධියට පත්විය. පසුකාලීනව ප්‍රචණ්ඩකාරී තත්ත්වය සහ යුද්ධය ඇතිවීමෙන් පසුව එතුමා මඩකලපුව සාම කමිටුව පිහිටුවීමට පුරෝගාමී විය. තවද මඩකලපුවේ ආගම් කමිටුවේ ද පුරෝගාමියකු වශයෙන් වර්ග වාදී සංඝට්ටනයට සාමකාමී විසඳුමක් සෙවීමට කැපවූහ.

ගරු මිලර් පියතුමා අවු. 66 ක් පුරා මඩකලපුවේ වාසය කරමින් දීර්ඝ කාලයක් තිස්සේ මානව හිමිකම්, සමාජ සාධාරණත්වය සහ සාමය වෙනුවෙන් කැපවී සේවය කළහ. ප්‍රොත්සාහී පුරවැසි කණ්ඩායමක් හැටියට සේවයේ යෙදුනු පියතුමන් ඇතුළු සාම කමිටුව, අත්අඩංගුවට පත් වූ අය සොයා ගැනීමටත්, ඔවුන් අත්අඩංගුවෙන් මුදා ගැනීමට ඉවහල් වන නීති ක්‍රියාදාමය ගැනත් ජනතාවට උපදෙස් ලබා දුන්හ. නඩුකර පිළිබඳව අදාළ බලධාරීන් සමඟ කතිකා කරන්නටත්, ඒවා පිළිබඳව ජනතාව සහ අන්තර්ජාතික සංවිධාන, තානාපතිවරුන්, පුවත්පත් කලාවේදීන් සහ රාජ්‍ය නොවන සංවිධාන ද දැනුම්වත් කළහ.

පියතුමා සාම කමිටුවේ ආරම්භකයකු හැටියට, මඩකලපුව ප්‍රදේශයේ මානව හිමිකම් ක්‍රියාධරයකු වශයෙන් ඉමහත් ගෞරවාදරයට පාත්‍ර වුනු අතර එල්. ටී. ටී. ය, ආරක්ෂක හමුදා සහ වෙනත් අවි ගත් මැර කණ්ඩායම්වලින් මානව හිමිකම් කඩවීම් වලට ලක්වුණු වින්දිතයින් ආරක්ෂා කිරීම සඳහා පෙරමුණ ගෙන ක්‍රියා කළහ.

## නිසංසලේ දෝතක් .. 1 පිටුවෙන්

එහිදී සමාජ සේවා අමාත්‍ය ෆීලික්ස් පෙරේරා මහතාගේ පූර්ණ අනුග්‍රහයෙන් වැඩිහිටියන් සඳහා ඇස් කණ්නාඩි පන්සියයක් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පත් ලබා දීමද සිදු කරන ලදි.

ත්‍යාග පරිත්‍යාගය කඳාන, නාගොඩ සා. වින්සන්ට් වැඩිහිටි නිවාසයටත්, ජා-ඇල කොටුගොඩ සා. මාටින් ආබාධිත වැඩිහිටි නිවාසයටත් පරිත්‍යාග කිරීම බයිබල් සංගමයේ ලේකම් තුමිය විසින් සිදු කරන ලදි.

## අනේ සාස්තර.. 1 පිටුවෙන්

අවසන්හි නෙබුකද්නෙසර් රජු අභියස, දානියෙල් විසින් සිහිනයේ අභිරහස හෙළි කළ පසු පුදුමයට පත් රජු මුණින් වැටී දානියෙල්ට වැඳ නමස්කාර කළ බවද, ඔහුට පූජා ඔප්පු කරන්නට සහ සුවඳ දුම් අල්ලන්නට අණ කළ බවද පැවසේ. මේ සියලු සිද්ධි සමූහය හෙළි කරන්නේ ලොව සියලු ශාස්ත්‍රයන්, සියලු වේදයන්, සියලු ප්‍රඥා මහිමයන් ලැබෙන්නේ දෙවියන් වහන්සේගෙන් බවය. මිනිසාට ප්‍රඥාව ලැබෙන්නේ උන්වහන්සේ නිසාමය. සියලු (ජ්‍යොතිෂවේදියන්), ශාස්ත්‍රයන් දෙවියන් වහන්සේගෙන් නික්මෙන්නේ ය. මේ සියල්ල දෙවියන් වහන්සේගේ ප්‍රඥා මහිමයට යටත්ය. සැබෑ ශාස්ත්‍රවන්තයා, දෙවියන් වහන්සේ පිළිගන්නා, උන්වහන්සේට තුති ප්‍රශංසා කරන, යහපත්, නිරහංකාර මානවයකු වන්නේ ය.

ඒ නිසා අප ඊනියා සාස්තරකරුට ඉහළින් වැජඹෙන ජීවමාන දෙවි මහෝත්තමයාණෝ සියල්ල බිහි කරන සේක; සියල්ල පාලනය කරන සේක. සියල්ල සුරකින සේක.

හිතවත් ජ්‍යොතිෂවේදියාණනි, ඔබගේ ශාස්ත්‍රයේ නිපුණයකු වන්න. අන්‍යාගම්වල හර පද්ධතින් ඔබට නොතේරේ. එකී ආගම්වල දහම් කරුණු, එම ආගමික විද්වතුන්ගෙන් විමසා දැනගන්න. අවබෝධ කරගන්න. තමන්ගේ ආගම ගැන වක්‍රෝතියෙන් පම්පෝරි නොගසන්න. අනෙකුත් ආගම්වල දහම් කරුණුවලට ගරු කරන්න. බහුශ්‍රැතයකු වන්න. බහුභූතයකු නොවන්න.

# සාම විනිසුරු පදවි ලබයි



**මහනුවර, නාවලපිටිය සා. මරියා මීසමේ ක්‍රියාකාරී කිතුනුවකු වූ ශෙෂාන් ඩිලී ප්‍රනාන්දු ව්‍යාපාරික තරුණ මහතා සාම විනිසුරුවරයකු වශයෙන් පත්ව ඇත.**

නාවලපිටිය සා. මරියා විදුහලේ හා අනුරුද්ධ කුමාර මහ විදුහලින් මූලික අධ්‍යාපනය හදාරා ගම්පොල ජිනරාජ මහ විදුහලෙන් උසස් අධ්‍යාපනය ලබා ගත් අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජනමාධ්‍ය හා ලේඛකත්ව ඩිප්ලෝමාධාරියකු විය.

තුරුණු වියේ සිට ප්‍රදේශයේ විවිධ සමිති සමාගම්වල නිලතල හොබවමින් සමාජ සේවා කටයුතු වල නිරත වූවෙකි. මහනුවර පදවි අපෝස්තලික ජනසන්නිවේදන මාධ්‍ය කේන්ද්‍රයේ වසර 14 ක් පමණ පූර්ණකාලීනව ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් සේවය කරන ලදි. විවිධ පැතිකඩ ඔස්සේ හැකියාවන් ඇති මොහු විශේෂයෙන් කලා කටයුතු මෙන්ම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ශබ්ද පරිපාලනය සඳහා වූ පුහුණුව ලද්දෙකි. **(මිකී ප්‍රනාන්දු)**



රාගම, තුඩුවේගෙදර සා. ජූඩ් දේවස්ථානයේ 36 වන වාර්ෂික මංගල්‍යය නිමිත්තෙන් ප්‍රතිමාව රැගෙන වීදි යෑම සඳහා සූදානම් කර තිබූ රථය සේයාරුවෙන් දැක්වේ. ඒ සඳහා දායක වූ සැමට සා. ජූඩ් මුනිඳුන්ගේ පිහිටාශිර්වාදය පතමු. **(කේ. බී. ඒ. ජෙරාඩ්)**

# මතුගම සා. මරියා දේවස්ථානයේ දිව්‍ය හෘදය සමිතිය



මතුගම සා. මරියා දේවස්ථානයේ සාමාජිකයින් හය දෙනකුගෙන් ඇරඹි දිව්‍ය හෘදය සමිතිය ආරම්භ වී වසර 25 ක් සපිරේ.

මේ වන විට සාමාජිකයින් ද 25 ක් පමණ සිටී. ටික දෙනකු වුවත් මීසමේ සමිති අතුරින් ඉතා ක්‍රියාකාරී වේ. රෝගීන් බැහැදැකීම, උපකාර කිරීම, නිවෙස්වල ශු. පැය පැවැත්වීම විශේෂ වේ. සභාපති කොන්සි, ලේකම් මල්ලිකා, භාණ්ඩාගාරික ඩොරිස් මහත්මිය හා සියලු දෙනා එක්ව විශේෂ කැපවීමෙන් දේවස්ථානයේ සියලු කටයුතු ඉටුකරති. 25 වසරට සමගාමීව සාමාජිකයින් එක්ව ගත් සේයාරුවකි. **(සුනීතා මාලනී විජේසිංහ)**

# 31 වසරක ගුරු සේවයට සමුදෙයි



**හැඳල කෙලවරපිටියේ උපන් එතෙල් හපුආරච්චි ගුරු මාතාව 70 දශකයේ අග භාගයේදී ගුරු වෘත්තියට පිවිසුනාය. වසර 37 ක් ඇවෑමෙන් පසු කළුතර කටුකුරුන්දේ රෝමානු කතෝලික මහ විදුහලින් සේවයෙන් විශ්‍රාම ගත්තාය.**

නිකවැරටිය මධ්‍ය මහ විද්‍යාලය, මාබෝල සා. මරියා මහ විදුහල, මාගල්කන්ද මෙතෝදිස්ත මහ විදුහල හා කළුතර නාගොඩ මහ විද්‍යාලයේ ද ඉන් අනතුරුව කටුකුරුන්ද රෝමානු කතෝලික විද්‍යාලයේ ද දහසක් සිසු දරුවන්ට මවක් මෙන් වූවාය. පත්තලගෙදර ගුරු අභ්‍යාස විද්‍යාලයේ විද්‍යා පුහුණු ගුරුවරියක වූ ඇය දරුවන්ගේ විද්‍යා දැනුම වර්ධනය කිරීමට මහත් වෙහෙසක් ගත්තාය.

1985 වසරේ ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු මහතා සමඟ අතිනත ගත් ඇය දියණියන් දෙදෙනකුගේ මවකි. දියණියන් දෙදෙනා ද මවගේ අඩිපාරේ යමින් සමාජ මෙහෙවරක යෙදීම විශේෂ දෙයකි. නොබෝදා විශ්‍රාම ලබා ගත් එම ගුරු මාතාව වෙනුවෙන් පිලිප්නේරි දෙව්මැඳුරේදී පාසලේ විදුහල්පති, ගුරු මහත්ම මහත්මීන්, දූ දරුවෝ තුති පිදීමේ දේව මෙහෙයකට සහභාගි වූහ. **(එස්. හේමාල් පෙරේරා)**

# වසර 90 සපුරන ගිහි සංවිධානයක්

**විල්ලෝරාවත්ත මීසමේ ශු. කාර්ලෝ (චාල්ස්) බොරෝමයෝ මුනිඳුන්ගේ පිහිටාරක්ෂක සමිතිය ආරම්භ කර මෙම වසරට වසර 90 ක් සපිරේ. මෙම සමිතියේ රජත ජයන්තිය 1949 වසරේ සැමරීය. එවකට මොරටුව මීසම් සේවක නිමල මරිය නිකායේ ගරු ජේ. පෙවෝවා පියතුමාගේ අනුශාසකත්වයෙන් සාමාජිකයින් 33 දෙනකුගේ සහභාගිත්වයෙන් 1924 දී මෙම සමිතිය ආරම්භ කර ඇත.**



මෙම සමිතියේ ආරම්භක සභාපති ඊ. ඇස්. එච්. ප්‍රනාන්දු මහතා ය. දිනක් කිසියම් අවශ්‍යතාවයකට මොරටුව මීසම් ගෘහයට ගිය විට ලෝකයේ මිෂනාරි ව්‍යාපාර පිළිබඳව රෝමයේ පැවැත්වෙන ප්‍රදර්ශනයකට යැවීමට සූදානම් කර තිබූ මොරටුව මීසමේ දෙව්මැඳුරු 11 ක සේයාරූ අතර වූ පොල් අතු සෙවිලි කළ වැඩ නිම නොවූ විල්ලෝරාවත්ත දෙව්මැඳුර පෙන්වා කිසිවකු ඔහුට සරදම් කළ බවත්, එම සරදම මේ සමිතියේ ආරම්භයටත් හේතු වී තිබේ.

1935 දෙසැම්බර් 29 වැනි දින කොළඹ අගරදගුරු පදවියේ කතෝලික එක්සත් සමිතියට මෙම සමිතිය ඒකාබද්ධ කර ඇත. මෙම සමිතියේ සාමාජිකත්වය ද පරම්පරාවෙන් පරම්පරාවට යන ක්‍රියාවලියකි.

අද මෙම සමිතියේ සාමාජිකත්වය දරන්නෝ පැරැන්නන්ගේ දරු මුණුබුරෝය. ඔව්හුද තම මුතුන් මිත්තන් මෙන් විල්ලෝරාවත්ත මීසමේ උන්නතිය සඳහා මීසම් සේවක පියතුමන් සමඟ සහයෝගයෙන් කටයුතු කරති. **(ට්‍රිසිල් ඇෆ්. මැන්දිස් - විල්ලෝරාවත්ත)**

# ආදරයෙන් සිහිපත් කිරීමයි



**විලියම් මෙන්ඩිස්**
**15 වන සැමරුම**



**ක්ලොටිල්ඩා විජේසූරිය**
**25 වන සැමරුම**

ආදර මම්මේ, පප්පේ, ඔබ දෙපල අපට දැක්වූ අසීමිත ආදරය, කැපවීම, පරිත්‍යාගය විහිද වූ ගුණ සුවඳ අපි සැමදා ගෞරවයෙන් සිහිපත් කරමු. අද ඔබ දෙදෙනා අපෙන් වෙන්ව දෙවිඳුන් තුරුලේ සිටියත් අප ඔබලාගෙන් ලද ඒ ගති පැවතුම් අද අපව ජීවත් කරවයි.

**ස්වාමිනී, මොවුන්ගේ ආත්මයන්ට ස්වර්ගයේ සම්පත් භුක්ති විඳින්නට වරම් දුන මැනව.**

ආදර දූ පුතුන් හා මුණුබුරු මිණිබිරියන්, කටුවාපිටිය

# කොළඹ අගරදගුරු පදවි පැවිදි වසර හා පවුල් වසර (2014 - 2016 ) තුළ ඔබගේ දායකත්වය

කොළඹ අගරදගුරු පදවි පවුල් සේවාව තුළ දැනට ක්‍රියාත්මක වන හා ඉහත වසර මුල් කරගෙන විශේෂයෙන් සංවිධානය කරන්නට බලාපොරොත්තු වන වැඩසටහන් වලට යුවල් ලෙස හෝ තනි පුද්ගලයන් ලෙස පවුල් සේවාව මඟින් සිදුකරන සම්මුඛ පරීක්ෂණයකින් හා පුහුණුවකින් පසුව සම්පත් දායකයකු ලෙස පහත සඳහන් සේවාවන් වල නියැලීමට අවස්ථාව ඇත.

1. යුවල් වශයෙන් විවාහ අපේක්ෂක සමුළු සඳහා (සිංහල / දෙමළ / ඉංග්‍රීසි)
2. යුවල් වශයෙන් විවාහ පෝෂණ වැඩසටහන් සඳහා (සිංහල / දෙමළ / ඉංග්‍රීසි)
3. තනි පුද්ගලයන් වශයෙන් උපදේශනය සඳහා (මේ සඳහා (කතෝලික) පිළිගත් ආයතනයකින් උපදේශනය සම්බන්ධව සහතිකයක් ලබා සිටීම අවශ්‍ය වේ.)

පහත සඳහන් විස්තර සමග මීසම් සේවක පියතුමාගේ ලිපියක් සමගින් දින 14 ඇතුළත ඔබේ ඉල්ලුම් පත පහත සඳහන් ලිපිනයට එවිය හැකිය. (නම / ලිපිනය / පවුලේ විස්තර / රැකියාව / අධ්‍යාපන හා වෘත්තිමය සුදුසුකම් / සේවාවේ යෙදීමට ඇති අවශ්‍යතාවය)

කොළඹ අගරදගුරු පවුල් සේවාව, (රාජපක්ෂ වලව්ව), තුඩැල්ල, ජා-ඇල. දු. අංක 0775 061699, 0779315339, 0727441442, 0112236457

# අගරදගුරු පදවි ධර්මදූත ළමා සමාජ දමිළ සජීවක සජීවිකාවන්ට ඥානකාන්තියක්



කොළඹ පදවියේ ධර්මදූත ළමා සමාජයේ කුඩා දරුවන් දෙවිඳුන් වෙතට එසැවීම හා දේව වචනය තුළ දරුවන් ජීවත් කරවීමේ දූත කාර්යය පැවරී ඇත්තේ මීසම්වල සිටින ඔබ වැනි සජීවක සජීවිකාවන්ටයි.

වත්මන් සමාජය තුළ කෙරෙන ළමා දුරාචාර, අපචාර, මව්පියන් දරුවන් මරා දැමීම, මහමඟ දමා යාම, ආදි අකටයුතු දැ බහුලව කෙරෙන මෙවන් සමාජයක මේ උතුම් දූත කාර්යයට පැමිණි ඔබ සැම ඉතාම ආදරයෙන් පිළිගනිමි.

අගරදගුරු පදවියේ ධර්මදූත ළමා සමාජයේ නවක අධ්‍යක්ෂ ගරු ෆ්‍රෙඩී ශාන්ති කුමාර් පියතුමා එසේ සඳහන් කළේ දමිළ සජීවක සජීවිකාවන් පුහුණු කිරීමේ තේවත්තේ පැවති තෙදින ඥානකාන්තියට සහභාගි වූ සජීවක සජීවිකාවන් පිළිගනිමින් කතා කළ අවස්ථාවේදිය.

තවදුරටත් කතා කළ පියතුමා ලක්ෂ 10 ක 12 ක දමිළ පවුල් ප්‍රමාණයක් සිටින කොළඹ අගරදගුරු පදවියේ මේ උතුම් දේව සේවාවට දෙවියන් වහන්සේ විසින් තෝරාගෙන ඇත්තේ 33 දෙනකු පමණක් බවය. දහසක් අතරින් තෝරාගත් ඔබව මින් ඉදිරියට මෙහෙයවනු ලබන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ බව අමතක නොකළ යුතුය.



# ප්‍රදීපය
## මංගල යෝජනා
### මනාලයෝ

වත්තල, සිංහල, කතෝලික, අවු. 27, උස 5' 6", ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචිය හිමි, දැනට ඕස්ට්‍රේලියාවේ සූපවේදියෙකු **(chef)** ලෙස රැකියාවේ නියුතු මෙරට වත්කම් ඇති, කඩවසම්, චරිතවත් පුතුට දෙමව්පියන් සොයනුයේ සුදු, ඉතා රූමත්, උගත් සහ ඉංග්‍රීසි දැනුමැති ඕස්ට්‍රේලියාවේ පදිංචියට කැමති දියණියකි. කෙටි නිවාඩුවකට දෙසැම්බර් පැමිණේ. සියළු විස්තර සමග දුරකථන අංකයද මෑතකදී ගත් ඡායාරූපයක්ද එවන්න. දු.අ. 077-5373923. **e-mail: brides_groom@yahoo.com** අංක N4496, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

## මංගල යෝජනාත් වෙබ් අඩවියේ...
**"ඥානාර්ථ ප්‍රදීපය" හා "Messenger" පුවත්පත් වල පළවන මංගල යෝජනා ඔබගේ කැමැත්ත පරිදි www.colombocatholicpress.com වෙබ් අඩවියේ ද පල කළ හැකිය.**

**වැඩි විස්තර සඳහා දැන්වීම් අංශය විමසන්න.**



## ඔබගේ දුවට හෝ පුතාට සුදුසු
## කතෝලික සහකරුවකු හෝ සහකාරියක සඳහා

**මංගල යෝජනා දැන්වීමක් පළ කර ගැනීමට අවශ්‍ය නම් පහත උපදෙස් පිළිපදින්න.**

**ඔබගේ පුතුගේ හෝ දියණියගේ විස්තර මුද්‍රිත අකුරින් හෝ පැහැදිලි අත් අකුරින් ලියා හැකි ඉක්මනින් අප වෙත යොමු කරන්න.**

- ♥ මංගල යෝජනා දැන්වීම් සඳහා පළමු වචන 15 ට රු. 500/- ක මුදලක් වන අතර ඉන් පසුව වැඩිවන වචනයකට රු. 8.00 ක මුදලක් එකතු වේ.
- ♥ තැපැල් මගින් මංගල යෝජනා දැන්වීම එවන්නේ නම් දැන්වීම සමග ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් එවන්න.
- ♥ ඔබගේ දුරකථන අංකය පළකළ යුතු නම් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කර අත්සන් කරන්න.
- ♥ දැන්වීම ෆැක්ස් මගින් අප වෙත එවන්නේ නම් දැන්වීම සඳහා වැය වන මුදල මරදාන **HNB** ශාඛාවේ ගිණුම් අංක 108010005037 ට ඔබගේ මුදල් බැර කරන්න. ඉන්පසු මුදල් බැර පත හා දැන්වීම අප ආයතනයට ෆැක්ස් කරන්න.
- ♥ දැන්වීම ෆැක්ස් කළ පසු එය අප ආයතනයට ලැබී ඇත්දැයි පරීක්ෂා කර දැන ගන්න.
- ♥ මංගල යෝජනා සඳහා පිළිතුරු එවීමේදී මංගල යෝජනා අංකය පැහැදිලිව සඳහන් කර කුඩා කවරයක (3 1/2' 6") එවන්න.

**ගරු අධ්‍යක්ෂ පියතුමා,
කොළඹ කතෝලික මුද්‍රණාලය, අංක 2,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.
දු.ක. 2695984 / 2678106 / 011-4899611 ෆැක්ස් : 2692586**